# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 7 වන ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය



සිංහල දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# සිංහල භාෂාව
# හා
# සාහිත්‍යය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
## 7 වන ශ්‍රේණිය

සිංහල දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2007

ජාතික අධ්‍යාපන ආයතනය
පළමුවන මුද්‍රණය: 2007

**ISBN 978 - 955 - 654 - 100 - 7**

"ආසියානු සංවර්ධන බැංකුවේ
ද්විතීය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය
මගින් මුද්‍රණය කරන ලදී."

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපනය ආයතනය

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානළුව, පාදුක්ක.

# පෙරවදන

නව සහස්‍රයේ දී සිදු කළ පළමුවන විෂයමාලා සංශෝධනය වන මෙය පාසල් පද්ධතිය තුළ දැනට පවතින ගැටලු කිහිපයක් නිරාකරණය කර ගැනීමේ ප්‍රවේශයක් ලෙස සැලකිය හැකිය. මෙම විෂයමාලාව සැලසුම් කොට ඇත්තේ තරුණ පරපුර අද මුහුණ පා සිටින සිතීමේ, සමාජීය හා පුද්ගල දුර්වලතා මගහරවා ගැනීමේ අභිලාෂයෙනි.

ආසියාවේ අධ්‍යාපන ක්‍රමය සලකා බැලීමේ දී මෙයට වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකාව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බොහෝ ඉදිරියෙන් සිටියේය. එහෙත් වර්තමානයේ දී ආසියාවේ අනෙකුත් රටවල් ශ්‍රී ලංකාව අභිබවා ඉදිරියෙන් සිටියි. නව දැක්මකින් තොර ව, පවතින දෙය මත පමණක් ම තීරණ ගනිමින් ඒ දේ පමණක් ම නැවත නැවත ඉදිරිපත් කිරීම මෙම පසුබෑමට එක් හේතුවකි.

මෙම තත්ත්වය මගහරවා ගැනීම පිණිස ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් පැහැදිලි දැක්මකින් යුතුව විෂයමාලා සංශෝධනය කිරීමට වෙර දරා ඇත. නව විෂය මාලාවේ අරමුණු සකසා ඇත්තේ ශිෂ්‍ය පරපුර විසින් දැනට ම දන්නා දේත්, නව අදහස් හා ගවේෂණාත් මගින් අනාගතය ගොඩනගා ගැනීම පිණිස ශිෂ්‍යයන්ගේ නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවන ආකාරයෙනි. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ගුරුවරයාගේ කාර්ය භාරයෙහි පරිපූර්ණ වෙනසක් අත්‍යවශ්‍ය වෙයි. දැනට පවතින ගුරු කේන්ද්‍රීය ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක, ක්‍රියාකාරකම් මූලික ක්‍රමයක් මෙම නව අධ්‍යාපන ක්‍රමයෙන් අපේක්ෂා කෙරෙන අතර ගුරුවරුන් අභියෝගවලට මුහුණදීමට සූදානම් විය යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ගුරුවරුන්ට එවැනි ක්‍රමයක් සකසා ගැනීමට මහත් සේ උපකාරී වනු ඇතැයි යනු පූර්ණ විශ්වාසයයි. මාර්ගෝපදේශ සංග්‍රහයෙහි දී ඇති මගපෙන්වීම පිළිපැදීම මගින් ඔබට සාර්ථක ගුරු භවතකු වීමට හැකියාව ලැබෙනු ඇත. එය ඔබට ඉගැන්වීමේ දී මෙන් ම ශිෂ්‍යයින් ඇගයීමේ දී ද උපකාරී වනු ඇත. ගවේෂණය හා ගුණාත්මක යෙදවුම් සම්බන්ධයෙන් දී ඇති මාර්ගෝපදේශන ශිෂ්‍යාට උපකාර වන ආකාරයෙන් ඉදිරිපත් කොට ඇත. එලෙස ම එය විදුහල්පතිවරුන්ට කාල සටහන් පිළියෙල කිරීමේදීත්, සීමිත සම්පත් වෙන්කර දීමේදීත් අභ්‍යන්තර අධීක්ෂණයේදීත් මහත් ලෙස උපකාරී වනු නො අනුමාන ය.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කොට ඇති දෙයට පමණක් සීමා නොවී ගුරුවරුන් තම නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කරමින් තමන් විසින් ම සුදුසු ක්‍රියාකාරකම් සකසා ගැනීම කළ යුතු ය. මක්නිසාදයත්, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් ක්‍රියාකාරකම් අනුරූප හෝ ආදර්ශ වන නිසාත්, ප්‍රාදේශීය ව ඇති වෙනස්කම් එම ප්‍රදේශයේ ගුරුවරුන් වඩා හොඳින් දන්නා බැවින් ඔවුන්ට ඒ අනුව ක්‍රියාකාරකම් සකස් කර ගත හැකිවනු ඇත.

අධ්‍යාපනඥයන්ට, ගුරු උපදේශකවරුන්ට හා බාහිර අධීක්ෂණය හා නියාමනයෙහි යෙදෙන සියලු නිලධාරීන්ට උපකාරී වන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල කිරීමට සහභාගි වූ සියලු දෙනාට ම මගේ කෘතඥතාව පිළිගන්වමි.

**මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# සංදේශය

ශ්‍රී ලංකාවේ විෂයමාලා ප්‍රතිපත්තියට අනුව අවුරුදු අටකට වරක් පාසල් විෂය නිර්දේශ යාවත්කාලීන විය යුතු ය. මේ අනුව 2007 වර්ෂයේ සිට ආරම්භ කෙරෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ මෙම විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2008 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබේ.

මෙතෙක් පැවති විෂය නිර්දේශ යම් විෂයකට අදාළ විෂය මාතෘකා රාශියක් ද ඒ ඒ විෂය මාතෘකාවට අදාළ විෂය කරුණු ද දක්නට ලැබුණි. මෙම විෂය කරුණු ඉගැන්වීම ගුරුවරයාගෙන් සිදු විය. මෙම ක්‍රියාවලිය නිසා බොහෝ විෂය කරුණු දන්නා සිසු පිරිසක් බිහිවූහ.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන විෂය නිර්දේශවල ඒ ඒ විෂය යටතේ සිසුන් අත්පත් කරගත යුතු නිපුණතා හඳුනාගෙන නිර්දේශ කර ඇත. මෙම නව ප්‍රවේශය තුළින් බොහෝ විෂය කරුණු දන්නා බවින් ඔබ්බට ගිය, ප්‍රායෝගික අංශයට වඩාත් නැඹුරු නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම අපේක්ෂා කෙරේ. එබැවින් නව විෂය නිර්දේශ භාවිත කරන ගුරු මහත්ම මහත්මීන් මෙම වෙනස පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන කොටසේ දී නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත පන්ති කාමරයක් යෝජනා කර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ සිසුන් පුස්තකාල භාවිතය හා පොත්පත් කියවීම, පරිසර නිරීක්ෂණය, සම්පත් පුද්ගලයන්ගෙන් කරුණු රැස්කර ගැනීම, තම මිතුරු මිතුරියන්ගෙන් බොහෝ දේ ඉගෙනීම සහ ඔවුන්ට තමා දන්නා දේ කියාදීම, හැකි අවස්ථාවන්හි දී අන්තර්ජාලයෙන් තොරතුරු රැස්කර ගැනීම ආදී ගවේෂණාත්මක ව ඉගෙන ගන්නා සංස්කෘතියක් දැකිය හැකි විය යුතු ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති පෙළ පොත ද සම්පත් පොතක් ලෙස භාවිත කළ යුතු ය. මෙසේ සොයා ගන්නා කරුණු වඩාත් නිවැරදි කොට සංවිධානාත්මක ව හා අංග සම්පූර්ණ ව සිසුන්ට ග්‍රහණය කරවීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. එබැවින් ගුරුවරයාගේ භූමිකාව ද නව දැනුමෙන් පොහොසත් විය යුතු ය. එය සිසුන් සොයා ගන්නා සියලු කරුණු අභිභවා යන බහුශ්‍රැත භාවයක් ප්‍රදර්ශනය කරන තත්ත්වයක් විය යුතුය. මෙම ක්‍රියාකාරී ඉගෙනුම් පරිසරය සිසුන්ට බෙහෙවින් ආකර්ෂණය වනු ඇත.

මේ සඳහා මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ආදර්ශ පාඩම් හා තවත් බොහෝ පාඩම් සකස් කර ගැනීමට මඟ පෙන්වීමක් බව සිතන්න. මේ ඇසුරෙන් නිර්මාණශීලී ගුරුවරයකු ලෙස බොහෝ නව පාඩම් සකස් කර ගැනීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

මෙම නව පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හැම විට ම සිසුන් ක්‍රියාකාරී ය. එබැවින් ඔවුන්ගේ දක්ෂතා හා ප්‍රබලතා ප්‍රදර්ශනය වෙයි. ඒවා අගය කරන්න. දිරිමත් කරන්න. තව ද ඇතැම් විට සිසුන් මුහුණ දෙන දුෂ්කරතා ද ඔබට දක්නට ලැබේ. ඒ හැමවිට ම එම දුෂ්කරතා ඉවත්කර ගැනීමට උදව් කරන්න. ආසන්න මිතුරු මිතුරියන්ව උදවු කිරීමට යොමු කරන්න. මෙසේ පාඩමත් සමඟ කෙරෙන තක්සේරු ක්‍රියාවලිය වඩාත් හොඳ ඉගෙනුමකට හේතු වේ.

තව ද මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති ඉගෙනුම දිර්ඝ කිරීමේ උපකරණ හා අභ්‍යාස දරුවා උගත් දේ තවදුරටත් ශක්තිමත් කිරීමට සමත්වන ආකාරය ගැන අවධානය යොමු කරන්න. එය සිසුන්ගේ ඇගයීම කළ හැකි හොඳ අවස්ථාවක් ලෙසට සලකන්න. මෙබඳු තවත් ඉගෙනුම් දිර්ඝ කිරීමේ බොහෝ අභ්‍යාසවල සිසුන් යොමු කිරීමට සැලකිලිමත්වන්න.

මෙමගින් නව ලොවට උචිත නිපුණතා පිරි සිසු පිරිසක් බිහිවීම ද, එයට ම ගැළපෙන ගුරු භූමිකාවක් හා පන්තිකාමරයේ නව ඉගෙනුම් සංස්කෘතියක් බිහිවීම ද අපේක්ෂා කරමි.

**විමල් සියඹලාගොඩ**
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය

## සිංහල භාෂාව හා සාහිත්‍ය විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
## සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| උපදේශනය | - | මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | විමල් සියඹලාගොඩ මහතා<br>සහකාර අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය විශේෂඥ උපදෙස් | - | මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා<br>මහාචාර්ය රත්න විජේතුංග මහතා |
| අධ්‍යක්ෂණය | - | ආචාර්ය සුරනිමල ලේකම්ගේ මහතා<br>අධ්‍යක්ෂ<br>සිංහල දෙපාර්තමේන්තුව |
| සම්බන්ධීකරණය | - | එච්. පී. සුසිල් සිරිසේන මහතා<br>ව්‍යාපෘති නිලධාරී |
| ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර) | - | එස්. ඒ. පේමසිරි සුබසිංහ මහතා<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී |
| | - | එච්. පී. සුසිල් සිරිසේන මහතා<br>ව්‍යාපෘති නිලධාරී |
| | - | ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා<br>ව්‍යාපෘති නිලධාරී |
| | - | ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න මහතා<br>සහකාර ව්‍යාපෘති නිලධාරී |
| ලේඛක මණ්ඩලය (බාහිර) | - | ඩබ්ලිව්. කරුණාරත්න මහතා<br>ගුරු මධ්‍යස්ථාන කළමනාකරු<br>ගුරු මධ්‍යස්ථානය - ගිරාගම |
| | - | වයි. එම්. නවරත්න මහතා<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>හිඟුරක්ගොඩ |
| | - | ජේ. ඩබ්ලිව්. ජයතිස්ස මහතා<br>ගුරු උපදේශක<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය<br>සොරණාතොට |
| | - | එච්. බී. සුවිසල් හේරත් මහත්මිය<br>ගුරු උපදේශිකා<br>කලාප අධ්‍යාපන කාර්යාලය - දෙහිඕවිට |

- ජේ. අමරසිංහ මහතා
  ගුරු සේවය 1
  අ/ මිහින්තලේ මහා විද්‍යාලය - මිහින්තලේ
- එස්. කේ. පද්මා ඕපාත මහත්මිය
  ගුරු සේවය 1
  නික/වාරි/ ඊතණවත්ත මහා විද්‍යාලය - ඊතණවත්ත
- එච්. එම්. පියසීලි මහත්මිය
  ගුරු සේවය 1
  මප/දෙනු/ පිළිමතලාව මධ්‍ය මහා විද්‍යාලය
  පිළිමතලාව
- එච්. පී. මල්ලිකා කුමාරි මහත්මිය
  ගුරු සේවය 2 ii
  මාර/ මෙතෝදිස්ත මධ්‍ය මහා විද්‍යාලය
  හක්මන
- සරත් නිතලව මහතා
  ගුරු සේවය 2 ii
  මධ්‍ය මහා විද්‍යාලය -කුලියාපිටිය
- එච්. එම්. පී. කේ. බඹරගම මහතා
  ගුරු සේවය 2 ii
  කෑ/ රුවන්වැල්ල මහා විද්‍යාලය - රුවන්වැල්ල
- ආර්. ටී. එම්. කරුණාරත්න මහතා
  ගුරු සේවය 2 ii
  කෑ/ බැද්දවල මහා විද්‍යාලය - මාකෙහෙල්වල
- යූ. ඩබ්ලිව්. ධනසීලි මහත්මිය
  ගුරු සේවය 2 ii
  අම්/ හිමිදුරාව මහා විද්‍යාලය - උහන
- එච්. ඩබ්ලිව්. තමරා නිල්මිණී මහත්මිය
  ගුරු සේවය 2 ii
  අම්/ බණ්ඩාරනායක මහා විද්‍යාලය - අම්පාර
- චිත්‍රා විජේසුන්දර කුමාරිහාමි මහත්මිය
  ගුරු සේවය 2 ii
  ර/ ෆර්ගියුසන් උසස් බාලිකා විද්‍යාලය - රත්නපුර

පරිගණක වචන සැකසුම - ඉමේෂා කුමාරි මෙනවිය

විවිධ සහාය - චම්පා හේවාවිතාරණ මහත්මිය
ගාමිණී රෝහණ විමලසේන මහතා

# පටුන


පිටුව

විෂය නිර්දේශය

විෂය හැඳින්වීම 09
විෂයයේ අරමුණු 10
නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය 11
පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් 15

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

හැඳින්වීම 17
ක්‍රියාකාරකම් සන්තතිය 20

තක්සේරුව හා ඇගයීම

හැඳින්වීම 91
ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක 94

# විෂය නිර්දේශය

## විෂය හැඳින්වීම

මිනිසාගේ විශිෂ්ටතම නිර්මාණය වූ භාෂාව, සන්නිවේදනයේ ද ප්‍රබලතම මාධ්‍යයයි. මිනිසාගේ චින්තනයට ඉවහල්වනුයේ ද ජාතික අනන්‍යතාව හෙළිකරන සංකේතය වනුයේ ද භාෂාව යි. භාෂාව හා සාහිත්‍යය එකිනෙක හා අවියෝජනීය ව බැඳී පවතී. සාහිත්‍යය නිර්මාණය වන්නේ භාෂාව උපයෝගී කරගෙන ය. ඇතැම් ගෝත්‍රික ජනයා අතර ලිඛිත සාහිත්‍යයක් නැතත් මුඛ පරම්පරාගත ව පවත්වාගෙන එන ජන සාහිත්‍යයක් දක්නට ලැබේ. සාහිත්‍යය නිර්මාණය, ආස්වාදය හා විචාරය යන ත්‍රිත්වය සුසංයෝගී ව මිනිස් ජීවිතය හා බද්ධ වී පවතී. සාහිත්‍යය මනුෂ්‍ය සන්තානයන්හි ආස්වාදනීය හැඟීම් පුබුදු කර සංවේදී මනසක් ඇතිකරලීමට සමත්වේ. එම නිසා සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය මගින් සංවේදී හදවතක් සහිත නිර්මාණශීලී පුද්ගලයකු සමාජයට බිහි කරලීමට අපේක්ෂා කෙරේ.

මෙම නව විෂය නිර්දේශය සකස් කර ඇත්තේ නිපුණතා පාදක ප්‍රවේශයකිනි. ඒ අනුව 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා පුළුල් වශයෙන් පැතිරෙන නිපුණතා 12 ක් වෙයි. එකී නිපුණතාවලට අදාළ ව එක් එක් ශ්‍රේණිවල දී අපේක්ෂිත නිපුණතා මට්ටම් සහ එම නිපුණතා මට්ටම් කරා ළඟාවීමට උදව් වන විෂය අන්තර්ගතය විෂය නිර්දේශය තුළ දක්වා ඇත.

නිපුණතා පාදක නව විෂය නිර්දේශයට අනුව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පහසු කිරීම සඳහා නිර්මාණය කොට ඇති ක්‍රියාකාරකම් සන්තතියක් ද මෙහි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද යටතේ දක්වා ඇත. එම ක්‍රියාකාරකම් සහ ඔබේ නිර්මාණාත්මක හැකියාවන් ඔප්නංවමින් ගුරුවරයා විසින් සකස් කරගන්නා ක්‍රියාකාරකම් මගින් එක් එක් නිපුණතා සහ නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීම සඳහා ශිෂ්‍යශිෂ්‍යාවන් යොමු කළ හැකි වේ. විෂය නිර්දේශයානුකූල ව සකස් කර ඇති පෙළපොත ද මේ සඳහා උපකාරී වනු ඇත.

නූතන විද්‍යාත්මක හා තාක්ෂණික ලෝකය තුළ දැනුම සොයා යන ශිෂ්‍යයා නිවැරදි භාෂා භාවිතය සඳහා යොමු කිරීමත්, පුරාතන හා නූතන සම්භාව්‍ය ගද්‍ය පද්‍ය නිර්මාණ පරිශීලනය කිරීමට යොමු කිරීමත් මගින් සංවේදී හදවතක් සහිත සමාජයට වැඩදායි පුද්ගලයකු බිහි කිරීම අප සියලු දෙනාගේ ම වගකීමකි.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

විෂයයේ අරමුණු

1. ප්‍රායෝගික ජීවිතයේ විවිධ සන්නිවේදන අවශ්‍යතා පහසුවෙන් ඉටු කර ගැනීම සඳහා ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කර ගැනීම.

2. භාෂා හා සාහිත්‍ය පරිශීලනයෙන් ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක ලේඛනවල ශෛලිය හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම.

3. පුරාතන හා නූතන සම්භාව්‍ය සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය මගින් සමාජ සංස්කෘතික අගයන් අවබෝධ කර ගැනීම, සාක්ෂාත් කර ගැනීම සහ ජීවිත පරිඥානය ලබා ගැනීම.

4. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොටගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කරගනිමින් රසාස්වාදයට යොමු වීම.

5. වර්ධනය වන්නාවූත් ව්‍යාප්ත වන්නාවූත් සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි භාෂා කුසලතා සංවර්ධනය කර ගැනීම.

6. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් ජාතික අනන්‍යතාව ගොඩනගා ගැනීම හා සාමකාමී සහජීවනයට හුරුවීම.

7. භාෂා භාවිතයේ සම්මත ව්‍යවහාර හඳුනාගනිමින් සිංහල භාෂාවේ අනන්‍යතාව හඳුනා ගැනීම හා නිවැරදි ලේඛන කාර්යයේ නිරත වීම.

8. භාෂා සාහිත්‍ය පරිශීලනය මගින් ස්වීයත්වය හා භාෂා මාමකත්වය වර්ධනය කර ගැනීම.

9. භාෂා සාහිත්‍ය අධ්‍යයනයෙන් ලැබෙන අත්දැකීම් තුළින් ජීවිතයට අදාළ යහපත් ආකල්ප ගොඩනගා ගැනීම හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාල-ච්ඡේද |
|---|---|---|---|
| 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි. | 1.1 සංවාදයකට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>1.2 විවිධ ප්‍රකාශනවලට සවන් දී අන්තර්ගතය ග්‍රහණය කර ගනියි.<br>1.3 ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>1.4 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි.<br>1.5 විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන්දීමේ පුරුදු ප්‍රායෝගික භාෂා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගනියි. | අධ්‍යාපන චාරිකාවක දී නරඹන ලද ස්ථානයක් පිළිබඳ ව සිසුන් අතර ඇතිවන සංවාදයක්.<br>සරල ගීතවලට සවන්දීම. එහි අදහස ප්‍රකාශ කිරීම.<br>පූජ්‍ය පක්ෂය සඳහා ව්‍යවහාර කෙරෙන ඇමතුම්, විශේෂිත වචන, යෙදුම්, වගන්ති ඇතුළත් සංවාදයක්.<br>සිවුපද පද්‍ය නිර්මාණ රස විඳීම.<br>සැලළිහිණි සන්දේශයෙන් තෝරාගත් කවි 5 ක්.<br>දැනුම මිනුම තරග<br>වාර්තා විචිත්‍රාංග වැඩසටහන්. | 10 |
| 2.0 තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ප්‍රදර්ශනය කරයි. | 2.1 සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි.<br>2.2 සවන්දෙන්නා පිළිබඳ සැලකිලිමත් ව අවස්ථාවට උචිත ලෙස කතා කරයි. | මාතෘකානුකූල කතා.<br>ශ්‍රාවක ප්‍රතිචාර අවධානයට ගනිමින් කතා බහේ යෙදීම.<br>විවාදාපන්න සංවාද අවස්ථා හා සිද්ධි | 12 |
| 3.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 3.1 නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.<br>3.2 අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.<br>3.3 විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.<br>3.4 පොත පත කියවීමෙන් ස්මරණය කර ගත් කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි. | නිවැරදි වචන උච්චාරණය<br>- විරාම ලකුණු ගැන අවධානය යොමු කිරීම. (ප්‍රශ්නාර්ථ ලකුණ, තිත් කොමාව, පෙරළි කොමාව.)<br>- නිසි හඬ පාලනය.<br>ජන කතා. (දෙස්, විදෙස්) පුවත් පත් වාර්තා, ජාතක පොත, සද්ධර්මරත්නාවලිය වැනි කෘතියකින් තෝරාගත් කතාවක්.<br>ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවීම.<br>නූතන ගද්‍ය නිර්මාණයක් (ළමා කතාවක්)<br>කතා සාරය ගොඩනැගීම ප්‍රධාන කරුණු සටහන් කරගෙන ප්‍රකාශ කිරීම.<br>උදාඃ අන්දරේගේ කතා. | 14 |
| 4.0 අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් තර්කානුකූල ව ඉදිරිපත් කරයි. | මාතෘකානුකූල ව රචනා ලිවීම. | 10 |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාල-ඡේද |
|---|---|---|---|
| | 4.2 ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි. | විරාම ලකුණු<br>- විස්මයාදි / හර්ෂාදි ලකුණ<br>- තිත් කොමාව<br>- කෙටි ඉර<br>- ඇල ඉර | |
| 5.0 භාෂා ක්‍රියාකාරකම් මගින් වාංමාලාව පෝෂණය කරගෙන භාෂාමය කාර්යන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි. | 5.1 විශේෂ භාෂා ප්‍රයෝග භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස යොදා ගනියි.<br>5.2 භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගනිමින් සන්නිවේදනය පහසු කර ගනියි. | රූඪී හා ප්‍රස්තාව පිරුළු<br>යුගල පද<br><br>ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර ඇතුළත් සාහිත්‍ය නිර්මාණයක්.<br>දකුණු පළාත / මොණරාගල වැනි | 12 |
| 6.0 ජීවන අවශ්‍යතා සාක්ෂාත්කර ගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 6.1 අදහස් නිරවුල් ව හා පැහැදිලි ව දක්වමින් ලිපි ලියයි. | රාජකාරි ලිපි<br>- රාජකාරි ලිපියක ආකෘතිය සහ අන්තර්ගතය. | 12 |
| 7.0 අක්ෂරමාලාව නිරවුල් ව වටහාගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ලියයි. | 7.1 ණ, න, ල, ළ අකුරු සහිත වචන නිවැරදි ව ලියයි. | - ණ / න යෙදීම සම්බන්ධ රීති අතීත කාල ක්‍රියා පදයේ අග යෙදෙන **ණ** කාරය මූර්ධජ වේ.<br>- ර යන්නට පසුව යෙදෙන **න** කාරය මූර්ධජ වේ.<br>- ර යන්නට පසුව දන්තජ **න** යෙදෙන අවස්ථා ද ඇත.<br>- අල්පප්‍රාණ **ඩ** යන්නට මුලින් යෙදෙන **ණ** කාරය මූර්ධජ වේ.<br>ළ, ල යෙදීම සම්බන්ධ රීති<br>- හෘදය, සිත<br>- ළපටි, නොමේරූ යන අර්ථය දෙන පදවල මුල ළ කාරය මූර්ධජ වේ.<br>- ආසන්න, සමීප, නුදුරු යන අර්ථය දෙන පදවල **ළ** කාරය මූර්ධජ වෙයි.<br>- වචනාන්ත ල හල් වේනම් යෙදෙන්නේ දන්තජ ල යන්නයි.<br>එම වචන පාදක කොට ගෙන සෑදෙන පදවලද යෙදෙන්නේ ද දන්තජ **ල** යන්නයි. | 24 |
| | 7.2 මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව වචනවල යොදයි. | මහාප්‍රාණ අකුරු නිවැරදි ව වචනවල යෙදීම. | |
| | 7.3 සඤ්ඤක අකුරු අර්ථවත් ව වචනවල යොදමින් නිවැරදි ව ලියයි. | සඤ්ඤක අකුරු නිවැරදි ව වචනවල යෙදීම. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාල-ඡේද |
|---|---|---|---|
| 8.0 වියරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයන් ඉටු කර ගනියි. | 8.1 නාම පද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.<br>8.2 ක්‍රියා පද භාවිතය පිළිබඳ ලේඛන අවබෝධයෙන් යුතු ව කාර්යයේ යෙදෙයි.<br>8.3 උක්ත ආඛ්‍යාත/ ක්‍රියා පද සම්බන්ධය පිළිබඳ අවබෝධයෙන් යුතු ව වාක්‍ය නිර්මාණය කරයි. | නාම පද හඳුනා ගැනීම.<br>- ලිංග භේදය<br>- සර්ව නාම<br>උක්ත අනුක්ත භේදය<br>- පූර්ව ක්‍රියා<br>- ආශීර්වාද ක්‍රියා<br>උක්තය, කර්මය, ආඛ්‍යාතය ක්‍රියාපදය කාල භේදය හඳුනාගැනීම. සරල වාක්‍ය ලිවීම. | 24 |
| 9.0 භාෂා හා සාහිත්‍ය නිර්මාණ පරිශිලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනැගීම සඳහා ක්‍රියාකරයි. | 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධතීන් පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.<br>9.2 කියවීම මගින් සමාජ සාරධර්ම චරිතායනය කර ගනියි.<br>9.3 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි. | සංස්කෘතිය හා ජාතික උරුමයන් ගැන ලියන ලද නිර්මාණයක්. අනුරාධපුර යුගයේ තිබූ අපේ උරුමය ප්‍රකට වන කුට්ටම් පොකුණ, ලෝවාමහාපාය, වටදාගෙය ආදිය පිළිබඳ ලියන ලද නිර්මාණ.<br>හේන් ගොවිතැන ආශ්‍රිත ඇවතුම් පැවතුම් මතුවන පරිදි ලියවුණු නිර්මාණයක්.<br>ජාතික වීරයෙකුගේ / රජ කෙනෙකුගේ චරිතය අළලා දේශාභිමානී හැඟීම් ඉස්මතු වන සේ සකස් කරන ලද නිර්මාණ. | 10 |
| 10.0 නව සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක සහ තාක්ෂණික වටිනාකමෙන් යුත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගනියි. | 10.1 කියවා රැස්කර ගත් විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු භාෂාත්මක නිර්මාණ කාර්යයන් සඳහා දායක කර ගනියි. | විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳ ලියවුණු නිර්මාණ | 10 |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාල-ඡේද |
|---|---|---|---|
| 11.0 රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.1 ගද්‍ය පද්‍ය නිර්මාණ කියවා රස විඳියි. | ජනකතා<br>ජනකවි (විවිධ වෘත්තීන් ආශ්‍රිත ව බිහිවුණු) | 12 |
| 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි. | 12.1 කවි නිර්මාණය කරයි. | පරිසරය තේමා කරගත් කවි නිර්මාණ. | 10 |
| | 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | තමන් අත් දුටු සිද්ධියක්, අවස්ථාවක් හෝ පුද්ගල චරිතයක් ඇසුරුකොට ගෙන කරන ප්‍රබන්ධයක්. | |

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය

සන්නිවේදනයේ මෙන් ම චින්තනයේ ද මාධ්‍යය භාෂාව යි. තාක්ෂණික පෙරැළිය නිසා විශ්ව ගම්මානයක් බවට පත් ව ඇති ලෝකයේ, විවිධ අභියෝගයන් ජයගත හැකි වන පරිදි භාෂාව ශාස්ත්‍රීය ව හා නිර්මාණාත්මක ව භාවිත කිරීම සඳහා සිසු පරපුර යොමු කිරීම අප සියලු දෙනාගේ ම වගකීමකි.

නිපුණතා පාදක නව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ශිෂ්‍යයා ඒකාකාරී දේශනවලට සවන්දෙන නිෂ්ක්‍රීය පුද්ගලයෙකු නොව දැනුම ගවේෂණය කරන්නා වූ ක්‍රියාකාරී පුද්ගලයෙකි. ඒ සඳහා පන්ති කාමරයෙන් බැහැර ව ද විවිධ වැඩසටහන් සංවිධානය කිරීම කළ යුතු ය. පාසල් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පාසලේ පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම අරමුණු කොටගෙන මෙම වැඩසටහන් සංවිධානය කිරීම අපේක්ෂිත ය.

1. සාහිත්‍ය සංගම්
2. බිත්ති පුවත්පත් සහ සඟරා
3. ප්‍රදර්ශන
4. ව්‍යාපෘති
5. ක්‍රීඩා සහ රංගන
6. ක්ෂේත්‍ර චාරිකා
7. පැවරුම්
8. නිර්මාණ
9. සිංහල භාෂා දින වැඩසටහන්
10. සිංහල භාෂාව හා සාහිත්‍ය වෙනුවෙන් කැප වූ ප්‍රවීණයන් වෙනුවෙන් අනුස්මරණ දින
11. සාහිත්‍ය රස වින්දන වැඩසටහන්

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කරගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (Transmission Role) හා පසුකාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (Transaction Role) වර්තමාන පන්ති කාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත්, එය සිදුවිය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නො දන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුන්ට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් අන්දමින් දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමඟ ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු - සිසු අන්තර් ක්‍රියා ද පසුව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළෙයි. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ (Resource Person) තත්ත්වයට ගුරුවරයා පත්වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නො හැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම හා ඉගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු ආධාරක සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (Tranformation Role) ලෙස නම් කර තිබේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පළමුවන කොටස මගින් හඳුන්වා දෙනු ලබන විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි මේ සෑම ක්‍රියාකාරකමක් ම සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමුවන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (Engagement Step) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග දෙබසකට මුල පුරයි. පසුව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන්, සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුන්ට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම, පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (Flash Card)"වැනි උත්තේජක

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

යොදා ගැනීම, ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය, දෙබස්, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන වැනි එකක් සෘජු ව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි.

සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමුවන පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුන්ට හඳුන්වා දීම.

ක්‍රියාකාරකමේ දෙවන පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (Exploration) සඳහා සිසුන්ට අවස්ථාව ලබා දීමට ය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් සහ පැවරුමක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුම් කාර්යයේ යෙදීමට සිසුන්ට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරතවීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදව් වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුන්ට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර, සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුණු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුන්ට හිමි වේ.

ක්‍රියාකාරකමේ තෙවන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම යි. සිසු අනාවරණ පැහැදිලි කිරීම (Explanation) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්ති කාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීම ය.

ක්‍රියාකාරකම්වල සිව්වන පියවරේ දී සොයාගැනීම වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (Elaboration) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම් ඔවුන්ගේ ඉදිරිපත් කිරීම අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුන්ට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුන්ට දෙවනු ව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාට ය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත්, සංකල්ප හා න්‍යායන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරයා සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුව හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් මගින් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ දෙවන පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත්

(Assessment) ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (Evaluation) ගුරුවරයාට ඉඩ ලැබේ. තක්සේරුව හා ඇගයීම පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමුවන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලා හා සම්බන්ධ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 1.0 : සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම 1.1 : සංවාදයකට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.

ක්‍රියාකාරකම : සංවාදවලට සවන් දෙමු ; සංවාද ගොඩ නගමු

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 1.1.1.1හි සඳහන් සංවාදය
ඇමුණුම 1.1.2.1 හි සඳහන් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 1.1.1 :
- ඇමුණුම 1.1.1.1 හි සඳහන් සංවාදයට සවන් දීම සඳහා සිසුන්ට අවස්ථාව සලසන්න.
- ඒ ඇසුරින් පහත සඳහන් කරුණු ද අවධාරණය කරමින් සිසුන් සමඟ සංවාදයක යෙදෙන්න.

| |
|---|
| • සන්නිවේදනයේ දී සංවාද ප්‍රබල මාධ්‍යයක් වන බව<br>• සංවාදයක දී අලුත් තොරතුරු අනාවරණය කර ගත හැකි බව<br>• සංවාදයකින් නො දන්නා බොහෝ තොරතුරු අනාවරණය කර ගත හැකි බව<br>• සංවාද මඟින් සමාජ සම්බන්ධතා ගොඩනගා ගත හැකි බව<br>• සංවාදවලට අවධානයෙන් සවන්දීම මඟින් සක්‍රිය ව ඊට දායක විය හැකි බව.<br>• සංවාද අවස්ථාවල දී වෙනත් අයගේ මත ඉවසමින් තම අදහස් ඉදිරිපත් කළ යුතු බව |

(මිනිත්තු 10 යි.)

පියවර 1.1.2 :
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 1.1.2.1 හි සඳහන් පැවරුම කණ්ඩායම්වලට ලබා දෙන්න
- පැවරුම සඳහා අවශ්‍ය වැඩි දුර උපදෙස් ලබා දෙන්න.
- සිසුන් පැවරුම් කාර්යයේ නිරත කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 1.1.3 :
- එක් එක් කණ්ඩායම් සකස් කරන ලද සංවාද ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම ඉදිරිපත් කරන සංවාදවල දී අනෙක් කණ්ඩායම්වලට මතුවන ප්‍රශ්න ඉදිරිපත් කිරීමට හා විසඳුම් ලබා ගැනීමට සිසුන් යොමු කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 1.1.4 :
- ඉදිරිපත් කරන ලද සංවාද පිළිබඳ ව එම කණ්ඩායමේ සහ සෙසු කණ්ඩායම්වල අදහස් ලබා ගන්න.
- සිසුන්ගේ අදහස් ද සැලකිල්ලට ගෙන පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • ශ්‍රාවක අවධානය ලබා ගැනීම සඳහා නිරවුල් ලෙස අදහස් ඉදිරිපත් කළ යුතු බව<br>• අන්‍යයන්ට ද සජීවී ව සහභාගි විය හැකි අන්දමේ සංවාද ගොඩනැගිය යුතු බව<br>• සංවාදශීලීභාවය පුද්ගල පෞරුෂ සංවර්ධනයට හේතු වන බව<br>• අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතු ව සමාජ කටයුතුවල යෙදීම සඳහා සංවාදශීලීත්වය වැදගත් වන බව |

(මිනිත්තු 10යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- සංවාදවලට සවන්දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරයි.
- සංවාද ගොඩනැගීමේ දී උචිත භාෂා යෙදුම් භාවිතය පිළිබඳ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- සංවාද හා සාකච්ඡාවල දී ඉවසිලිවන්ත ව හා අවස්ථෝචිත ව ක්‍රියා කරයි.
- අන් අය සමඟ සුහදශීලී ව සංවාදයේ යෙදෙයි.

ඇමුණුම 1.1.1.1

විල්පත්තු චාරිකාව

තුසිත : "ඔයාලා දන්නවා ද? විල්පත්තු කැලේ ඇතුළේ සමහර තැන් හරිම අඳුරුයි. රැහැයියන්ගේ සද්දෙයි සතුන්ගේ සද්දෙයි නිසා මහ බයකුත් දැනෙනවා."

අමිල : "විල්පත්තුව තියෙන්නෙ පුත්තලම පැත්තේ නේද?"

තුසිත : "ඔව්.. ඔව්... පුත්තලම් අනුරාධපුර, මන්නාරම් කියන දිස්ත්‍රික්ක තුනට ම විල්පත්තුව අයිතියි."

අමිල : "මම අහල තියෙනව වැඩියෙන් ම දිවියෝ ඉන්නෙත් විල්පත්තුවේ කියලා."

තුසිත : "ඒ කතාව ඇත්ත. විල්පත්තුවෙ තමා වැඩියෙන් ම දිවියො ඉන්නෙ."

සුරාජ් : "ඒ විතරක් යැ විල්පත්තුවට ඒ නම ලැබිල තියෙන්නෙ විල්ලු ගොඩක් තියෙන නිසා නේ."

මදාරා : "මොනවද සුරාජ් ඒ විල්ලු කිව්වේ?"

සෙව්වන්දි : "අනේ ළමයො, විල්ලු කියන්නෙ ස්වාභාවික ව ම වතුර එකතු වෙලා හැදිලා තියෙන ජලාශනෙ."

තුසිත : "විල්ලුවක තරම පේන්නෙ වැස්සෙන් වතුර පිරුණාමයි. පායන කොට පිට්ටනියක් වගෙයි."

ප්‍රවීන් : "ඒ විතරක් නෙවෙයි. වියලි දේශගුණික කලාපයක් නිසා කටු පඳුරු තමයි වැඩියෙන් ම තියෙන්නෙ."

අමිල : "ඒක නෙමෙයි අර ඔයාට සිද්ධ වෙච්ච ඇබැද්දිය කියන්න."

තුසිත : "ඔන්න අපි ඉතිං ජීප් එකේ නැගල කැලේ ඇතුළට ගියා. මුව රංචුව අපි දිහා ඔළුව උස්සගෙන බලා හිටිය. හාවෝ, මොණරු, ඌරෝ වගේ සත්තු ගොඩක් හම්බ වුණා."

දර්ශන : "අර වල් අලිය හම්බ වුණේ එහෙදි ද?"

එරන්දි : "දර්ශන ඉවසලා ඉන්නකෝ. ඔයා මැදට පැනල බාධා කරනවනෙ ඔයා කියන්න තුසිත."

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තුසිත : "ඉතිං අපි දවල්ට කෑමත් කාලා හවස් වෙනතුරු ම කැලේ ඇවිද්දා. දැන් ඉතින් යන්න බලමු නේද.... "හවස් වෙද්දී නපුරු සත්තුත් කැලෙන් එළියට එනවනෙ...." කියල තාත්තා කිව්ව."

සුරාජ් : "ඉතිං අර වල් අලියා."

තුසිත : "ඊට පස්සෙ අපි ගිය ජීප් එක හරව ගෙන ආපහු එද්දි ලොකු වංගුවක් තිබ්බ. එක පැත්තක ලොකු කළුගලක්. අනිත් පැත්තෙ මහා පලුගහක්. වංගුවෙන් හරවද්දි එක පාරට ම ගලක් පෙරළුණා වගේ දැවැන්තයෙක් පාරට පැන්න. අපේ අම්මයි අක්කයි හොඳට ම බය වුණා. තාත්ත වාහනේ නවත්වල කෑගහන්න එපා කිව්ව."

ප්‍රවීන් : "අලියා මොකද කළේ?"

තුසිත : "ඌ හොඬ අකුළගෙන ජීප් එක දිහාට හැරිල කකුලෙන් පොළව හාරන්න ගත්ත. කන්දෙක කුලු දෙකක් වගේ වේගයෙන් වැනුවා. මහ හයියෙන් කෑ ගැහුව ටික ටික ඉස්සරහට ඇදුණා. තාත්ත කලබල වුණේ නෑ. වල් අලියා ටික දුරක් ඇවිත් නැවතුණා. තාත්ත කිව්ව අපි එයාට කරදරයක් නොකළොත් අපිට කරදර කරන්නෙ නැහැ කියලා. අලියා පාර දිගේ ම ටික දුරක් ඇවිත් කැලේට හැරුණා. අපි ආව."

ඇමුණුම 1.1.2.1

පැවරුම

පොදු උපදෙස්:

- ඔබ කණ්ඩායමට ලැබෙන තොරතුරු හොඳින් අධ්‍යයනය කරන්න.
- එම තොරතුරුවලට අදාළ ව කෙටි සංවාදයක් ගොඩනගන්න.
- ඔබ කණ්ඩායම සකස් කළ සංවාදය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම්වන්න.

පළමු වන කණ්ඩායම

- ඔබ දුටු අසිරිමත් පෙරහැරක් පිළිබඳ මිතුරන් අතරේ ඇති වන සංවාදයක්

දෙ වන කණ්ඩායම

- ලංකාවේ සුන්දර ම දිය ඇල්ල නැරඹූ මිතුරන් කීපදෙනෙකු අතර ඇතිවන සංවාදයක්

තුන් වන කණ්ඩායම

- පාසලේ විවිධ ප්‍රසංගයට ඉදිරිපත් කිරීමට යෝජිත විශේෂාංගයක් ගැන මිතුරන් අතරේ කෙරෙන සාකච්ඡාවක්

හතර වන කණ්ඩායම

- අධ්‍යාපන චාරිකාවක දී නරඹන ලද ස්ථානයක් පිළිබඳ ව මිතුරන් අතර ඇති වන සංවාදයක්

නිපුණතාව 1.0 : සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : විවිධ ප්‍රකාශනවලට සවන් දී අන්තර්ගතය ග්‍රහණය කර ගනියි.

ක්‍රියාකාරකම 1.2 : කවි අසමු ; අරුත් විමසමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 1.2.1.1 හි සඳහන් පද්‍ය
ඇමුණුම 1.2.2.1 හි සඳහන් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 1.2.1 :
- ගායන කුසලතා ඇති සිසුවෙකු මඟින් ඇමුණුම 1.2.1.1 හි ඇතුළත් පද්‍ය කිහිපය සිසුන්ට ඇසීමට සලස්වන්න.
- පද්‍ය ඇසුරින් පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- පද්‍යවලට සවන් දීම අවධානයෙන් කළ යුතු බව
- එක් එක් පද්‍යයෙන් ධ්වනිත වන අදහස් මතක තබා ගත යුතු බව
- පද්‍යවලින් විවිධ අරුත් ජනනය වන බව

(මිනිත්තු 10 යි.)

පියවර 1.2.2 :
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- සුදුසු ක්‍රමයක් උපයෝගී කරගෙන දී ඇති පද්‍ය පන්තිය සිසුන්ට ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- ඇමුණුම 1.2.2.1 හි සඳහන් පැවරුම් පත්‍රිකා කණ්ඩායම්වලට ලබා දී අවශ්‍ය උපදෙස් දෙන්න.
- පැවරුම් කාර්යයේ සිසුන් නිරත කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 1.2.3 :
- ඒ ඒ කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම්වලට අවස්ථාව සලසා දෙන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 1.2.4 :
- සෙසු කණ්ඩායම්වල අදහස් ලබාගන්න.
- පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- සෑම පද්‍යයක් කෙරෙහි ම අවධානය යොමු කරමින් සවන් දීම මගින් එහි අන්තර්ගතය ප්‍රකාශ කළ හැකි බව
- සුවිශේෂ යෙදුම් මතක තබා ගෙන අදහස් ඉදිරිපත් කළ යුතු බව
- සවන් දීමේ දී පර්යාය පද පිළිබඳ දැනුම අදහස් ප්‍රකාශනයට වැදගත් වන බව
- උසස් වින්දනයක් ලැබිය හැකි ගීත තෝරා බේරා ගෙන සවන් දී රසවිඳිය යුතු බව

(මිනිත්තු 10 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- ගීතයේ අන්තර්ගත තේමාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ගීතයේ එන යෙදුම් උපුටා දක්වයි.
- අර්ථවත් ගීත තෝරා බේරා ගෙන සවන් දෙයි.
- සමාජ මෙහෙවර සඳහා ගීත යොදාගත හැකි ආකාරය පිළිබඳ ව අන්‍යයන් දැනුවත් කරයි.

ඇමුණුම 1.2.1.1

| | |
|---|---|
| ඒ දවස උදාස | න |
| මහසත් තුමා සසොබ | න |
| පබවත ගෙනෙන මෙ | න |
| යමැයි සාගල පුරට සිතමි | න |
| | |
| තෙද විකුම් පළ | කොට |
| මෙමා සිත ඉඟි සිදු | කොට |
| ඒනතෙක් මෙ | නුවර ට |
| මෙ රජ සිරිසර හැම නියම | කොට |
| | |
| මපිය රජ හට | වත් |
| සොහොවුරු කුමරිඳුට | වත් |
| මෙ රජ සිරි දුන | හොත් |
| ගැනුම් උගහට වේය | නැවතත් |

## පැවරුම

පොදු උපදෙස්

- ඔබට ලැබෙන පද්‍ය පන්තිය හොඳින් ශ්‍රවණය කරන්න.
- පද්‍යවලින් ධ්වනිත වන අදහස් ගොනු කරන්න.
- ඒවා කණ්ඩායමේ සාමාජිකයන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරු ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.2.2.2

සත් මුහුදක් ඈත එතෙර දේසෙන
ඉරු ගල් බිසව කුසෙන් උපන් තැන
ගණ දෙවියෝ දුන් කිරුළිස දරමින
සත් දින පසු ව පැලපත් දකිමින

දිනෙන් දිනට වැඩිවිය පැමිණෙන්නේ
මුදුන ඉරා අතු ගොබ නගිමින්නේ
යොදුන් පමණ කැකුළයි අට ගන්නේ
ගොසින් වාත සුළඟට නගිමින්නේ

හරියට තුන් මස ගියතැන පිපිරෙති
එළියට වන් මල් ඉති අග බරවෙති
පිටියට මීමැසි බමරෝ නද දෙති
සරියට පොල් ගස් වගයක් අටගති

පළමු ව රන් තැඹිලිය නම් පොල් වෙති
දෙවනු ව ගොන් තැඹිලිය නම් පොල් වෙති
තෙවනු ව නවසි ද බෝදිලි නම් වෙති
සමසක් ගියතැන පොල් ගෙඩි මෝරති

පොළොවේ මිහිකත ගස මුල වැසෙති
මහ කෙළ නාරද කඳ මැද වැසෙති
නාපති සුරපති කරබඩ වැසෙති
විස්නු සුරාපති ගෙඩියේ වැසෙති

දුන්නෙන් මේ පොල් ගණ දෙවි විසින
පන්තිස් රාගය ඇදුරෝ දෙසන
අට අනු නව අනු වද දී දුරලන
මේ ලෙස පොල් ගෙන පයට තබා ගෙන

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතා 1.0 : සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම 1.3 : ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි.

ක්‍රියාකාරකම : ආචාරශීලී ව කතා බහේ යෙදෙමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 1.3.1.1 හි සඳහන් ඡේදය
ඇමුණුම 1.3.2.1 හි සඳහන් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.3.1 :
- ඇමුණුම 1.3.1.1 හි සඳහන් ඡේදය, ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක ලවා හෝ ශබ්ද නඟා කියවීමට සලස්වන්න.
- එහි දී පහත සඳහන් කරුණු ද ඉස්මතු කරන්න.

> - පූජ්‍ය/ පූජක දෙපිරිස සමඟ කෙරෙන සංවාදවල දී විශේෂ වචන භාවිත වන බව
>   නිදසුන්: වැඩ ඉන්නව, වඩිනවා සැතපෙනව, පින්වතුන්, ඔබ වහන්සේ, දානේ පියතුමා, කන්‍යා සොයුරිය, කුරුක්කල්තුමා වැනි වචන
> - පූජ්‍ය පක්ෂය සමඟ අදහස් හුවමාරුවේ දී සංයමයෙන් යුතු ව ගෞරව සම්ප්‍රයුක්ත ව භාෂාව හැසිරවිය යුතු බව.

(මිනිත්තු 10 යි)

පියවර 1.3.2 :
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම්වලට වෙන්කරන්න.
- පැවරුම් පිටපත් සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න.
- සිසුන්ට ක්‍රියාකාරකම්වල නිරත වීමට කාලය ලබා දෙන්න.

(මිනිත්තු 30 යි)

පියවර 1.3.3 :
- ගවේෂණය මඟින් අනාවරණය කරගත් කරුණු පන්තියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 1.3.4 :
- සෙසු කණ්ඩායම්වල අදහස් ද ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු පිළිබඳ අවධාරණය කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී ඒ ඒ තරාතිරම්වලට ආවේණික බස් වහර භාවිත කළ යුතු බව
> - පූජ්‍ය පක්ෂය සමග කෙරෙන කතාබහේ දී සිංහල භාෂාවට ම විශේෂිත ව පූජ්‍ය පක්‍ෂය විෂයෙහි යෙදෙන භාෂා ව්‍යවහාරයන් යොදාගතයුතු බව
> - ආකල්පමය වෙනසක් ඇතිකර ගැනීමෙන් පූජ්‍ය පක්ෂය සමග කෙරෙන සංවාදවලදී උචිත භාෂාව පහසුවෙන් භාවිත කළ හැකි වන බව

(මිනිත්තු 10 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- පූජ්‍ය පක්ෂය හා කරන සංවාදවල දී ඊට ආවේණික වාං මාලාවක් ඇති බව ප්‍රකාශ කරයි.
- සංයමයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දක්වයි.
- පූජ්‍ය පක්ෂයේ ගෞරවය ආරක්ෂා වන පරිදි කතා කරයි.
- ආගමික කටයුතුවල දී පූජ්‍ය පක්ෂය සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි.

ඇමුණුම 1.3.1.1

අපේ ලොකු හාමුරුවෝ හැමදා ම උදෑසන පිණ්ඩපාතය සඳහා ගෙපිළිවෙළින් වැඩම කළහ. මොර සූරන අනෝරා වැහි දවසක වුවත් පිඬු සිඟා වැඩම වීම අමතක නොකළ අපේ ලොකුහාමුදුරුවෝ මහ වැහි කඩා හැළෙනදාට කහ පැහැති කුඩයක් හිසලා ගෙන ගියහ. මඟුලක්, මරණයක් හෝ වෙනත් හේතුවක් නිසා ගම් වැසියන් හීල් දානය පන්සලට ගෙනෙන බව කලින් දන්වා ආරාධනා කර සිටියොත් පමණක් උන් වහන්සේ පිඬු සිඟා නො ගොස් පන්සලෙහි ම වැඩ සිටින්නා හ. එසේ ම කිසිදාකත් දහවල් දානය සඳහා උන්වහන්සේ පිඬු සිඟා නොවැඩි සේක. අවුරුද්දේ තුන්සිය හැටපස් දවසේ ම ගම් වැසියන් මුර දානය සඳහා ප්‍රධාන දායක මහතාගෙන් දන් සීට්ටු ලබා සිටි නිසා කවදාවත් අපේ ලොකු හාමුදුරුවන්ට දහවල් දානය වැරදුණේ නැත. වැරදුණත් උන් වහන්සේට එහි අමුත්තක් නො දැනිණ.

සරත්චන්ද්‍ර ජයකොඩි මහතාගේ "ගමේ ඇත්තෝ" කෘතියෙන් උපුටා ගැනිණි.

## පැවරුම සඳහා පොදු උපදෙස්

- 1.3.2.1 සංවාදය හොඳින් කියවන්න.
- එහි පූජ්‍ය පක්ෂය සමඟ කථා කරන විට භාවිත කර ඇති විශේෂ යෙදුම් හා වචන උපුටා ලියා ඒ ඒ පදවලට ඉදිරියෙන් පොදුවේ ව්‍යවහාර වන යෙදුම ලියන්න.
- ඊට අමතර ව පූජ්‍ය පක්ෂය හා කථා කිරීමේ දී භාවිත වන වගන්ති ,වාක්‍ය හැකි තරම් ලියන්න.
- කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

ඇමුණුම 1.3.2.1

### පැවරුම

| | | |
|---|---|---|
| පොඩි හාමුදුරුවෝ | - | සුවපත් වෙත්වා! මොකද මේ දරුවෝ ටික අද තකහනියේ මේ පැත්තේ......? |
| සිතාරා | - | අවසරයි පොඩි හාමුදුරුවනේ..... ! |
| සෙව්වන්දි | - | පොඩි හාමුදුරුවනේ.., අපි ඔබ වහන්සේ පන්සලේ වැඩ ඉන්නවා ඇති කියලා හිතල පන්සලටත් ගියා. |
| එරන්දි | - | පන්සලේ ඉන්න සේතං මාමා කිව්ව නායක හාමුදුරුවන්ගේ උවමනාවකට වෙද ගෙදරට වැඩියා කියල |
| පොඩි හාමුදුරුවෝ | - | මොකද මේ උපාසක මහත්තුරු කතාවක් බහක් නැත්තේ? |
| අරුණ | - | පොඩි හාමුදුරුවනේ.., දැන් වෙසක් පෝයත් ළං වෙනවනෙ. |
| පොඩි හාමුදුරුවෝ | - | මේ පින්වතුන්ට ඒක අමතක වෙලා නෑ එහෙනං..........අපේ සමාජේ සමහර වැඩිහිටි ඇත්තන්ට "පෝය" අමතක වුණාට අපේ බෝසත් තරුණ සමාජේ ඇත්තන්ට අමතක නෑ. |
| මදාරා | - | එහෙමයි පොඩි හාමුදුරුවනේ අපි වෙසක් පෝයට නෙළුම්මල් දන්සලක් දෙන්න ඔබ වහන්සේගෙන් අවවාද අනුශාසනා බලාපොරොත්තු වෙනුයි ආවේ. |
| නුවන් | - | ඒ විතරක් නෙවෙයි. පොඩි හාමුදුරුවනේ මේ වතාවේ ස්වාමීන් වහන්සේලා කීප නමක් ම වඩම්මලා දවල් දානේ පිළිගන්වන්නත් අපි බලාපොරොත්තු වෙනව. |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පොඩි හාමුදුරුවෝ - මේ තරුණ ඇත්තො මේ වගේ පිංකම්වල යෙදීම උතුම් ක්‍රියාවක්. මගෙන් මොනවද කෙරෙන්න ඕනෑ.

නිලූකා - ඔබ වහන්සේට අපි ආරාධනා කරන්න ආවේ ලබන පසළොස්වක පෝය දවසට අපේ "බෝසත්" තරුණ සමාජේ මහ සභා රැස්වීමට වඩින්න කියලයි. එතන දී ඔබ වහන්සේගේ අවවාද අනුශාසනා අවශ්‍ය වෙනවා. මල් දන්සලයි දවල් දානෙයි සංවිධානය කරන්නෙ කොහොම ද කියල අපට තනියෙන් තීරණය කරන්න අමාරුයි.

පොඩි හාමුදුරුවෝ - හොඳයි! මේ බක් මාසෙනෙ. අපිට තව මාසයක් ම තියෙනවනෙ කීයට ද මම සමිති ශාලාවට වඩින්න ඕනෑ?

නදීකා - උදේ 9.30ට යි රැස්වීම පටන්ගන්නේ . ඔබ වහන්සේ ඒ වෙලාවට වැඩියොත් හොඳයි. අපි ගිලන්පස සූදානම් කරනවා. එන හැමෝටමත් තේ දෙන්නයි බලාපොරොත්තුව.

පොඩි හාමුදුරුවෝ - බොහොම අගෙයි. යහපත් වැඩක් යහපත් චේතනාවෙන් ආරම්භ කරන කොට හොඳ සංවිධානයක් තියෙන්න ඕනෑ. ඒ වගේ ම හැමෝ ම සතුටින් එක්වෙලා සමගියෙන් සාකච්ඡා කරලා සමඟියෙන් විසිරෙන්න ඕනෑ. මම අපේ නායක හාමුදුරුවන්ටත් මේ ගැන කියන්නම් කො. මමත් ඒ වෙලාවට ම වඩින්නම්.

(සියල්ලෝ ම පසඟ පිහිටුවා වඳිති).

පොඩි හාමුදුරුවෝ - සුවපත් වෙත්වා....!

නිපුණතාව 1.0 :සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම 1.4 :සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රසාස්වාදයේ යෙදෙයි.

ක්‍රියාකාරකම :කවි අසමු ; රස විඳිමු.

කාලය :මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 1.4.1.1 හි ඇතුළත් හංස සංදේශයේ කවි
- ඇමුණුම 1.4.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.4.1 :
- ඇමුණුම 1.4.1.1 හි එන පද්‍යය සිසුන් පිරිසක් ලවා විවිධ තාලවලට ගායනා කරවන්න.
- එම පද්‍යවලට සවන්දීමේ දී සිසුන් තුළ ඇති වූ හැඟීම් පිළිබඳ ව කතා බහ කරමින් සංවාදයක යෙදෙන්න.
- එහි දී පහත සඳහන් කරුණු වෙත ද අවධානය යොමු කරන්න.

> - විවිධ තාලවලට අනුව කවි ගායනයට සවන් දීම රසවින්දනයට හේතු වන බව
> - නොයෙක් වස්තූන් පිළිබඳ කවියන් තුළ පහළ වන හැඟීම් හා අදහස් රමණීය ලෙස කවියෙන් ප්‍රකාශ වන බව
> - කවි රස විඳීම සඳහා අවධානයෙන් යුතු ව සවන් දීම වැදගත් වන බව.

(මිනිත්තු 10 යි)

පියවර 1.4.2 :
- පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට වෙන් කර පැවරුම්පත් ලබාදෙන්න.
- ශිෂ්‍යයෙකු හෝ වෙනත් සම්පත් දායකයෙකු යොදාගෙන පෙළපොතෙහි එන සැළලිහිණි සංදේශයෙන් උපුටා ගත් පද්‍ය පන්තිය ශ්‍රවණය කිරීමට අවස්ථාව සලසන්න.
- පැවරුම් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 1.4.3 :
- පද්‍ය ගායනයට හා පැවරුම් ඉදිරිපත් කිරීමට එක් එක් කණ්ඩායම්වලට අවස්ථාව ලබාදෙන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 1.4.4 :
- එක් එක් කණ්ඩායමේ අදහස් අනෙක් කණ්ඩායම්වලට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් ඉදිරිපත් කළ අදහස් ද සැලකිල්ලට ගෙන පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - පද්‍ය පන්තිය රසවත් ලෙස නිර්මාණය කිරීම සඳහා විවිධ කාව්‍යෝපක්‍රම යොදාගෙන ඇති බව
>   භාෂාව, උපමා, රූපක
> - විවිධ තාලවලට ගායනා කරමින් රස විඳිය හැකි බව
> - කවියක් රස විඳීමේ දී ඊට අදාළ චිත්‍රයක් මනසෙහි ඇඳෙන බව (සංකල්ප රූප, වාක් චිත්‍ර)
> - ස්වාභාව සෞන්දර්යය වර්ණනයෙහි ලා අපූරු සංකල්ප යොදාගෙන ඇති බව

(මිනිත්තු 10 යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- රස වින්දනයේ දී සැලකිය යුතු කරුණු විස්තර කරයි.
- විවිධ පද්‍ය තෝරාගෙන ගායනා කරයි.
- විවිධ පද්‍ය අසා රස විඳියි.
- සාමූහික ව පද්‍ය රසාස්වාදයේ යෙදෙයි.

ඇමුණුම 1.4.1.1

පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

කුළින් කුළම සිහිලඹ වැහෙන කඳුරැය
දොළින් දොළ ම කල් යල් කරන කුඹුරැය
පළින් පළම තල් පොල් ගෙවතු මැදුරැය
තලින් තලම පුල් පියුමුපුල පඬෙරැය

(හංස සංදේශය කෑරගල වැනුම)

ඇමුණුම 1.4.1.1

## පැවරුම

පොදු උපදෙස්

- ඔබට ලැබුණු පද්‍ය පන්තිය තාලානුකූල ව ගායනා කිරීම සඳහා සූදානම්වන්න.
- පද්‍ය පන්තිය කියවා ඔබට ලැබී ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.

පළමුවන කණ්ඩායම

(1) එක් එක් කවියෙන් ප්‍රකාශිත අදහස සරල බසින් ලියන්න.

දෙවන කණ්ඩායම

(2) ස්වභාව සෞන්දර්ය වර්ණනා කිරීම සඳහා කවියා දක්වා ඇති කුසලතාව විස්තර කරන්න.

තුන්වන කණ්ඩායම

(3) පද්‍ය පන්තියේ ඇතුළත් උපමා උපමේය වෙන් කොට දක්වා කාව්‍ය රසය කුළුගැන්වීම සඳහා ඒවා යොදා ගෙන ඇති ආකාරය විස්තර කරන්න.

සිව්වන කණ්ඩායම

(3) සමස්ත පද්‍ය පන්තියට සවන්දීමේ දී ඔබේ සිතේ පහළ වූ හැඟීම් ලියා දක්වන්න.

නිපුණතාව 1.0 : සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම 1.5 : විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දීමේ පුරුදු ප්‍රායෝගික භාෂා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගනියි.

ක්‍රියාකාරකම : රූපවාහිනිය නරඹමු ; ගුවන් විදුලියට සවන් දෙමු.

කාලය : මිනිත්තු 120 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 1.5.1.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 1.5.1 :
- ගුවන් විදුලියේ/ රූපවාහිනියේ සවන්දුන්/ නැරඹූ වාර්තා හා විචිත්‍රාංග වැඩසටහන් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- සිසුන්ගේ පිළිතුරු සහ පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් සිසුන් සමඟ සංවාදයක යෙදෙන්න.

> - විවිධ වර්ගයේ වැඩ සටහන් ගුවන් විදුලියේ හා රූපවාහිනියේ විකාශනය වන බව
> - ඒ අතරින් අපට සුදුසු වැඩසටහන් තෝරා බේරා හෝ සවන්දිය යුතු බව
> - වාර්තා හා විචිත්‍රාංග වැඩසටහන්වල විවිධ පුද්ගලයන්, ස්ථාන ආදිය පිළිබඳ ව ගවේෂණාත්මක තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් වන බව

(මිනිත්තු 10 යි)

පියවර 1.5.2 :
- සුදුසු පරිදි පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- පෙළපොතේ සඳහන් 'බාලදක්ෂයෝ' ගුවන් විදුලි සාකච්ඡාව වෙත අවධානය යොමු කරවන්න.
- සිසුන් පැවරුම් කාර්යයේ නිරත කරවන්න.

(මිනිත්තු 50 යි.)

පියවර 1.5.3 :
- සිසුන්ට තම පැවරුම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 1.5.4 :
- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් පිළිබඳ ව එම කණ්ඩායමේ සිසුන්ට ම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
- අනෙක් සිසුන්ට ද අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් සමාලෝචනයක නිරත වන්න.
  - 'බාලදක්ෂයෝ' ගුවන් විදුලි සාකච්ඡාවකින් උපුටා ගත්තක් බව.

> - එයින් බාල දක්ෂ ව්‍යාපාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් වන බව
> - මෙවැනි වැඩසටහන් විවිධාකාරයෙන් ඉදිරිපත් කරන බව
> - එම වැඩසටහන් ඉදිරිපත් කිරීමේ විවිධතා හඳුනාගත යුතු බව
> - වැඩසටහන් අනුව භාෂාව හැසිරවීමේ විවිධතා ඇති බව
> - එම වාර්තා හා විචිත්‍රාංග වැඩසටහන්වලින් අපේ දැනුම සංවර්ධනය කර ගත හැකි බව
> - ලිපි, රචනා, කවි, කථා ආදි ප්‍රයෝජනවත් බව

(මිනිත්තු 20 යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- ගුවන්විදුලියේ/ රූපවාහිනියේ විකාශනය වන වාර්තා හා විචිත්‍රාංග වැඩසටහන් නම් කරයි.
- වාර්තා හා විචිත්‍රාංග වැඩසටහන් ආශ්‍රයෙන් උකහා ගත් දැනුම විවිධ ලිපි ලේඛන නිර්මාණයේ දී යොදා ගනියි.
- හොඳ වාර්තා හා විචිත්‍රාංග වැඩසටහන් තෝරා බේරාගෙන සවන්දෙයි/ නරඹයි.
- විවිධ වාර්තා හා විචිත්‍රාංග වැඩසටහන් ඉදිරිපත් කිරීමට යොමු වෙයි.

ඇමුණුම 1.5.1.1

## පැවරුම

- ඔබ කණ්ඩායමේ සාමාජිකයන් සමඟ එක් ව පෙළපොතේ සඳහන් බාලදක්ෂයෝ සංවාදය පන්තියට සජීවී ලෙස ඉදිරිපත් කරන්න.
- ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ ඔබ සවන්දෙන, නරඹන වාර්තා හා විචිත්‍රාංග වැඩසටහන් පෙළගස්වන්න.
- ඔබ සවන්දුන්/ නැරඹූ වාර්තා හා විචිත්‍රාංග වැඩසටහනක අන්තර්ගත වූ කරුණු ආශ්‍රයෙන් කෙටි ලිපියක් ලියන්න.

නිපුණතාව 2.0 : තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.1 : සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කරයි.

ක්‍රියාකාරකම : පිරිසක් අමතා කතා කරමු.

කාලය : මිනිත්තු 120 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 2.1.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 2.1.1 :
- පාසලේ උදෑසන රැස්වීමේ දී හෝ සමිති වාරයක දී හෝ වෙනත් එබඳු අවස්ථාවක දී කථිකයෙකු ඉදිරිපත් කළ කතාවක් සිහිපත් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඔහුගේ කථාවෙහි සිත්ගත් විශේෂ ලක්ෂණ පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එහි දී පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - දක්ෂ කථිකයන්, ශ්‍රාවක පිරිසක් ඉදිරියේ නොපැකිළ ව තම අදහස් ඉදිරිපත් කිරීමේ කුසලතා ඇති කර ගත යුතු බව
> - අවශ්‍ය තැන සුදුසු පරිදි අංග චලනයෙහි යෙදෙන බව
> - කථිකයන් අවස්ථානුකූල ව උචිත ශෛලීන් භාවිත කරන බව
> - චතුර කථිකයෙකු වීම සඳහා කතා පැවැත්වීමේ අවස්ථා උදා කරගත යුතු බව
> - චතුර කථිකයින් සමාජයේ පිළිගැනීමට ලක්වන බව

(මිනිත්තු 20 යි.)

පියවර 2.1.2 :
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 2.1.21 හි ඇති මාතෘකා සිසු කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කතා පැවැත්වීම සඳහා කණ්ඩායම් වශයෙන් සූදානම් වීමට උපදෙස් හා අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 20 යි.)

පියවර 2.1.3 :
- සූදානම් වූ කතා තනි තනි ව ඉදිරිපත් කිරීමට සියලු ම සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- පළමු ව කථිකත්වයට හුරුවක් ඇති සිසුන්ට අවස්ථාව ලබා දී අනෙක් සිසුන්ට සූදානම් වීමට වැඩි අවස්ථාවක් ලබා දෙන්න.

(මිනිත්තු 60 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 2.1.4 : • ඉදිරිපත් කළ කතා පිළිබඳ ව පළමු ව සිසුන්ගේ ප්‍රතිචාර විමසන්න.
• පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- කතාවක් පැවැත්වීමේ දී
  - මාතෘකාවට අදාළ ව සාරවත් කරුණු ගොනු කළ යුතු බව
  - සවන් දෙන්නන්ගේ අවධානය යොමු කර ගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිත කළ යුතු බව
    උදා ඃ නිසි හඬ පාලනය, උචිත අංග චලනය, ඇසට ඇස යොමු කරමින් කතා කිරීම
- තම කථිකත්වය සංවර්ධනය කර ගැනීම සඳහා පොතපත කියවීමෙන් සහ අන් අයගේ කථාවලට සවන් දීමෙන් විෂය කරුණු රැස් කරගත යුතු බව
- කතා පැවැත්වීමට අවස්ථා එළඹුණු විට නො පැකිළ ව ඉදිරිපත් විය යුතු බව
- කතාව රසවත් කර ගැනීම සඳහා විවිධ භාෂා උපක්‍රම භාවිත කළ යුතු බව
- විවිධ පුද්ගලයන්ගේ වැදගත් හා වටිනා ප්‍රකාශන හා උද්ධෘත හා යෙදුම් පිරුළු ආදිය අවස්ථාවට උචිත පරිදි යොදා ගත යුතු බව

(මිනිත්තු 20 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :
- කතාවක් පැවැත්වීම සඳහා මාතෘකාවට අදාළ ව කරුණු ගොනු කරයි.
- සබකෝලයෙන් තොර ව කතාවක් ඉදිරිපත් කරයි.
- කථිකත්වය දියුණු කර ගැනීමට අවශ්‍ය ගුණාංග වර්ධනය කර ගනියි.
- සබකෝලයෙන් තොර ව අන්‍යයන් හා අදහස් හුවමරු කර ගනියි.

ඇමුණුම 2.1.2.1

## පැවරුම

- ඔබ කණ්ඩායමට ලැබී ඇති පහත සඳහන් මාතෘකා වෙත අවධානය යොමු කරන්න.
- කණ්ඩායමේ සාමාජිකයන් සියලු දෙනා ම එක් එක් මාතෘකාව යටතේ මිනිත්තු- 3ක පමණ කතාවක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කරුණු ගොනු කරන්න.
- සාකච්ඡා කළ කරුණු අනුව කණ්ඩායමේ සියලු ම සාමාජිකයන් පන්තිය ඉදිරියේ කතාවක් කිරීම සඳහා සූදානම් වන්න.

කථා පැවැත්වීමට යෝජිත ආදර්ශ මාතෘකා
- මගේ රට ගැන මට ආඩම්බරයි.
- අපේ පරිසරය අපි ම සුරකිමු.
- හුරු පුරුදු කළ යුතු හොඳ ගතිගුණ
- මා කැමති ක්‍රීඩකයා/ ක්‍රීඩිකාව
- සමගියෙන් රට හදමු.
- පොත පත කියවීමේ ප්‍රයෝජන
- ජාතික සම්පත් සුරකිමු.
- බත සපයන ගොවි විරුවෝ
- අපේ රටේ නිපැයුම් භාවිතයට හුරුවෙමු.

නිපුණතාව 2.0 : තම අදහස් අර්ථවත් ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 2.2 : සවන්දෙන්නා පිළිබඳ සැලකිලිමත් ව අවස්ථාවට උචිත ලෙස කතා කරයි.

ක්‍රියාකාරකම : ශ්‍රාවක ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් සංවාදයේ යෙදෙමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 2.2.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 2.2.1 :
- පහත සඳහන් අවස්ථාව හෝ ඒ සමාන අවස්ථාවක් ඇසුරින් භූමිකා රංගනයක් ඉදිරිපත් කරන්න.
  - මලක් හා සමනළයෙකු අතර සංවාදයක්.
- භූමිකා රංගන අවසානයේ පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

> - සංවාදයක දී අදහස් දැක්වීමට පෙර හොඳින් සවන්දිය යුතු බව
> - සවන් දෙන්නාගේ උගත්කම, වයස ආදී ස්වරූපයන්ට ගැළපෙන ලෙස කතාබහේ යෙදීම අවශ්‍ය බව
> - කතාබහ කිරීමේ දී සවන් දෙන්නාගේ ඉරියව් පිළිබඳ අවධානය යොමු කළ යුතු බව

(මිනිත්තු 15 යි.)

පියවර 2.2.2 :
- පන්තියේ සිසුන් කුඩා කණ්ඩායම් කීපයකට වෙන්කරන්න.

> - ඇමුණුම් අංක 2.2.2.1 හි ඇතුළත් පැවරුම් පත්‍රිකා කණ්ඩායම් වෙත ලබා දෙන්න.
> - සිසුන් පැවරුමෙහි නිරත කරවන්න.
>
> (මිනිත්තු 20 යි)

පියවර 2.2.3 :

> - භූමිකා රංගන ඔස්සේ කණ්ඩායම් පැවරුම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
> - එක් කණ්ඩායමක් ඉදිරිපත් කරන විට අනෙක් කණ්ඩායම් භූමිකා රංගනය නැරඹීමට අවස්ථාව සලසන්න.

පියවර 2.2.4 :
- පළමු ව ඉදිරිපත් කළ කණ්ඩායමට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- සෙසු කණ්ඩායම්වල අදහස් සාකච්ඡාවට බඳුන් කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක නිරතවන්න.

> - සවන් දෙන්නාගේ සිත් ගන්නා පරිදි කතාබහ කළ යුතු බව
> - සවන් දෙන්නාගේ ප්‍රතිචාර අවබෝධ කරගෙන සුදුසු පරිදි කතාව ඉදිරිපත් කළ යුතු බව
> - ආචාරශීලී ව කතාබහ කළ යුතු බව
> - සවන් දෙන්නන්ගේ ඇසට ඇස හමුවන පරිදි කතාබහේ යෙදිය යුතු බව
> - අවස්ථාවට සහ ස්ථානයට ගැළපෙන උචිත භාෂාවකින් කතා කළ යුතු බව

(මිනිත්තු 20යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- තේමාවන්ට අදාළ කරුණු ඇතුළත් සංවාද ගොඩ නගයි.
- සවන් දෙන්නාගේ ප්‍රතිචාර කෙරෙහි සැලකිලිමත් වෙමින් කතාබහ කරයි.
- කතාබහේ දී අන්‍යයන්ගේ අවධානය දිනා ගනියි.
- යහපත් කතාබහෙන් සමාජ සම්බන්ධතා ගොඩනඟා ගනියි.

ඇමුණුම 2.2.2.1

පොදු උපදෙස්

- පහත සඳහන් තේමාවන් අතරින් ඔබ කණ්ඩායමට ලැබෙන මාතෘකාව ඔස්සේ සංවාදයක් ගොඩනගන්න.
- සංවාදයට උචිත පරිදි චරිත වෙන්කර ගන්න.
- පන්තිය ඉදිරියේ සංවාදය ඉදිරිපත් කරන්න.

1. මවක් සහ දියණියක් අතර
2. පාසල් ශිෂ්‍යයෙකු හා ශිෂ්‍ය නායකයෙකු අතර
3. ගොවියෙකු සහ පඹයෙකු අතර
4. වෙළෙඳසල් හිමියෙකු සහ පාරිභෝගිකයෙකු අතර

නිපුණතාව 3.0 : ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම 3.1 : නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි.

ක්‍රියාකාරකම : විරාම ලකුණු හඳුනාගෙන නිවැරදි ව කියවමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 3.1.1.1 ඇතුළත් පත්‍රිකාව
ඇමුණුම 3.1.2.1 ඇතුළත් උද්ධෘත

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.1.1 :
- ඇමුණුම 3.1.1.1 පත්‍රිකාව සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් කිහිපදෙනෙකු ලවා එය කියවීමට සලස්වන්න.
- සිසුන් උගත් විරාම ලක්ෂණවලට අමතර ව මෙම ඡේදයෙහි අන්තර්ගත විරාම ලක්ෂණ මොනවාදැයි විමසමින් පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - කියවීමේ දී නිවැරදි උච්චාරණය සහ නිසි හඬ පාලනයෙන් යුතු ව කියවීම ඉතා වැදගත් බව
> - ඒ සඳහා විරාම ලකුණු පිළිබඳ ව ද සැලකිලිමත් විය යුතු බව.
> - අර්ථ නිවැරදි ව වටහා ගැනීම සඳහා විරාම ලක්ෂණ නිවැරදි ව හඳුනා ගත යුතු බව

(මිනිත්තු 10 යි.)

පියවර 3.1.2 :
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 3.1.2.1 හි පැවරුම සිසුන්ට ලබා දෙන්න.
- පැවරුම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී සිසුන් පැවරුම් කාර්යයේ නිරත කරවන්න.

(මිනිත්තු 30 යි)

පියවර 3.1.3 :
- කණ්ඩායම් පැවරුම් ඉදිරිපත් කිරීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30 යි)

පියවර 3.1.4 :
- පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - ලේඛනයේ දී විරාම ලක්ෂණ භාවිතය අත්‍යවශ්‍ය බව
> - විරාම ලක්ෂණ රැසක් භාවිතයේ ඇති බව (තිත, කොමාව,ප්‍රශ්නාර්ථ ලකුණ, තිත් කොමාව, පෙරළි කොමාව ආදී)
> - මනා හඬ පාලනයකින් යුතු ව කියවීමේ දී නිවැරදි ව උච්චාරණය කිරීම සඳහා විරාම ලක්ෂණ වැදගත් වන බව
> - විරාම ලකුණු වැරදි ලෙස යෙදූ විට අර්ථය වෙනස් වන බව

(මිනිත්තු 10 යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- විරාම ලක්ෂණ හඳුනා ගෙන නම් කරයි.
- විරාම ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් කියවයි.
- විරාම ලක්ෂණ නිවැරදි ව ලේඛනයට යොදා ගනියි.
- විරාම ලක්ෂණ භාවිතයේ වැදගත්කම අන්‍යයන්ට පහදා දෙයි.

ඇමුණුම 3.1.1.1

සිඥ්ඤෝ අප්පු හරි මිනිහ තමයි මොකක්ද අප්පේ මේ ගොතාපු බොරුව මං නං හිතුවෙ ඒ කතාව ඇත්තමයි කියල ගල් පැලෙන බොරු කියන්න කොහොම ඉගෙන ගත්ත ද මිනිහ උඩපැන්න නැටුව කරණම් ගැහුව හැමෝ ම රැවටුණා කවුද හිතන්නෙ අර විදිහට රඟපාලා පෙන්නුවා ම බොරුවක් කියල ගමක් ම මුලා කරා නෙ ඒ විතරක් නම් බැරියැ අහළ පහළ හිටපු අහිංසකයොත් පටලවා ගෙන දැන් ඉතින් ඔය ඉන්නෙ ගලේ පැහැරුව බළල වගේ හොඳ පාඩම මීට පස්සෙ බොරු නොකියන්න.

ඇමුණුම 3.1.2.1

පැවරුම

පොදු උපදෙස්

- ඔබේ කණ්ඩායමට ලැබෙන ඡේදය/ සංවාදය හොඳින් කියවන්න.
- අවශ්‍ය ස්ථාන සඳහා සුදුසු විරාම ලක්ෂණ යොදන්න.
- නිවැරදි ව විරාම ලකුණු යොදා සකස් කරන ලද ඡේදය නිසි හඬ පාලනයකින් හා නිවැරදි උච්චාරණයෙන් යුතු ව ඉදිරිපත් කරන්න.

I

- පහත සඳහන් ඡේදයට සුදුසු විරාම ලක්ෂණ යොදන්න.
- එම විරාම ලකෂණ පිළිබඳ අවධානයෙන් යුතුව ඡේදය ශබ්ද නගා කියවන්න.

ඔය වයසට ගහලා බැණලා හදන්ට අමාරුයි ලොකු එකා නැතුව ගිය එක තමයි වැරැද්දට ගියෙ යි තාත්තා ශෝකාකුල ස්වරයකින් කීය අය්යා ගෙදරින් පිටත් ව ගිය දිනක හැරෙන්නට එබඳු සෝබර පෙනුමක් තාත්තාගේ මුහුණ වසා සිටි අවස්ථාවක් මා දැක නැත මොනවා කරන්න ද මන්ද අම්මා බිමට බර වූ හිසින් යුතු ව මිදුල අතුගායි ඇගේ මුහුණ පුරා පැතිර ඇත්තේ ශෝකයකි භීතියකි සංතාපයකි ඒ දුටු මගේ සිතට ද නැගුණේ ශෝකාකුල ස්වභාවයකි

II

- පහත සඳහන් ඡේදයට සුදුසු විරාම ලක්ෂණ යොදන්න.
- එම විරාම ලක්ෂණ පිළිබඳ අවධානයෙන් යුතුව ඡේදය ශබ්ද නගා කියවන්න.

ඝන වනාන්තරයට පිය නැගූ අපට දිවියන් වලසුන් ආදී සතුන්ගේ හඬ ඇසුණේ ය ඒවා වරෙක මිහිරිය වරෙක බියකරු ය සිත මං මුළා කරයි හිරු බැස යන්නා හා ම ඇසෙන අද්භූත හඬට බිය වූ අපෙ නඩේ සිටි සිරිමල් අන්න උලමෙක් නේද අඬන්නේ යි කෑ ගැසුවේ ය වන මැද තැනිතලාවකට පිවිසි අපට දක්නට ලැබුණේ මොනරා සෙබඩ අබියස රඟන මනස්කාන්ත දර්ශනයකි තිත් මුවෝ ගෝන්නු රංචු පිටින් මේ පෙදෙසේ ගැවසෙති ඔවුන්ගේ නාදය මුවහත් කඩු එකිනෙක වේගයෙන් ගැටෙන්නාක් බඳු ය ස්වභාව සෞන්දර්යයේ චමත්කාරය තුරු සෙවනැල්ලක හිඳ නැරඹීමෙන් අපමණ ප්‍රීතියක් භුක්ති වින්දෙමු

III

- පහත දැක්වෙන සංවාදය සුදුසු විරාම ලක්ෂණ යොදා සම්පූර්ණ කර කියවන්න.

සුනිල් : නිමල් අපි යමු ද සෙල්ලම් කරන්න
දැන් අනික් යාළුවො කට්ටියත් ඇවිල්ල ඇති

නිමල් : යමු යමු පරක්කුත් වුණා සුනිල් ඔයා දැක්ක ද අන්න අඹ ගෙඩියක් වැටුණ

සුනිල් : දුවමු දුවමු අපි ඒක අහුල ගනිමු

නිමල් : අනේ ඒක හොඳ නැහැ නරක්වෙලා පණුවො පිරිල

සුනිල් : අපි ඒක අර තියෙන කුණු බාල්දියට දාමු නැත්නම් මේක කාට හරි පෑගිල ලිස්සල වැටෙන්නත් පුළුවන්

නිමල් : කමක් නෑ සුනිල් අපේ තාත්තා අනුරාධපුරේ ගියානෙ තාත්ත එහෙන් හොඳ අඹ අරගෙන ඒවි මම ඔයාටත් ඒවයින් ගෙනැල්ල දෙන්නම්

IV

- පහත දැක්වෙන ගද්‍ය කොටසට සුදුසු විරාම ලක්ෂණ යොදන්න.
- එම විරාම ලකෂණ පිළිබඳ අවධානයෙන් යුතුව ඡේදය ශබ්ද නගා කියවන්න.

මේ දර්ශනයෙන් යෝධයාගේ හදවත උණු වී ගියේය මා කොච්චර ආත්මාර්ථකාමී දැ යි ඔහු තමාගෙන් ම ඇසී ය දැන් මම දන්නවා වසන්ත කාලය තවමත් උයනේ අර මුල්ලට ඇවිල්ලා නැත්තේ මන්ද කියලා මම කියන්න ඕනෑ අර පුංචි කොලු පැටියා ගහ මුදුනේ ඊට පස්සේ උයන වටේට බැඳපු තාප්පෙ කඩල දමන්න ඕනෑ මගේ උයන හැමදා ම කුඩා දරුවන්ගෙ ක්‍රීඩා භූමියක් බවට පත් කරන්න ඕනෑ

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 3.0 : ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම 3.2 : අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවයි.

ක්‍රියාකාරකම : නිශ්ශබ්ද ව කියවමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 3.2.1.1 හි ඇතුළත් වන කතාව
- ඇමුණුම 3.2.2.2 හි ඇතුළත් ලිපිය

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.2.1 :
- ඇමුණුම 3.2.1.1 සඳහන් ජන කතාවෙන් කොටසක් නිශ්ශබ්ද ව කියවීමට අවස්ථාව දෙන්න.
- කිය වූ ජන කතාව ඇසුරෙන් අර්ථාවබෝධය පිරික්සීම සඳහා සිසුන්ගෙන් අහඹු ලෙස ප්‍රශ්න කිහිපයක් අසන්න.
- පහත සඳහන් කරුණු මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • කියවීමේ ක්‍රම අතර නිශ්ශබ්ද ව කියවීම එක් ක්‍රමයක් බව<br>• අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කරමින් කියවිය යුතු බව<br>• නිශ්ශබ්ද ව කියවීමේ දී සිත එක අරමුණක පිහිටුවා ගෙන කියවිය යුතු බව<br>• විවේකය අර්ථවත් ව ගත කිරීමට හා විනෝදාස්වාදය ලැබීමට නිශ්ශබ්ද කියවීම සඳහා ළමා කතා කෙටිකතා ආදි පොතපත යොදා ගත හැකි බව |

(මිනිත්තු 10 යි.)

පියවර 3.2.2 :
- 3.2.2.2 හි සඳහන් පුවත්පත් විශේෂාංග ලිපිය හෝ පෙළපොතේ අදාළ පාඩම හෝ ලබා දෙන්න.
- එය නිශ්ශබ්ද ව කියවීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30 යි)

පියවර 3.2.3 :
- සපයන ලද පුවත්පත් විශේෂාංග ලිපියේ හෝ අදාළ පාඩමේ හෝ සඳහන් තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 25 යි.)

පියවර 3.2.4
- අනෙක් සිසුන් සමඟ පුවත්පත් විශේෂාංග ලිපියේ සඳහන් තොරතුරු සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • නිශ්ශබ්ද කියවීම සඳහා චිත්ත ඒකාග්‍රතාව අවශ්‍ය වන බව<br>• නිශ්ශබ්ද කියවීම නිතර නිතර පුරුදු පුහුණු කළ යුතු බව<br>• නිශ්ශබ්ද කියවීමට සඳහා සුදුසු ස්ථානයක් පිළියෙළ කරගත යුතු බව<br>• අවශ්‍ය කරුණු සලකුණු කර ගනිමින් නිශ්ශබ්ද ව කියවිය යුතු බව<br>• ළමා සිතුවිලි අවදි කරන ළමා ලෝකය පිළිබඳ ලියවුණු පොතපත කියවීමට යොමු විය යුතු බව |

(මිනිත්තු 15 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- නිශ්ශබ්ද ව කියවා අන්තර්ගතය ඉදිරිපත් කරයි.
- පොතපත සොයා ගෙන අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි.
- කියවීමෙන් විවේකය ඵලදායී ලෙස ගත කරයි.
- නිශ්ශබ්ද ව කියවා ලැබූ දැනුම අන්‍යයන් සමඟ බෙදා ගනියි.

ඇමුණුම 3.2.1.1

## ඔය කන නෙමෙයි මේ කන

ඈත පිටිසර ගම්වල හරි දස්ස දඩයක්කාරයො හිටියෙ. නොයෙක් නොයෙක් විදියෙ උප්පරවැට්ටි යොදල සත්තු අල්ලන්ඩ හරි දස්ස මිනිහෙක් හිටිය. මිනිහගෙ ගේ ඉස්සරහ තිබුණ කිතුල් ගහක්. ඒකේ කිතුල් මල කපල මිනිහ කිතුල් රා ටිකකුත් බීල ඉතුරු හරියෙන් හකුරු පැණි හදාගත්තා. හකුරු පැණි හදන්නෙ ගම මායිය තමයි. එයා හරි මනාපයි ඒ වැඩේට. මොකද ගෙදර පිරිමැහෙනව. ඒ වගේ ම නෑයන් බලන්න යන කොට කැත නැති ව කැවිලි ජාතිත් හදාගෙන යන්න පුළුවන් නේ. ඒ උන්දෑ තමුන්ගෙ මනුස්සය සතුන්ට ගිනි බිඳින එකට හැම තිස්සෙ ම හරහට කතා කළා. ඒ වුණාත් කිතුල් මල කපල රා බොන එකට විරුද්ධ ව වචනයක්වත් කිව්වෙ නැහැ. තමුන්ටත් වාසි නිසා.

එක දවසක් මිනිහ කිතුල් ගහට නැගල බලන කොට තෙලිජ්ජ හට්ටියෙන් බාගයක් ම අඩුයි. මල තව ම පරණත් නැති නිසා මිනිහට හරි ම පුදුමයි. ඒ වගේ ම දුකයි. මිනිහ කීවා කවුරු හරි හොරෙන් තෙලිජ්ජ ටික ගන්නවා ද දන්නෙ නැහැ. හොඳට සෝදිසියෙන් ඉඳපන් කියල මායියාට, ගෑනිත් ඉතින් හොඳට හොයල බලමින් වැඩ කළා. ඒත් හොරා අල්ලගන්න බැරිවුණා.

ඒ පාර ගෑනියි මිනිහයි මාරුවෙන් මාරුවට රෑ එළිවෙනකම් ඇහැරගෙන හිටිය හොරා අල්ල ගන්න. ඔන්න එතකොට අහුවුණා. හොරා, කවුද දන්නවා ද? කලවැද්දෙක් මිනිහට හරි ම කේන්තියි. මේ වැඩේට. කලවැදි මස් ටිකක් හොයලා දෙන්න කියල ගමේ කෙනෙක් කියලත් තිබුණා. ඒ හින්ද මිනිහ කල්පනා කළා. රෑට රැකලා ඉඳල කලවැද්ද ව මරාගන්න. මේ වැඩේට කොහොම හරි මායියවත් හවුල් කරගන්න ඕනේ. තෙලිජ්ජ හොරකම නවත්තගන්න නම් කොහොම හරි කලවැද්දා මරන්න ඕනේ. උඹ උදව් කරනවා නම් මම කලවැද්දා මරන්නම් කියලා මිනිහ ගෑනි ව කැමති කරගත්තා. ඒ කාලෙ තිබුණෙ බේත් කොටන තුවක්කු තමයි. බේත් කොටල පුරවපු තුවක්කුවට ගිනි පෙනෙල්ලක් එබුව ම තමයි පත්තු වෙන්නේ.

මිනිහ කිව්ව මම කලවැද්දා ආවම හොඳට එල්ලෙ බලල සූදානම් වෙන්නම්. උඹ මම කියපුවම ගිනි පෙනෙල්ල ඔබපන් කියල. දෙන්න දැන් තරමක් ඈතින් ගිනි ගොඩකුත් ගහල බලන් ඉන්නවා. මිනිහට නම් ඉතිං දඩයම් කරන්න ගියාම නිදිමත අහලකටවත් එන්නේ නැහැ. ගෑනිට නම් ඉතින් දැන් හොඳට ම නිදිමත එනවා. ගෑනි නිදි කිරා වැටෙනව. ඔන්න ඔය වෙලාවෙ කලවැද්ද එනව දැනෙනව මිනිහට, මිනිහ ඉක්මනට ගෑනිට කතා කරල සූදානම් වෙලා ඉන්න කිව්වා. ගෑනිත් ඉතින් ගිහින් ගිනිගොඩ පිඹල ගිනි පෙනෙල්ලත් අර ගෙන ආවා. මිනිහ හොඳට කුරුමානම අල්ලල ගෑනිට කිව්වා. හනිකට ඔය කනට ගිනි පෙනෙල්ල ඔබාපල්ලා කියල ගෑනි හොඳට ම නිදිමතේ හිටපු හින්ද කියපු දේ හීනෙන් වගේ ඇහුණේ. ගෑනි මොකද කළේ. ගිනි පෙනෙල්ල මිනිහගෙ කනේ එබුව.

මිනිහා වේදනාව උහුලාගෙන ඔය කනේ නෙමෙයි. මෙන්න මේ කනේ කිව්වා. ගෑනි ඒ පාර මිනිහගෙ අනිත් කනේ ගිනි පෙනෙල්ල එබුව. මිනිහට දැන් තරු විසි වෙනවා. ඒත් ඉතින් හිතට දහිරිය අරගෙන කියනවා. බොලං යෝදියේ මගේ කනේ නෙමෙයි මේ තුවක්කු කනේ කියල. එතකොටයි ගෑනිට තේරුණේ. මේ වෙන්නෙ මොකක්ද කියල. ගෑනි හනිකට ගිනි පෙනෙල්ල තුවක්කු කණේ එබුව. එතකොට ගිනි පෙනෙල්ල නිවෙන්නත් ඇවිල්ල. මේ දෙන්නගේ කසුකුසුව ඇහිල කලවැද්ද කලබල වෙලා පැනලා ගියා. තුවක්කුවෙ එල්ලෙ වැරදිලා වෙඩිල්ල වැදුණේ තෙලිජ්ජ මුට්ටියටයි. අනේ අපොයි තිබුණ බාගෙත් ඉවරයි. මගේ කන් දෙකත් ඉවරයි. කියල තරහෙ පුපුර පුපුරා ගෙදර ගියා ලු.

*(ජාතික අධ්‍යාපන ආයතනය විසින් ප්‍රකාශිත "ජනකතා 1" කෘතියෙන් උපුටා ගැනිණ.)*



Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඇමුණුම 3.2.2.2

පැවරුම

පොදු උපදෙස්

- ඔබ වෙත සපයා ඇති විශේෂාංග ලිපිය නිහඬ ව කියවන්න.
- එහි ඇතුළත් වැදගත් තොරතුරු අනුපිළිවෙළින් සටහන් කරන්න.
- ඒ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

විදේශිකයන් ලංකාවට භාවිත කළ නම්

පළින් පළ සුදු වලාවෙන් සැදි, සදා නිල් වන් අහස් කුසින් යුතු ලක් දිව, දඹදිව් ගෙලෙහි බැඳි මුතු හරෙහි තරළ මිණ බඳු රමණීය දිවයිනෙකි. ඒ වටා පිහිටි මහ සයුර අහස පිළිබිඹු කර දක්වන්නා සේ ය. හරිත වර්ණයෙන් ගැවසි, සදා වසත් සිරි ගත් මේ දිවයිනට සම කළ හැකි අන් රටවල් ලොවෙහි විරල යයි කිය හැකි ය.

ලිඛිත ඉතිහාසයෙනුත් ඔබ්බට යන අතීතයක් ඇති ලක් දිව පිළිබඳ ව නොයෙක් ජන ප්‍රවාද සහ වෘත්තාන්ත ගෙතී ඇත්තේ ය. එහි ලිඛිත ඉතිහාසය ක්‍රි.පූ. 6 වැනි සියවසේ පටන් අද දක්වා අඛණ්ඩ ව පවතී. ශිශිර කාලය ළඟා වෙද්දී හිමෙන් ගොඩබිම වැසී යත් ම ශීත ප්‍රදේශ කෙරෙන් පියාඹා එන පක්ෂීන් පරිද්දෙන් ග්‍රීසිය, රෝමය වැනි අපර දිග රාජ්‍යවලින් ද මිසරය, අරාබිය වැනි මැදපෙරදිග දේශවලින් ද ආසන්නයේ පිහිටි භාරතයෙන් සහ ඈත පෙරදිග චීනයෙන් ද, අතීතයේ පටන් ම දේශ සංචාරකයෝ ලක්දිවට ඇදී ආහ. සරතැසට පත් සංචාරකයන්ට ලක් දිව ඉතා සැපදායක පරිසරයක් ඇති ක්ෂේම භූමියක් වූයේ ය.

පැරණි ලෝකයේ ග්‍රීක සහ අරාබි වෙළෙඳ යාත්‍රා කරුවන් විසින් ලංකාව ස්වකීය පෙරදිග සංචාරවල දි ගොඩ බැසීමට සුදුසු ස්ථානයක් ලෙස සලකන ලද බව පෙනේ. මෙය යුදෙව් නරපතියකු වූ සොලමන් රජුට රන්, රිදී, ඇත් දත් සහ මොනරුන් සැපයූ ඕෆීර් සහ ටාශිෂ් ප්‍රදේශයේ කොටසක් ලෙස අතීතයේ දී සැලකුණේ ය. අශෝක ටැම් ලිපිවල තම්බපණ්ණි නමින් ද, ස්ට්‍රාබෝ, ප්ලිනි, ටොලමි ආදි පැරණි ග්‍රීකයන් සහ රෝමවරුන් විසින් ටැප්‍රොබේන් යන නමින් ද මේ දිවයින හැඳින්විණි. අරාබීන් මේ දිවයින සෙරන්ඩිබ් නැතහොත් සාරදිප් යන නමිනි. එය පළමු වරට අලහාබාද් ටැම් ලිපියේ දක්නට ලැබෙන සිංහලදීප යන නමින් භින්න වූවක් විය හැකි යි. පෘතුගීසින් මේ දිවයින හැඳින්වූ සිලාඕ යන නම සිංහල යන පදයෙන් භින්න වූවක් ලෙස සැලකිය හැකි ය. එහෙත් ලක් වැස්සන් විසින් දැන් හඳුන්වනු ලබන ලංකා යන නමින් අසල් වැසි ඉන්දියානුවෝ ලංකාව දැන සිටියෝ ය.

*(ලංකාවේ අධ්‍යාපනය - සියවස ප්‍රකාශනය -පූර්විකාව xxvii හා xxviii පිටු )*

නිපුණතාව 3.0 : ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම 3.3 : විවිධ ශෛලීන්ට අනුව කියවීමේ හුරුව ලබයි.

ක්‍රියාකාරකම : බණ කථා ශෛලියෙන් - කියවීම හුරු කරමු.

කාලය : මිනිත්තු 120 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 3.3.1.1 හි ඇතුළත් උද්ධෘතය
ඇමුණුම 3.3.2.1 හි ඇතුළත් පැවරුම
පෙළපොතෙහි සඳහන් ජාතක කථාව

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.3.1 :
- ඇමුණුම 3.3.1.1 හි ඇතුළත් ජාතක කථාව සම්පත් පුද්ගලයකු ලවා ශ්‍රැතිගෝචර ශෛලියෙන් කියවා සිසුන්ට අසන්නට සලස්වන්න.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක නිරතවන්න.
  - විවිධ ශෛලීන් අනුගමනය කරමින් කියවිය හැකි බව.
  - බණ කතා සාහිත්‍යයට අයත් ගද්‍ය සාහිත්‍ය කෘති ශ්‍රැතිගෝචර ශෛලියකින් කියවීමෙන් වැඩි රසයක් මතුවන බව
  - සම්භාව්‍ය ගද්‍ය කෘති කියවීමේ දී පාලි - සංස්කෘත මිශ්‍ර වචන කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බව
  - පැරණි සාහිත්‍ය කෘති බණ කතා ශෛලියෙන් කියවීමේ දී අසන්නාටද අන්තර්ගතය රසවත් ව අවබෝධ කර ගත හැකි බව

(මිනිත්තු 20 යි.)

පියවර 3.2.2 :
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- 3.3.2.2 පැවරුම් පත්‍රිකා එම කණ්ඩායම් අතරේ බෙදා දෙන්න.
- කණ්ඩායමේ සියලු ම සිසුන්ට එය කියවීම සඳහා පුහුණු වීමට අවස්ථාව දෙන්න.
- අවශ්‍ය තැන්හි දී නිසි උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 20 යි)

පියවර 3.3.3 :
- පෙළපොතේ ජාතක කථාව ශ්‍රැතිගෝචර ශෛලියෙන් කියවීමට එක් එක් කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 60 යි)

පියවර 3.3.4
- ඒ ඒ කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ සලස්වන්න.

- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.
  - පුරාතන ගද්‍ය සාහිත්‍ය කෘති කියවීමේ දී බණ කතා ශෛලිය යොදා ගැනීම උචිත බව
  - ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවීම රස ජනනයට ඉවහල් වන බව
  - බණ කතා ශෛලියට අනුව කියවීමෙන් කතා රසය ඉස්මතු වන බව ශ්‍රද්ධා භක්තිය වඩවන බව

(මිනිත්තු 20 යි)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- කියවීමේ විවිධ ශෛලීන් විස්තර කරයි.
- සම්භාව්‍ය ගද්‍ය කෘති ශ්‍රැතිගෝචර ශෛලියෙන් කියවයි.
- සම්භාව්‍ය ගද්‍ය කෘති කියවීමෙන් විවේකය අර්ථවත් ලෙස ගත කරයි.
- සම්භාව්‍ය ගද්‍ය කෘති කියවීමේ වැදගත්කම පිළිබඳ ව අන්‍යයන් සමඟ කතාබහ කරයි.

ඇමුණුම 3.3.1.1

## කාලිංග බෝධි ජාතකය

යටගිය දවස කලිඟුරට දන්තපුර නුවර කලිඟු නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍ය කරන්නාහු ය. ඒ රජ්ජුරුවන්ගේ මහා කාලිංගය චුල්ලකාලිංග යයි පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. ඔවුන් අතුරෙන් ප්‍රධාන පුත්‍ර වූ රාජකුමාරයන් විසින් පිය රජ්ජුරුවන් ඇවෑමෙන් රාජ්‍යය කෙරෙතියි නිමිති පාඨකයෝ කීහ. මල් වූ කාලිංග කුමාරයෝ ඍෂි ප්‍රවජ්‍යාවෙන් පැවිදි ව භික්ෂාටනයෙන් ජීවත් වෙති. උන්ගේ පුතණුවෝ කාලිංග චක්‍රවර්ති රාජ්‍යය කෙරෙති කීහ. මෑත භාගයෙහි වැඩිමහලු පුතණුවෝ පියාණන්ගේ ඇවෑමෙන් රාජ්‍යයට පැමිණියාහ. මලණුවෝ යුවරජ තනතුරට පැමිණියාහ. යුවරජ්ජුරුවෝ සිතන්නාහු මාගේ පුතණුවෝ චක්‍රවර්ති රාජ්‍යයට පැමිණෙත්වයි කියා පුතණුවන් නිසා මන් කළහ. රජ්ජුරුවෝ උන්ගේ ඉසුරු සහනය කොට ගත නොහී සුළු කාලිංග කුමරුවන් අල්වා ගෙනෙවයි වැඩෙහි හැසිරෙන්නා වූ එක් අමාත්‍යයෙක් හට නියෝග කළාහ. ඒ අමාත්‍යයා ගොස් යුව රජ්ජුරුවන්ට කියන්නේ කුමාරයන් වහන්ස, රජ්ජුරුවන් වහන්සේ නුඹ වහන්සේ අල්වනු කැමති සේක. නුඹ වහන්සේගේ ජීවිතය රැකගත මැනවැයි කීහ. ඒ රාජකුමාරයෝ තමන්ගේ පේරැස් මුන්දත් සියුම් වූ පලසත් මඟුල් කඩුවත් තුන ම වැඩෙහි හැසිරෙන්නා වූ අමාත්‍යයන් හට දක්වා මේ සංඥාවෙන් මාගේ පුතණුවන්ට රාජ්‍යය පාවා දෙවයි කියා වලට වැද සිත්කලු වූ භූමි ප්‍රදේශයක්හි පන්සලක් කොට ගෙන තවුස් පැවිද්දෙන් පැවිදි ව ගංතෙර වාසය කළාහ. මදුරට සාගල් නුවර මදු රජ්ජුරුවන්ගේ දියණි කෙනෙක් වූය. ඒ කුමාරිකාවන්ගේ ලක්ෂණ බලා නිමිත්ත පාඨකයෝ කියන්නාහු මේ කුමාරිකාවන් වහන්සේ පැවිදි ව සිඟා ජීවත් වන සේක. මුන්වහන්සේ බඩ උපන් කුමාරයෝ චක්‍රවර්ති රාජ්‍යයට පැමිණෙන සේකැයි කීහ.

ඇමුණුම 3.3.2.1

### පැවරුම

පොදු උපදෙස් -

- ඔබ කණ්ඩායමට ලැබුණු ගද්‍ය කොටස හොඳින් කියවන්න.
- කණ්ඩායමේ සියලු සාමාජිකයන් එක් එක් ඡේදය වෙන් කර ගන්න.
- ශ්‍රැතිගෝචර ශෛලියෙන් කියවීමට පුහුණු වන්න

නිපුණතාව 3.0 : ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම 3.4 : පොතපත කියවීමෙන් ස්මරණය කරගත් කරුණු සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම : කියවමු ; කතා සාරය ගොඩනගමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 3.4.1.1 හි ඇතුළත් උද්ධෘතය
ඇමුණුම 3.4.2.1. හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :

පියවර 3.4.1 :

- ඇමුණුමේ සඳහන් ළමා කතාව කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කතාව කියවීමෙන් පසු සිසුන්ගේ ස්මරණ ශක්තිය විමසීමට ප්‍රශ්න කිහිපයක් අසන්න.
- පන්තියේ සිසුන් අතුරෙන් අහඹු ලෙස තෝරා ගත් සිසුන් කිහිපදෙනෙකුට කතාව මතකයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • පොතපත කියවීමේ දී අවධානයෙන් කථාව කියවිය යුතු බව<br>• එහි සඳහන් වැදගත් සිද්ධි හා අවස්ථා මතකයේ තබා ගත යුතු බව<br>• එම අවස්ථා අනුපිළිවෙළට සකස් කරමින් කතා සාරය ගොඩනැගිය යුතු බව<br>• කිය වූ දේ හොඳින් මතක තබා ගත යුතු බව<br>• උද්ධෘත පාඨ ආදිය මතක තබා ගනිමින් කියවිය යුතු බව |

(මිනිත්තු 10 යි.)

පියවර 3.4.2 :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- පෙළපොතේ සුදුසු පාඩම් කිහිපයක් හෝ එක් පාඩමක් තෝරා සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- ඇමුණුම 3.4.2.1 හි ඇතුළත් පැවරුම සිසුන්ට ලබා දී පැවරුමෙහි නිරත කරවන්න

(මිනිත්තු 30 යි)

පියවර 3.4.3 :

- පැවරුම් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30 යි)

පියවර 3.4.4 :

- පහත සඳහන් කරුණු ද මතු කරමින් ප්‍රතිපෝෂණ ලබා දෙමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- කියවීමෙන් පසු වැදගත් කරුණු සටහන් කර තබා ගැනීමෙන් මතකය අවදි කර ගත හැකි බව.
- ළමා කතා කියවා එහි කතා සාරය ගොඩනැගීමේ හැකියාව වර්ධනය කළ යුතු ගුණාංගයක් බව.
- කතා සාරය වුව ද රසවත් ව ඉදිරිපත් කළ යුතු බව

(මිනිත්තු 10 යි)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- අවබෝධයෙන් හා අවධානයෙන් යුතු ව පොතපත කියවීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- කියවන ලද කථාවක් නැවත මතකයෙන් ඉදිරිපත් කරයි.
- විවිධ කථා ඇතුළත් පොතපත කියවයි.
- කතාවක් කියවීමෙන් පසු ලැබූ දැනුම අන්‍යයන් සමඟ බෙදා හදා ගනියි.

ඇමුණුම 3.4.1.1

## "ජම්බුක" නම් නරිහාමි

මේ කතාව නරියෙකුගේත් සිංහයකුගේත් කතාවක්.

ඒ වුණාට හැම නරියා ම මෙහෙම ය කියා වත් හැම සිංහයා ම මෙහෙමය කියා වත් අප සිතන්නට ඕනෑ නැහැ.

"ජම්බුක" නමැති නරිහාමිට තමා කවුරු ද කියා අමතක වීම නිසයි මේ කතාව ඇති වුණේ.

මේ කතාවේ සිංහයා හුඟක් ම නපුරු නැති සිංහයෙක්.

"ජම්බුක" නමැති නරිහාමිත් තම ජීවිතයේ මුල් කාලයේ දී තමන් නරියකු බව අනිත් නරිහාමිලා වාගේ දැන ගෙන හිටිය කෙනෙක්.

සමහර දවස්වල නරිහාමිට කෑමට යමක් සොයා ගැනීම බොහෝ ම දුෂ්කර වුණා. ඒ වැනි එක් දවසක දී වනාන්තරයේ වෙනදා නොගිය බොහෝ ම ඈත දිහාවකට ගියේ දවාලට කන්න දෙයක් හොයා ගන්නයි. එසේ යන අතර තමාට ප්‍රිය මොනවා හෝ කෑම තියෙන පැත්තක් ඉව වැටුණා.

ඉව දැනෙන පැත්තේ ඈත මෑත බලන කොට අන්න! ගල් තලාවකට ටිකක් එහා! ගිල දමන්නට සුදුසු මස් කෑලි! සූප්පු කරන්නට සුදුසු ඇට කටු!

ගල් තලාව පහු කරගෙන යන්න හදන කොට ම මෙන්න ගල් තලාවේ භයානක දර්ශනයක්! වැතිරිලා සිටින සිංහයෙක්!

සිංහයා සිංහයකු බවත් තමන් නරියකු බවත් දැන ගෙන හිටිය නරිහාමිගේ සිතට තද බයක් ඇති වුණා. සිතට ඇති වුණු බය ගතටත් පැතිරුණා.

නරිහාමිගේ බිය පත් හැසිරීම දුටු සිංහයාට මතක් වුණේ තමාට සේවකයකු අවශ්‍ය බව යි. මස් කෑලිවලින්, මස් ඇටකටුවලින්, හම් කෑලිවලින් අපවිත්‍ර වෙච්ච තියෙන පරිසරය පවිත්‍රකරවා ගන්නට සේවකයකු අවශ්‍ය යි. සිංහයා නරිහාමිට කතා කළේ ඒ අවශ්‍යතාව ඉෂ්ට කර ගන්න යි.

" නරිහාමි කෙනෙක් නේද මේ? "

"එහෙමයි සිංහයාණන් වහන්ස"

" බැහැරක් ද මේ යන්නෙ "

" හාන්දුරුවනේ මම මේ ජීවත් වෙන්න විදිහක් හොයා ගෙන යන ගමන් "

" තමුන්ගෙ නම? "

" හාන්දුරුවනේ, මගේ නම ජම්බුක "

" ජම්බුක? "

" එහෙමයි හාන්දුරුවනේ "

" මගෙ උදව්වට මෙහෙ නවතින්න ජම්බුක කැමැති ද? මගේ සේවෙට හිටියා ම කෑම හිගයක් වෙන්නෙ නැහැ. මේ ඉස්තානෙ සුද්ධ පවිත්‍ර කර ගෙන, බලා කියා ගෙන ඉන්න එකයි "

ජම්බුක නම් නරිහාමිට මේ තරම් සතුටුදායක යෝජනාවක් තම ජීවිත කාලේ දී ඉදිරිපත් වුණු මුල් ම අවස්ථාවයි මේ.

" මට බැහැ" කියන්න කිසි ම හේතුවක් තිබුණේ නැහැ. " මම ඉන්නං සිංහයාණන් වහන්ස " කියන්න මිසක.

සිංහයාගේ ගල් තලාවට කිට්ටුවෙන් ම ඊට පුංචි ගල් තලාවක් ජම්බුක නම් නරිහාමිට සැපසේ විවේක ගැනීම සඳහා ලැබුණා. සිංහයාගේ ආදරය, කරුණාව ලැබුණා.

මුව මස් මේ සිංහයාගේ ඉතා ම ප්‍රියජනක ආහාරය යි. සිංහයා දඩයම් කරගෙන ඇද ගෙන එන මුවන්ගෙන් සෑහෙන මස් ප්‍රමාණයක් ජම්බුක නම් නරිහාමිට ඉතුරු වුණා.

සිංහයාගේ දිනපතා චරියාවත් මේ කාලය තුළ දී අපේ මේ නරිහාමිගේ සිතේ සටහන් වුණා. මේ දින චරියාවේ එක අවස්ථාවකට හවුල් වෙන්නත් නරිහාමිට සිදු වුණා.

උදේ ම සිංහයා දින චරියාව අරඹන්නේ තමාගේ ගල් තලාවත් ජම්බුක නම් නරිහාමිගේ ගල් තලාවත් ඇතුළත් ප්‍රදේශයේ තේජවන්ත ව හැසිරීමෙන්.

දඩයමට යා යුතු වේලාව ආ විට තමාගේ වාසස්ථාන සීමාවත් ඉන් පිටතත් අතර හරියට එයි.

ඒ හරියේ නැවතී සතර දිසාව බලයි.

ජම්බුක නම් නරිහාමි සම්බන්ධ වන්නේ මේ අවස්ථාවටයි. නරිහාමි මේ අවස්ථාවේ දී " අපේ සිංහ රාජයාට ජය ශ්‍රී " කියා කෑගැසිය යුතු වෙයි.

ඊළඟට සිංහයා තුන් වරක් සිංහ නාද කරයි. ඒ සිංහ නාද තුන ඇසෙන මානයේ සිව්පා සතුන්ට ප්‍රාණ භයෙන් වෙව්ලන්නේ නැති ව සිටින්ට බැරි වෙයි.

සිංහ නාද තුනෙන් පසු සිංහයා වනාන්තරයේ මොන පැත්තට හෝ යයි. ආපසු එන්නේ මස් පිරුණු මුව දඩයමක් ඩැහැගෙන. එහෙම නැත්නම් තමන් මුව මස් කා ජම්බුකගේ කොටස අරගෙනයි

ඔයාකාරයෙන් සිංහයා වගේ ම අපේ නරිහාමිත් පෝෂණය වුණේ මුව මස්වලින්.

ජම්බුක වෙහෙස මහන්සි නොවී කොතරම් පෝෂණය වුණා ද කියතොත් 'ඔහු දකින සෙසු සතුන්ට මේ සතා නරියෙක් යැයි සිතා ගන්ටත් බැරි තරම් වුණා! ඒ වුණාට තමාගේ පෙනුමේ වෙනස ජම්බුක දැන සිටියේ නැහැ. දැනගත්තේ සෑහෙන කාලයකට පස්සෙයි. අහම්බෙන් වාගෙයි. තමන් වතුර බොන්නට යන ජලාශයකට වෙනත් සතුන් නො ආ වෙලාවක නොකැළඹුණු පැහැදිලි ජලයට තම ඡායාව වැටී තිබෙනවා දුටු විට යි. ජම්බුකගේ හිතේ ඒ වෙලේ ඇති වුණේ හරිම ආඩම්බරයක්. තමාගේ ඡායාව අමතා මෙහෙම කතා කළේ ඒ ආඩම්බරයෙන්:

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ජම්බුක එදා ඒ ජලාශය ළඟින් පිටත් වුණේ සිංහයකුට සැතපෙන්නට සුදුසු ප්‍රමාණයේ ගල් තලාවක් සොයා ගෙනයි. ඈත වනාන්තරයේ හැසිරෙන විට එවැනි ගල්තලාවක් හමුවෙයි. ජම්බුක එදා රෑ ගල් තලාවේ ලැගුම් ගනී. සිතට ගත් සිංහ තේජසින් යුතු ව පසුදා උදයේ මේ පරිසරයේ සැරිසරයි. දවල් දඩයමට යා යුතු වේලාව පැමිණි විට තම අඩවියේ මායිමට එයි. ඊළඟ අංකය සිංහ නාද තුනක් කිරීම වුවත් ජම්බුක නැගූ නාද තුන සිංහ නාද තුනක් වුණේ නැහැ. ඒ නාද තුන ඇසූ සතුන් අතර කථා බහක් පැතුරුණේ "පිස්සු නරියකුගේ කෑගැහිල්ලක් ඇහුණා නේද?" " කෑගැහිල්ල ඇහුනේ පිස්සු නරියකුගේ නේද? " ආදී වශයෙන්. ජම්බුක නම් නරිහාමිට කිසිම මුව දඩයමක් කර ගන්නට පුළුවන් වුණේ නැහැ.

සිංහයාගේ සේවයට පත්වෙන්නට කලින් ගත කරපු දුෂ්කර ජීවිතයට ම එදායින් පසු ජම්බුක නැවතත් පත් වුණා.

ඔයාකාරයෙන් ජම්බුකට අත් වූ ඉරණම ගැන අපට සතුටු වෙන්නට බැහැ. මේ වුණාට ජම්බුකගේ කතාව අප මතක තබා ගත යුතු කතාවක්.

*බටගහට කී රහස - සිරිලාල් කොඩිකාර*

ඇමුණුම 3.4.2.1

පැවරුම

පොදු උපදෙස්

- ඔබ කණ්ඩායමට ලැබුණු උද්ධෘතය කියවන්න.
- එහි ප්‍රධාන කරුණු සටහන් කර ගන්න.
- කණ්ඩායමේ සියලු දෙනා එක් ව ඉදිරිපත් කිරීම සඳහා එක් එක් කොටස් බෙදා ගන්න.
- කණ්ඩායමේ සියලු දෙනාගේ සහභාගිත්වයෙන් කතාවේ සාරය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

නිපුණතාව 4.0 : අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයෙහි යෙදෙයි.

නිපුණතා මට්ටම 4.1 : උචිත පරිදි කරුණු සංවිධානය කරමින් අදහස් තර්කානුකූල ව ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම : අපි රචනාවක් ලියමු.

කාලය : මිනිත්තු 120 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 4.1.2.1 ට ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.1.1 :

- තෝරාගත් මාතෘකාවකට අනුව රචනාවක ආරම්භක ඡේදයේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව දෙන්න
- සිසුන් විසින් ලියන ලද ඡේදය ඇසුරු කරගනිමින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සිසුන් සමඟ සංවාදයක යෙදෙන්න.

> - රචනාවක දී කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කළ යුතු බව.
> - කියවීමෙන් අසා දැන ගැනීමෙන් හා සාකච්ඡා කිරීමෙන් රචනාවකට අවශ්‍ය කරුණු පහසුවෙන් ගොනු කර ගැනීමට හැකි වන බව.
> - රචනාවක දී සරල හා කෙටි වාක්‍ය භාවිත කිරීමෙන් පහසුවෙන් අදහස් සන්නිවේදනය කළ හැකි බව.
> - රචනාවක ශිල්පීය දක්ෂතා පිළිබඳ සැලකිලිමත් විය යුතු බව.

(මිනිත්තු 20 යි.)

පියවර 4.1.2 :

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 4.1.2.1 ට අනුව රචනා මාතෘකා හෝ ඔබ විසින් සකස් කර ගත් රචනා මාතෘකා හෝ කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- මාතෘකාව පිළිබඳ ව කණ්ඩායම තුළ සාකච්ඡා කිරීමට අවස්ථාව සලස්වා දෙන්න.
- නිර්මාණාත්මක ව සහ ප්‍රමාණාත්මක ව රචනය තනි තනි ව ලිවීම සඳහා උපදෙස් ලබාදෙන්න.
- එය වචන 150 කට නො අඩු වන සේ ලිවිය යුතු බව අවධාරණය කරන්න.
- සිසුන් පැවරුමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 60 යි.)

පියවර 4.1.3 :

- කණ්ඩායමකින් එක් රචනයක් බැගින් පන්තිය ඉදිරියේ දී කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 4.1.4 :

- සිසුන් විසින් කියවන ලද රචනා පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙමින් සාකච්ඡාවකට යොමුවන්න.
- එහි දී ඉදිරිපත්වන කරුණු ද පාදක කරගෙන පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

- රචනාවක නිර්මාණාත්මක බවක් තිබිය යුතු බව
- මාතෘකාවට අදාළ ව කරුණු ඉදිරිපත් කළ යුතු බව
- රචනාවක් ලිවීමේ දී ශිල්පීය ක්‍රම අනුගමනය කළ යුතු බව (උක්ත ආඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම, විරාම ලකුණු යෙදීම)
- ලේඛන කුසලතා දියුණු කර ගැනීම සඳහා නිරන්තරයෙන් රචනා ලිවීමේ නිරත විය යුතු බව
- පැහැදිලි අත් අකුරු කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතු බව
- ඉදිරිපත් කරන කරුණු පිළිබඳ සැලකිලිමත් වෙමින් ඡේද වෙන් කළ යුතු බව

(මිනිත්තු 10යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- වාක්‍ය රචනයක ව්‍යුහය පැහැදිලි කරයි.
- සාරවත් වාක්‍ය රචනා ලියයි.
- මුද්‍රිත මාධ්‍ය සඳහා රචනා යොමු කරයි.
- හොඳ රචනාවක ලක්ෂණ අනෙක් අය සමග සාකච්ඡා කරයි.

ඇමුණුම 4.1.2.1

පැවරුම

පොදු උපදෙස්

- පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරා ගන්න..
- ඔබ කණ්ඩායම තෝරා ගත් මාතෘකාවලට අදාළ ව අනෙකුත් සාමාජිකයන් හා සාකච්ඡා කර රචනා සැකිල්ල සකස් කර ගන්න.
- ඔබ තෝරාගත් මාතෘකාවට අදාළ ව රචනාවක් තනි ව ලියන්න.

රචනා මාතෘකා

1 වෙසක් දා අපේ මල් දන්සල
2 අසිරිමත් ගම් පියස
3 නත්තලේ අසිරිය
4 මා වෛද්‍යවරයකු වුවහොත්

නිපුණතාව 4.0 : අදහස් නිරවුල් ව හා නිවැරදි ව ඉදිරිපත් කරමින් ලේඛන කාර්යයෙහි යෙදෙයි.

නිපුණතා මට්ටම 4.2 : ශිල්පීය දක්ෂතා අනුගමනය කරමින් ලියයි.

ක්‍රියාකාරකම : ලේඛනයේ දී විරාම ලකුණු නිවැරදි ව යොදමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 4.2.2.1 ට ඇතුළත් පැවරුම.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 4.2.1 :
- විරාම ලක්ෂණ ඇතුළත් පුවරුවක් ප්‍රදර්ශනය කර ඒ පිළිබඳ විමසමින් සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කරන්න.

> • හර්ෂාදි ලකුණ ( ! )
> • විස්මය, කෝපය, ප්‍රීතිය ඇඟවීමේ දී හර්ෂාදි ලකුණ යෙදෙන බව ( !)
> i. විස්මය - අනේ! අහස ගුගුරන තරම්!
> ii. කෝපය - පුළුවන්නම් ගහපන්!
> iii. ප්‍රීතිය - අහා! හරිම සුන්දර රාත්‍රියක්
> • තිත් කොමාව ( ; )
> • ඒක කර්තෘක අන්තර් වාක්‍ය කීපයක් එකිනෙක වෙන් කිරීමේ දී තිත් කොමාව යෙදෙන බව. ( ; )
> ශිෂ්‍යයා දක්ෂය; අවංකය; කීකරුය; ක්‍රියාශීලීය.
> • ඇල ඉර ( / )
> • කිහිපයක් අතුරෙන් එකක් තෝරා ගැනීම සඳහා ඇල ඉර යෙදෙන බව ( / )
> උදාහරණ ඃ පෙති/ කරල්, උදේ/හවස
> • කෙටි ඉර ( - )
> • එක ළඟ යෙදෙන පදවල ඒවායේ සම්බන්ධය දැක්වීමේ දී
> ශ්‍රව්‍ය-දෘශ්‍ය
> බසය, කොළඹ - අනුරාධපුරය දක්වා ධාවනය කෙරේ.
> කාලච්ඡේද ආදිය ඉලක්කමෙන් දැක්වීමේ දී
> පෙ.ව. 8.00-10.00
> උදේ 8 - 10 දක්වා විදුලිය විසන්ධි කෙරේ.
> ආදි අවස්ථාවල කෙටි ඉර යෙදෙන බව
>
> (විරාම ලක්ෂණ පිළිබඳ වැඩිදුර අධ්‍යයනයට සිංහල ලේඛන රීතිය කෘතිය බලන්න.)

(මිනිත්තු 10 යි.)

පියවර 4.2.2:
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 4.2.2.1 හි ඇතුළත් පැවරුම සිසුන් වෙත ලබා දෙන්න
- සිසුන් පැවරුමේ නිරත කරවන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 4.2.3 : • එක් එක් කණ්ඩායම් මගින් කරන ලද ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 4.2.4 : • සිසුන් ඉදිරිපත් කළ වාක්‍ය නිර්මාණ පිළිබඳ ව ඔවුන්ට අදහස් දැක්වීමට ඉඩ සලසන්න.

• පහත කරුණු ද සලකමින් සමාලෝචනයක යෙදෙන්න.

- විරාම ලක්ෂණ උචිත ලෙස යෙදීමෙන් සන්නිවේදනය නිරවුල් වන බව
- නිසි ලෙස විරාම ලක්ෂණ භාවිත කිරීමෙන් ලේඛන කාර්යය වඩාත් නිවැරදි කර ගත හැකි බව
- භාව ප්‍රකාශනය සඳහා ඇතැම් විරාම ලක්ෂණ යොදාගන්නා බව
- නිවැරදි ලෙස විරාම ලක්ෂණ යෙදීම භාෂා දැනුම ප්‍රකට කරන ලක්ෂණයක් බව

(මිනිත්තු 10 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක

- සිංහල භාෂාවේ යෙදෙන විවිධ විරාම ලක්ෂණ නම් කරයි.
- විරාම ලක්ෂණ නිවැරදි ව යොදමින් වාක්‍ය නිර්මාණය කරයි.
- ලේඛනයේ දී විරාම ලක්ෂණ නිවැරැදි ව යොදයි.
- ලේඛන කාර්යයේ යෙදෙන විට විරාම ලක්ෂණවල නිවැරදි භාවිතය පිළිබඳ ව අන්‍යයන් සමඟ සාකච්ඡා කරයි.

ඇමුණුම 4.2.2.1

## පැවරුම

• පහත සඳහන් විරාම ලකුණු යොදා වාක්‍ය පහ බැගින් ලියන්න.

1 හර්ෂාදි ලකුණ
2 තිත් කොමාව
3 කෙටි ඉර
4 ඇල ඉර

නිපුණතාව 5.0 : භාෂා ක්‍රියාකාරකම් මගින් වාංමාලාව පෝෂණය කරගෙන භාෂාමය කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 5.1 : විශේෂ භාෂා ප්‍රයෝග භාෂා කාර්යයන් සඳහා අර්ථවත් ලෙස යොදා ගනියි.

ක්‍රියාකාරකම : යුගල පද භාවිතයෙන් බස රසවත් කර ගනිමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 5.1.1.1 හි ඇතුළත් ඡේදය
- ඇමුණුම 5.1.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.1.1 :
- ඇමුණුම 5.1.1.1 හි සඳහන් හිස්තැන් සහිත ඡේදය පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- දී ඇති යුගල පද අතුරින් හිස්තැනට සුදුසු පද සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සංවාදයක යෙදෙන්න.

> - යුගල පදවල විවිධ ප්‍රභේද ඇති බව
>   - සමානාර්ථවාචී යුගල පද
>     උදා : හැළිවළං/ බණදහම්
>   - විරුද්ධාර්ථවාචී යුගල පද
>     උදා : සිරිත්විරිත්/ යාම්ඊම්/ ගනුදෙනු
>   - ආසන්න රූපී පද සහිත යුගල පද ඇති බව
>     උදා : චටපට/ ඉඩම්කඩම්/ අඩුමකුඩුම
> - යුගල පද භාෂාව අලංකාර කරන සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් බව

(මිනිත්තු 10 යි.)

පියවර 5.1.2 :
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- 5.1.2.1 හි සඳහන් පැවරුම කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- සිසුන් පැවරුමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 5.1.3 :
- එක් එක් කණ්ඩායම්වල නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 5.1.4 :
- සෙසු කණ්ඩායම්වල නිර්මාණ පිළිබඳ ව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- සියලු ම නිර්මාණයන් පිළිබඳ අවධානය යොමු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - යුගල පද සකස් වී ඇති ආකාරය පිළිබඳ ව තව දුරටත් අවධානය යොමු කළ යුතු බව.
> - කථන ව්‍යවහාරයේ දී හා ලේඛන ව්‍යවහාරයේ දී බස රසවත් ව හා නිර්මාණාත්මක ව හැසිරවීමට යුගල පද අවශ්‍යවන බව
> - යුගල පද භාවිතයෙන් ලේඛනයේ වියත් බව ප්‍රකට කරවන බව
> - යුගල පද මඟින් භාෂා ව්‍යක්තභාවය ප්‍රකාශ වන බව

(මිනිත්තු 10 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක ඃ

- යුගල පද සකස් වී ඇති අයුරු විස්තර කරයි.
- යුගල පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- භාෂාමය කාර්යයන් අර්ථවත් කර ගැනීම සඳහා යුගල පද භාවිත කරයි.
- අන්‍යයන් හා කතාබහේ දී යම් යම් දේ ගැන අවධාරණයෙන් ප්‍රකාශ කිරීම සඳහා යුගල පද භාවිත කරයි.

ඇමුණුම 5.1.1.1

පිපී හිනැහෙන එරබදු මල් යායත්, කොවුලාගේ කොහෝ නාදයත්, අවුරුදු උදාානය අපට හඟවයි.

ඒ පණිවිඩයත් සමග ම සෑම .................................. ම .................................. වෙයි. .................................. .................................. රැගත් කත්කාරයෝ ගමට පැමිණෙති. අලුත් .................................. .................................. තෝරා ගැනීමෙන් ළමා සිත් ප්‍රබෝධවත් වෙයි. පාසල් නිවාඩු කාලය එළඹුණු බැවින් ළමයි සතුටින් .................................. කරති. .................................. සුවඳින් .................................. ඇළලෙයි. .................................."චට - පට .................................. .................................. .................................. .................................. කියාලා රතිඤ්ඤා පුපුරවති .................................. ලක්වැසියෝ .................................. අමතක කොට එකම ශුභ මුහුර්තියකින් අවුරුදු .................................. උත්කර්ෂවත් අයුරින් සමරති.

- හිස්තැනට යෙදෙන යුගල පද

| | | |
|---|---|---|
| 1. ගේදොරක් | 6. වටපිටාව | 10. කොල්ලෝකුරුට්ටෝ |
| 2. කළඑළි | 7. වට්ටිපෙට්ටි | 11. ඩොංපටෝරියං |
| 3. කැවුම්කොකිස් | 8. කෙළිසෙල්ලම් | 12. චූස්බූස් |
| 4. හැළිවළං | 9. ඇඳුම්පැළඳුම් | 13. නොහොඳනෝක්කාඩු |
| 5. සිරිත්විරිත් | | |

ඇමුණුම 5.1.2.1

පැවරුම

පොදු උපදෙස්

- පහත දී ඇති යුගල පද වර්ග කර දක්වන්න. (සමානාර්ථවාචී, විරුද්ධාර්ථ වාචී, අර්ථ විරහිත අසන්න රූපී)
- එම යුගල පද යොදා වාක්‍යයක් බැගින් ලියන්න.

| | | |
|---|---|---|
| රැවුම්ගෙරවුම් | උස්මිටි | දඩමුඩ |
| ඉහළපහළ | ගොඩමඩ | ඉණඉහ |
| ජයපරාජය | මැහුම්ගෙතුම් | ඉඩකඩම් |
| අතමිට | උසුළුවිසුළු | රණ්ඩුසරුවල් |
| නඩුහබ | රෙදිපිළි | ගුටිබැට |
| කසුකුසු | යනඑන | |
| ඇනුම්බැනුම් | | |

නිපුණතාව 5.0 : භාෂා ක්‍රියාකාරකම් මගින් වාංමාලාව පෝෂණය කරගෙන භාෂාමය කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 5.2 : භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනාගනිමින් සන්නිවේදනය පහසු කර ගනියි.

ක්‍රියාකාරකම : ප්‍රාදේශීය ව්‍යවහාර හඳුනා ගනිමු.

කාලය : මිනිත්තු 120 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 5.2.1.1 හි ඇතුළත් සංවාදය
ඇමුණුම 5.2.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 5.2.1 :
- ඇමුණුම 5.2.1.1 හි සංවාදය හෝ ප්‍රාදේශීය ව්‍යවහාර ඇතුළත් වෙනත් සංවාදයකට හෝ සවන්දීමට සලස්වන්න.
(ශ්‍රව්‍ය පටයක් මගින් හෝ වෙනත් ක්‍රමයකට)
- ඒ ඇසුරෙන් පහත සඳහන් කරුණු ද මතුකරමින් සිසුන් සමඟ සාකච්ඡාවක නිරතවන්න.

| |
|---|
| • ප්‍රාදේශීය වශයෙන් සිංහල ව්‍යවහාරයේ වෙනස්කම් පවතින බව<br>• දකුණු පළාත, උඩරට, නුවරකලාවිය, ඌව, දිගාමඩුල්ල ආදී ප්‍රදේශවල ඒ ඒ ප්‍රදේශවලට ආවේණික ව භාෂා ව්‍යවහාරයේ වෙනස්කම් පවතින බව<br>• භූගෝලීය පිහිටීම, විවිධ වෘත්තීන් ආදිය මෙම වෙනස්කම්වලට හේතු වී ඇති බව<br>• එකම භාෂාවක ප්‍රාදේශීය වශයෙන් ඇති මෙම වෙනස්කම් හඳුනා ගැනීම ඒ ඒ පළාත්වල ජනතාව සමඟ කරන සන්නිවේදන කටයුතුවලට පහසුවක් වන බව |

(මිනිත්තු 15 යි.)

පියවර 5.2.2 :
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 5.2.2.1 හි ඇතුළත් පැවරුම ලබාදෙන්න.
- පැවරුම සඳහා පෙළපොතේ අදාළ පාඩම (ප්‍රාදේශීය ව්‍යවහාර ඇතුළත්) තෝරාගන්න.
- සිසුන් පැවරුමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 50 යි.)

පියවර 5.2.3 :
- සිසුන්ගේ පැවරුම් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබාදෙන්න.

(මිනිත්තු 40 යි.)

පියවර 5.2.4 :
- ඉදිරිපත් කිරීම් පිළිබඳ අදහස් දැක්වීම සඳහා අදාළ කණ්ඩායමේ සාමාජිකයන්ටත් අනෙක් කණ්ඩායම්වලටත් අවස්ථාව සලසන්න.
- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් හා මතු සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • එක් එක් ප්‍රදේශවල ජනතාවගේ සිතුම් පැතුම් චාරිත්‍ර වාරිත්‍ර ආදිය එම ප්‍රදේශවල භාවිත වන භාෂාව මගින් පිළිබිඹු වන බව<br>• විවිධ ලේඛකයින්ගේ නිර්මාණවලින් ප්‍රාදේශීය ව්‍යවහාර ලක්ෂණ හඳුනා ගත හැකි වන බව<br>• ප්‍රාදේශීය ව්‍යවහාර මඟින් වාං මාලාව පෝෂණය කර ගැනීමටත් ඒවා විවිධ භාෂාමය කාර්යයන්හි දී උචිත පරිදි භාවිතයටත් එම ව්‍යවහාර ඇතුළත් පොතපත හා නිර්මාණ නිරන්තරයෙන් පරිශීලනය කළ යුතු බව |

(මිනිත්තු 15 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක ඃ

- සිංහල භාෂාවේ කථා ව්‍යවහාරයේ ප්‍රාදේශීය වශයෙන් වෙනස්කම් පවතින බව ප්‍රකාශ කරයි.
- පොතපත කියවා ප්‍රාදේශීය ව්‍යවහාර එක් රැස් කරයි.
- ප්‍රාදේශීය ව්‍යවහාර පිළිබඳ දැනුම භාෂාමය කාර්යයන්ට යොදා ගනියි.
- ප්‍රාදේශීය ව්‍යවහාර පිළිබඳ දැනුම තහවුරු කරගනිමින් අන්‍යොන්‍ය සුහදතාව වර්ධනය කර ගනියි.

ඇමුණුම 5.2.1.1

මුණුබුරා ඃ "ආත්තා අද මක්කෙයි කරන්න හිතාගෙන ඉන්නේ?"
ආත්තා ඃ "අද මට පැල ඉන්දන්න තියෙනවා."
මුණුබුරා ඃ "හනිකට යනවැයි?"
ආත්තා ඃ "ඔහේ කොයිබ යන්ට?"
මුණුබුරා ඃ "ආත්තත් එක්ක පැල ඉන්දන්න."
ආත්තා ඃ "බොට ඇහැක්ක ඒ අහ යන්න."
මුණුබුරා ඃ "මට ඇහැකි."

ඇමුණුම 5.2.2.1

පැවරුම

- ඔබ කණ්ඩායමට ලැබෙන ලිපිය හොඳින් කියවන්න.
- ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂ වූ එහි ඇතුළත් වචන හා යෙදුම් එක් රැස් කරන්න.
- එම වචන හා යෙදුම් ඇතුළත් වන සේ කෙටි සංවාදයක් ගොඩ නගන්න.
- ඔබ සකස් කළ සංවාදය පන්තියට ඉදිරිපත් කරන්න.

නිපුණතාව 6.0 : ජීවන අවශ්‍යතා සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම 6.1 : අදහස් නිරවුල් ව හා පැහැදිලි ව දක්වමින් ලිපි ලියයි.

ක්‍රියාකාරකම : රාජකාරි ලිපියක් ලියමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 6.1.1.1 හි ඇතුළත් රාජකාරි ලිපිය.
- පැවරුම 6.1.2.1 හි ඇතුළත් රාජකාරි ලිපි ආකෘතිය
- ඇමුණුම 6.1.2.2 හි ඇතුළත් පැවරුම.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 6.1.1 :
- ඇමුණුම 6.1.1.1 හි එන රාජකාරි ලිපිය විශාලනය කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ ඇසුරෙන් පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න.

> - ආකෘතික වශයෙන් රාජකාරි ලිපියෙහි සහ පෞද්ගලික ලිපියෙහි වෙනස්කම් පවතින බව
> - රාජකාරි ලිපි රාජකාරිමය අවශ්‍යතාවන් සඳහා පමණක් ම භාවිත වන බව
> - අන්තර්ගතය සංක්ෂිප්ත ව නිරවුල් ව පැවතිය යුතු බව

(මිනිත්තු 10 යි.)

පියවර 6.1.2 :
- රාජකාරි ලිපි ආකෘතියක් ප්‍රදර්ශනය කොට එය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු පිළිබඳ සාකච්ඡා කරන්න.
- 6.1.2.2 හි සඳහන් පැවරුම ශිෂ්‍යයන් වෙත ඉදිරිපත් කොට පැවරුමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 6.1.3 :
- තෝරාගත් ලිපි කිහිපයක් පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 6.1.4 :
- ඒ ඒ ලිපි පිළිබඳ ව අදහස් දැක්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් ඉදිරිපත් වූ ලිපි පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

> - රාජකාරි ලිපියක් ලිවීමේ දී නිශ්චිත ආකෘතියක් අනුගමනය කළ යුතු බව
> - යවන්නාගේ ලිපිනය හා දිනය ඉහළ දකුණු කෙළවරේත් ලබන්නාගේ තනතුරු නාමය සහිත ලිපිනය ඊට පහළින් වම් කෙළවරේත් සටහන් කළ යුතු බව.
> - යවන්නාගේ ලිපිනය දිනය, ලබන්නාගේ ලිපිනය ආමන්ත්‍රණය සහ යවන්නාගේ අත්සන වම් කෙළවරෙහි යෙදීම ද මෙකල රාජකාරි ලිපිවල දක්නට ලැබෙන බව.
> - ඇමතුමට පසුව සුදුසු මාතෘකාවක් යෙදිය යුතු බව.
> - කරුණු දැක්වීමෙන් පසුව පහළ දකුණු කෙළවරේ අත්සන හා නම සඳහන් කළ යුතු බව.

(මිනිත්තු 10 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක ඃ

- රාජකාරි ලිපියක ආකෘතිය නිවැරදි ව විස්තර කරයි.
- නිවැරදි ව රාජකාරි ලිපියක් ලියයි.
- විවිධ රාජකාරි අවශ්‍යතා සඳහා ලිපි ලේඛන සකස් කරයි.
- රාජකාරි ලිපි ලිවීම සඳහා අන් අයට උදව් කරයි.

ඇමුණුම 6.1.1.1

විදුහල්පති,
මධ්‍ය මහා විද්‍යාලය,
කුලියාපිටිය.
20.04.2008

කළමනාකරු,
ලංකා ගමනාගමන මණ්ඩලය,
කුලියාපිටිය

කළමනාකාරතුමනි,

වාර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට දිනයක් වෙන්කර ගැනීම සඳහායි.

මගේ විදුහලේ ඉගෙනුම ලබන සිසුන්ගෙන් බහුතරයක් ලං.ග.ම බස්රථවලින් පැමිණෙන්නෝ වෙති. ඔවුන්ට අවශ්‍ය වාර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමේ දී විවිධ දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදු ව ඇත.

ඒ පිළිබඳ ව අවධානය යොමු කොට මින් ඉදිරියට ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට නිශ්චිත දිනයක් වෙන් කර මා වෙත දැනුම් දෙන ලෙස ඉල්ලමි.

මෙයට,

ඒ. ඒ. ඩබ්ලිව්. පතිරාජ.

ඇමුණුම 6.1.2.1

ආකෘතිය 01

රාජකාරී ලිපියක ආකෘතිය

යවන්නාගේ ලිපිනය හා දිනය

ලබන්නාගේ ලිපිනය

ආමන්ත්‍රණය

මාතෘකාව

අන්තර්ගතය

අත්සන

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ආකෘතිය 02

| |
|---|
| යවන්නාගේ ලිපිනය |

| |
|---|
| දිනය |

| |
|---|
| ලබන්නාගේ ලිපිනය |

| |
|---|
| ආමන්ත්‍රණය |

| |
|---|
| මාතෘකාව |

| |
|---|
| අන්තර්ගතය |

| |
|---|
| අත්සන |

ඇමුණුම 6.1.2.2

පැවරුම

- රාජකාරි ලිපියක ආකෘතිය හොඳින් අධ්‍යයනය කරන්න.

- අදාළ ආකෘතිය අනුව පහත සඳහන් මාතෘකාවලට අදාළ ව රාජකාරි ලිපියක් බැගින් ලියා ලිපි එකතුවක් සකස් කරන්න.

- ප්‍රදේශයේ පැතිර යන ඩෙංගු රෝගය මර්දනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වෙත ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් යවන ලිපියක්.
- පාසලේ ක්‍රීඩා පිටිය පුළුල් කර දෙන ලෙස ඉල්ලමින් පළාත් සභා මහ ඇමතිතුමා වෙත පාසලේ ක්‍රීඩා සංගමයේ ලේකම් යවන ලිපියක්.

- තම පාසලට පරිගණක ඒකකයක් ලබා දෙන ලෙස ඉල්ලමින් අධ්‍යාපන ඇමතිතුමා වෙත පාසල් සංවර්ධන සමිතියේ ලේකම් යවන ලිපියක්.

- රූපවාහිනී මුතුහර ළමා සමාජයක් පිහිටුවා ගැනීම සඳහා රූපවාහිනී මුතුහර ළමා වැඩසටහනේ නිෂ්පාදක වෙත ප්‍රදේශයේ ආගමික ස්ථානයක ප්‍රධානියකු විසින් සකස් කරන ලද ලිපියක්.

- ඔබ විදුහලේ ශිෂ්‍යශිෂ්‍යාවන්ට ජාතික කෞතුකාගාරය නැරඹීමට දිනයක් වෙන් කර දෙන ලෙස ඉල්ලමින් කෞතුකාගාර අධ්‍යක්ෂ වෙත විදුහල්පතිතුමා විසින් යවන ලිපියක්.

නිපුණතාව 7.0 : සිංහල අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ලියයි.

නිපුණතා මට්ටම 7.1 : ණ, න, ළ, ල අකුරු සහිත වචන නිවැරදි ව ලියයි.

ක්‍රියාකාරකම : නිවැරදි ලේඛනයට හුරු වෙමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.1.1.1 හි ඇතුළත් ඡේදය
- ඇමුණුම 7.1.2.1 ට ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.1.1 :
- ඇමුණුම 7.1.1.1 ඡේදය පුවරුවක ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එහි යටින් ඉරි ඇඳි වචනවල ණ, න, ළ, ල අකුරු යෙදීමේ විශේෂතා සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- එහි දී පහත සඳහන් අක්ෂර වින්‍යාසය සම්බන්ධ රීති අවධානයට ලක් කළ යුතු බව නිදසුන් කිහිපයකින් පැහැදිලි කරන්න.

> - ණ, න, ල, ළ අක්ෂර වචනවල නිවැරදි ව යෙදීමේ රීති අනුගමනය කළ යුතු බව
> - අතීත කාල ක්‍රියා පද අගට යෙදෙන 'ණ' මූර්ධජ වන බව (එසේ නොයෙදෙන තැන් පිළිබඳ ව ද අවධානය යොමු කරන්න)
> - 'ර' කාරයට පසුව මූර්ධජ 'ණ' යෙදෙන බව (එසේ නොයෙදෙන තැන් ගැන ද අවධානය යොමු කරන්න)
> - අල්පප්‍රාණ 'ඩ' කාරයට පෙර මූර්ධජ 'ණ' යෙදෙන බව (කථා ව්‍යවහාරයේ යෙදෙන කන්ඩ, බොන්ඩ වැනි වචන ලිවීමේ දී මූර්ධජ නොයෙදේ.)
> - හදවත, සමීප අර්ථය දෙන පදවල මුල මූර්ධජ 'ළ' යෙදෙන බව (ළය, ළඟ)
> - නොමේරූ යන අර්ථය දෙන පදවල මුල මූර්ධජ 'ළ' යෙදෙන බව
> - නුදුරු යන අර්ථය දෙන පදවල මුලට මූර්ධජ 'ළ' යෙදෙන බව
> - වචනවල අග ඇති 'ල' හල් වේ නම් එය දන්තජ 'ල' විය යුතු බව
> - ලේඛනයේ දී ණ, න, ල, ළ අක්ෂර නිවැරදි ව භාවිත කළ යුතු බව (වර්තමාන ව්‍යවහාරයේ උදාහරණ ඇසුරෙන් මෙම රීති සරල ලෙස පැහැදිලි කර දෙන්න.)

(මිනිත්තු 15 යි.)

පියවර 7.1.2 :
- පන්තියේ සිසුන් කණ්ඩායම්වලට වෙන්කරන්න.
- ඇමුණුම 7.1.2.1 හි පැවරුම කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- සිසුන් පැවරුම් කාර්යයෙහි නිරත කරවන්න.

(මිනිත්තු 25 යි.)

පියවර 7.1.3 :
- එක් එක් කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 25 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 7.1.4 : • ඒ ඒ කණ්ඩායම් ඉදිරිපත් කළ වචනයට හා අදාළ වාක්‍යවලට අමතර ව අනෙක් සිසුන්ට වාක්‍ය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
• සිසුන් ඉදිරිපත් කළ වාක්‍ය සැලකිල්ලට ගෙන පහත සඳහන් කරුණු ඇසුරින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • ලේඛනයේ දී නිවැරදි අක්ෂර වින්‍යාසය දැන ගෙන ලිවිය යුතු බව<br>• වැරදි ලෙස අක්ෂර වින්‍යාසය යෙදීමෙන් අරථය වෙනස් විය හැකි බව<br>• ප්‍රශස්ත ලේඛන ශෛලියක් ගොඩනගා ගැනීමට අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු බව<br>• අක්ෂර වින්‍යාසය පිළිබඳ ව තමාට සැකයක් ඇති වූ විට අන් අයගෙන් එය දැනගෙන සැකය දුරු කර ගත යුතු බව<br>• අක්ෂර වින්‍යාසය පිළිබඳ ගැටලුවක් ඇති වූ විට ගුරු භවතුන්ගේ උපදෙස් ලබා ගනිමින් නිවැරදි යෙදුම හඳුනා ගත යුතු බව |

(මිනිත්තු 15 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක ඃ

• ලේඛනයේ දී අක්ෂර යෙදීමේ විශේෂ රීති ඇති බව ප්‍රකාශ කරයි.
• නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචන යෙදූ වාක්‍ය ගොඩ නගයි.
• නිවැරදි ව ලිවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
• නිවැරදි ලේඛන වහර භාවිතයෙන් ලත් දැනුම භාෂා කාර්යයන්හි දී යොදා ගනියි.

ඇමුණුම 7.1.1.1

පසළොස්වක පෝය සඳ අහසේ මෝදු වෙමින් තිබිණි. අපි වෑ කන්ද තරණය කොට විහාර භූමියට පිවිසියෙමු. අඛණ්ඩ ව හමා එන මඳ සුළඟින් උඩ මළුවේ බෝ සමිඳුන්ගේ ළපටි බෝපත්, කොඩි වැල්, සිලි සිලි ගා සැලෙයි, පැන් කළ, මල්, පහන් රැගත් උපාසිකාවෝ මහත් ළැදියාවකින් යුතු ව බෝධීන් වහන්සේ ප්‍රදක්ෂිණා කරති. ළදරු, ළමා, තරුණ, මහලු සියල්ලෝ ම ඊළඟට සූදානම් වූයේ බෝධි පූජාවට යි.

ඇමුණුම 7.1.1.1

පැවරුම

• පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. ගෙවත්තේ මල් පිපී ...................................... (තිබිණි, තිබිනි)
2. පන්ති .............................. (උපකරන, උපකරණ) පිළිවෙළට තබන්න.
3. අපි .............................. (ඒදන්ඩෙන්, ඒදණ්ඩෙන්) ගොස් පාරට ගොඩ වීමු.
4. ඔහු ප්‍රතිකාර ලැබුවේ ............................................. (ළය, ලය) රෝහලෙනි.
5. ................................ (ළමා, ලමා) උයන් පිහිටුවීමට බොහෝ දෙනෙක් උනන්දු වූහ.
6. බස් රථය ................................... (ළඟ ම, ලග ම) එන හඬ ඇසෙයි.
7. ................................ (වැල, වැළ) යන අතට මැස්ස ගසන්න.

නිපුණතාව 7.0 : සිංහල අක්ෂරමාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ලියයි.

නිපුණතා මට්ටම 7.2 : මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව වචනවල යොදයි.

ක්‍රියාකාරකම : මහාප්‍රාණ අක්ෂර භාවිතයට හුරු වෙමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 7.2.1.1 හි ඇතුළත් වාක්‍යය
- පැවරුම 7.2.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.2.1 :
- ඇමුණුම 7.2.1.1 හි ඇතුළත් මහාප්‍රාණ අක්ෂර සහිත වාක්‍ය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එම වාක්‍ය සිසුන් ලවා කියවන්න.
- එහි ඇතුළත් මහාප්‍රාණ අක්ෂර යෙදුණු වචන පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - සිංහල හෝඩියේ මහාප්‍රාණ අක්ෂර 10 ක් ඇති බව (ඛ, ඡ, ඨ, ථ, ඵ, ඝ, ඣ, ඪ, ධ, භ)
> - මහත් වූ ප්‍රාණයකින් බර හඬකින් උච්චාරණය කරන නිසා මහාප්‍රාණ අක්ෂර යන නම යෙදෙන බව
> - ලේඛනයේ දී මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව ලිවීම හා යෙදීම වැදගත් වන බව

(මිනිත්තු 10 යි.)

පියවර 7.2.2 :
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 7.2.2.1 හි ඇතුළත් පැවරුම් කණ්ඩායම්වලට ලබා දෙන්න.
- පැවරුම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- සිසුන් පැවරුමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 7.2.3 :
- එක් එක් කණ්ඩායම්වල පැවරුම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 25 යි.)

පියවර 7.2.4 :
- එක් එක් කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම් පිළිබඳ ව ප්‍රතිචාර දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන් ලියා ඇති වැරදි වචන නිවැරදි කරන්න.
- පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> - ලේඛනයේ දී මහාප්‍රාණ අක්ෂර පිළිබඳ සැලකිලිමත් විය යුතු බව
> - මනා අවබෝධයකින් යුතු ව මහාප්‍රාණ අක්ෂර ලිවිය යුතු බව .
> - මහාප්‍රාණ අක්ෂර භාවිතය ව්‍යවහාරයෙන් ම උගත යුතු බව
> - කතා ව්‍යවහාරයේ දී මහාප්‍රාණ අක්ෂර කෙරෙහි එතරම් සැලකිල්ලක් නොදක්වන බව

(මිනිත්තු 15 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක ඃ

- මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව උච්චාරණය කරයි.
- මහාප්‍රාණ අක්ෂර සහිත වචන යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- ලේඛනයේ දී සම්මත රීති අනුගමනය කරයි.
- නිවැරදි ලේඛනයේ වැදගත්කම පිළිබඳ අන් අය දැනුවත් කරයි.

ඇමුණුම 7.2.1.1

නගර සභා ඡන්දයෙන් තේරී පත් වූ නගරාධිපතිතුමා නගරය ඓශ්වර්යයෙන් ආඪ්‍ය කරනු පිණිස ඵලදායී, අනර්ඝ, අර්ථවත් කර්තව්‍යයකට මුල පිරූ බව පැවසුවේ ය.

ඇමුණුම 7.2.2.1

පැවරුම

පොදු උපදෙස්

1. මහප්‍රාණ අක්ෂර භාවිත කරමින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| මහාප්‍රාණ අක්ෂර | අක්ෂරය සහිත පදය |
|---|---|
| 1 ඛ | ඛනිජ |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| 9 | |
| 10 | |

2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. .............................. (ඛනිජ, කනිජ) වැලි අගනා සම්පතකි.
2. අපි .............................. (ඡායාරූප, ඡායාරූප) ප්‍රදර්ශනය නැරඹීමු.
3. අධ්‍යක්ෂතුමා ............................ (කොට්ඨාස, කොට්ටාස) අධ්‍යාපන කාර්යාලය විවෘත කළේ ය.
4. .............................. (පුස්තකාලයට, පුස්ථකාලයට) අලුත් පොත් ලැබී ඇත.
5. හැම වෘක්ෂයකම ............................ (පුෂ්ප, පුෂ්ප) දක්නට ලැබේ.
6. .................................. (පරිඝනක, පරිගණක) තාක්ෂණය ලොවපුරා ව්‍යාප්ත වෙමින් පවතියි.
7. භික්ෂූන් වහන්සේලා පිරිත් ........................................ (සජ්ජායනා, සජ්ඣායනා) කළහ.
8. සමහරෙක් ............................ (ආරූඪ, ආරූඩ) නම්වලින් පුවත් පත්වලට ලිපි ලියති.
9. ගොවියෝ කෘමීන් .................................. (මර්ධනයට, මර්දනයට) කෙම් ක්‍රම භාවිතා කරති.
10. පොල්තෙල් පහන දල්වා සභාවේ වැඩ ............................... (ආරම්භ, ආරම්බ) විය.

නිපුණතාව 7.0 : සිංහල අක්ෂර මාලාව නිරවුල් ව වටහා ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ලියයි.

නිපුණතා මට්ටම 7.3 : සඤ්ඤක අකුරු අර්ථවත් ව වචනවල යොදමින් නිවැරදි ව වාක්‍ය ලියයි.

ක්‍රියාකාරකම : සඤ්ඤක අකුරු සහිත වචන යොදා වාක්‍ය ලියමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 7.3.2.1 හි පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 7.3.1 : • පහත සඳහන් වචන යුගල පුවරුවක ලියා ප්‍රදර්ශනය කරන්න.

උදා ඃ අගල - අඟල
ඇදුම - ඇඳුම
අඩුව - අඬුව
නුබ - නුඹ

• මෙම වචන සිසුන් ලවා ශබ්ද නගා උච්චාරණය කරමින් වෙනස්කම් මතුවන සේ අකුරු හොඳින් කියවිය බව දක්වන්න.
• පහත සඳහන් තොරතුරු අවධානයට කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> • සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර 5 ක් ඇති බව (ඟ, ජ, ඬ, ඳ, ඹ)
> • සඤ්ඤක 'ජ' අක්ෂරය යෙදෙන වචන විරල බව
> උදා ඃ ඉජුඃ
> • අර්ධානුනාසික යනුවෙන් ද මේ අක්ෂර හැඳින්වෙන බව
> • සඤ්ඤක අකුරු ලිවීම හා උච්චාරණය කිරීම නිවැරදි ව කළ යුතු බව

(මිනිත්තු 10 යි.)

පියවර 7.3.2 : • සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
• ඇමුණුම 7.3.2.1 හි පැවරුම් පත් එක් එක් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
• අවශ්‍ය උපදෙස් ලබා දී සිසුන් පැවරුමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 7.3.3 : • ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම සඳහා කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 25 යි.)

පියවර 7.3.4 : • එක් එක් කණ්ඩායම්වල ඉදිරිපත් කිරීම් පිළිබඳ ව අනෙක් කණ්ඩායම්වල අදහස් විමසන්න.
• පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

> • නිවැරදි ව සඤ්ඤක අකුරු භාවිත කිරීමේ හුරුවක් ඇති කර ගත යුතු බව.
> • සඤ්ඤක අකුරු වචනවල නිවැරදි ව යෙදීමෙන් සමස්ථ අර්ථය නිවැරදි වන බව.

(මිනිත්තු 15 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක ඃ

- සඤ්ඤක අක්ෂර සහිත වචන ලියා දක්වයි.
- සඤ්ඤක අක්ෂර සහිත වචන යොදා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරයි.
- ලේඛනයේ දී හා භාෂණයේ දී නිවැරදි ව සඤ්ඤක අක්ෂර භාවිතා කරයි.
- ලේඛනයේ දී සඤ්ඤක අක්ෂර භාවිතයේ නිවැරදි බව පිළිබඳ ව අන් අය දැනුවත් කරයි.

ඇමුණුම 7.3.2.1

පැවරුම

පොදු උපදෙස්

- ඔබ කණ්ඩායමට ලැබෙන සඤ්ඤක අක්ෂරය හා සඤ්ඤක නොවන අක්ෂරය යොදා වචන ලියන්න.
- එම වචන යොදා ගනිමින් අර්ථවත් වාක්‍ය 02 ක් බැගින් නිර්මාණය කරන්න.

ග - ඟ

උදා ඃ අගල - අඟල

ආරක්ෂක බලකොටුව වටා අඟල් 36 ක් පමණ පළල අගලක් කපා තිබුණේ ය.

ඩ - ඬ

උදා ඃ අඩු - අඬු

අම්මා අඬු කෝප්පයෙන් වතුර මැන කසාය හැළියේ අඩු ප්‍රමාණය පිරෙව්වා ය.

ද - ඳ

උදා ඃ ඇද-ඇඳ

බ- ඹ

උදා ඃ අබ - අඹ

නිපුණතාව 8.0 : වියරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයන් ඉටු කර ගනියි.

නිපුණතා මට්ටම 8.1 : නාමපද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයෙහි යෙදෙයි.

ක්‍රියාකාරකම : නාමපද උගනිමු ; වාක්‍ය ලියමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 8.1.1.1 හි ඇතුළත් වාක්‍ය
- ඇමුණුම 8.1.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.1.1 :
- සිසුන් උගත් විවිධ නාම පද වර්ග පිළිබඳ විමසමින් සාකච්ඡාවක යෙදෙන්න.
- ඇමුණුම 8.1.1.1 සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කර නිශ්ශබ්ද ව කියවීමට ඉඩ සලසන්න.
- ඒ ඇසුරින් පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.

> - විවිධ නාම පද වාක්‍යවල යෙදී අර්ථය ප්‍රකාශ කරන බව.
>
>   උදා ඃ ස්ත්‍රී ලිංග නාමපද, පුරුෂ ලිංග නාම පද, සර්ව නාම පද, අනියමාර්ථ නාම පද
>
>   ස්ත්‍රී ලිංග - දැරිය
>   පුරුෂ ලිංග - මල්ලී
>   සර්ව නාම - ඔබ/ මම/ අපි ආදී
>   අනියමාර්ථ - පොලිස් නිලධාරියෙක්
>   පොලිස් නිලධාරියෙකු/පොලිස් නිලධාරියකු
>   ගැහැනියක්
>   ගැහැනියක
> - අනියමාර්ථයේ දී නාමපදවලට එක්/අක් ප්‍රත්‍යය එකතු වන බව

(මිනිත්තු 15 යි.)

පියවර 8.1.2 :
- 8.1.2.1 ඇමුණුමේ සඳහන් පැවරුම I සහ II සිසුන්ට ලබා දෙන්න.
- කේවල ක්‍රියාකාරකමක් ලෙස සිසුන් පැවරුම් කාර්යයෙහි නිරත කරවන්න.

(මිනිත්තු 25 යි.)

පියවර 8.1.3 :
- අහඹු ලෙස තෝරාගත් ශිෂ්‍යයින් කිහිපදෙනෙකුගේ පැවරුම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

(මිනිත්තු 25 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

පියවර 8.1.4 : • ශිෂ්‍යයින්ගේ පැවරුම් ක්‍රියාකාරකම් ඇසුරෙන් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

- නාම පද විවිධාර්ථවත් ව වාක්‍යවල යෙදෙන බව
  උදා : කර්තෘ පදය හා කර්ම පදය ලෙස
- නාම පදවලින් ලිංගාර්ථ හැඟවෙන බව
  උදා : ස්ත්‍රී/ පුරුෂ/ නපුංසක
- නාම පද අතර පොදුවේ භාවිත කරන නාම පද ද හඳුනා ගත හැකි බව
  උදා : සර්ව නාම - ඔහු/ ඈ/ යුෂ්මතා
- අනියමාර්ථ නාම පද ලිංග භේදය අනුව විවිධ ස්වරූප ගන්නා බව

| | උක්ත | අනුක්ත |
|---|---|---|
| පුරුෂ ලිංග | එක් (මිනිසෙක්) | එක (මිනිසෙකු)<br>අකු (මිනිසකු) |
| ස්ත්‍රී ලිංග | අක් (දැරියක්) | අක (දැරියක) |

(මිනිත්තු 15 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක :

- වාක්‍යවල නාම පද නිවැරදි ව යෙදෙන ආකාරය පැහැදිලි කරයි.
- අනියමාර්ථයේ දී යෙදෙන ප්‍රත්‍යය පිළිබඳ අවබෝධයකින් ලේඛනයේ යෙදෙයි.
- නිවැරදි ව ලේඛන කාර්යයන් හි නිරත වෙයි.
- නිවැරදි ලේඛන කාර්යයන් සඳහා අන්‍යයන්ට මඟ පෙන්වයි.

ඇමුණුම 8.1.1.1

නාම පද හඳුනා ගනිමු.

1. ස්ත්‍රී ලිංග නාම පද
   I. දැරිය මල් පහන් පූජා කරයි/ කරන්නී ය.

2. පුරුෂ ලිංග නාම පද
   II. මල්ලී සමනලයකු පසුපස ලුහු බඳියි/ බඳින්නේ ය.

3. සර්ව නාම පද
   III. ඔබ ම මේ නිවේදනය කරන්න.

4. අනියමාර්ථ නාම පද
   IV. පොලිස් නිලධාරියෙක් ගැහැනියක සමඟ වාද කරයි.

පැවරුම I

- නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

1. ...................................... මල් කඩන්නීය. / කඩයි.

2. ...................................... පිල් කළඹ සලමින් නටයි/ නටන්නේය.

3. ...................................... පොලිසියට භාර වෙයි/ වන්නේ ය.

4. කොටියා ...................................... පසුපස ලුහුබඳියි/ ලුහුබඳින්නේය.

5. ...................................... ශිෂ්‍යාවක පුහුණු කරයි/ කරවන්නේය.

6. මම ...................................... දැක බියවීමි.

7. ...................................... උයන් කෙළියට පැමිණියේය.

8. ...................................... ජනතාව වෙනුවෙන් හඬ නැගුවේය.

9. පරීක්ෂකතුමා ...................................... අමතයි/ අමතන්නේය.

10. ...................................... ගී ගයමින් නටයි/ නටන්නීය.

(රජතුමා, බැල්ලියක, එක් අයෙක්, ගුරුවරියක, මුවෙකු දැරියක්, ගුරුවරියක්, මොණරා, නිළිය, එතුමා.)

පැවරුම II

- පහත සඳහන් නාමපද ස්ත්‍රී ලිංග/ පුරුෂ ලිංග/ සර්ව නාම/ අනියමාර්ථ යන කොටස්වලට වගුගත කරන්න.

සෙබඩ, අශ්වයා, මම, නිළියක්, ඔබතුමා
ලේඛකයා, මැහැල්ල, කුඹුරක්, බාලිකාව,
ලේඛකයා, මවක, එතුමා, සැමියකු,
ගායකයා, ඔබ, සුරඟන, වෙළෙන්දා,
තොපි, දූතිකාව, ගොවියෙක්.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 8.0 : වියරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයන් ඉටු කර ගනියි.

නිපුණතා මට්ටම 8.2 : ක්‍රියාපද භාවිතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

ක්‍රියාකාරකම : ආශීර්වාද හා පූර්ව ක්‍රියා පද යොදා වාක්‍ය ලියමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 8.2.2.1 හි සඳහන් පැවරුම.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.2.1 :
- ආශීර්වාද ක්‍රියා පද සහ පූර්ව ක්‍රියා පද ඇතුළත් කෙටි වාක්‍ය කිහිපයක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- ඒ ඇසුරින් ආශීර්වාද ක්‍රියා පද හා පූර්ව ක්‍රියා පද පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

> - ආශීර්වාද ක්‍රියාපද යොදන්නේ ආශීර්වාදයක් කරන අවස්ථාවලදී බව
> - එය අනාගත කාලය නියෝජනය කරන බව
> - ආශීර්වාද ක්‍රියාව "වා! " යන නිපාතයෙන් අවසන් වන බව හා අගට හර්ෂාදි ලකුණ යෙදෙන බව
>   උදා ඃ ලැබේවා!, ජය වේවා!
> - උක්තය අනුව ආශීර්වාද ක්‍රියාවේ ස්වරූපය නියෝජනය වන බව
>   උදා ඃ මම සුවපත් වෙම්වා!, සියලු සත්වයෝ සුවපත් වෙත්වා!
> - අවසාන ක්‍රියාවට පෙර සිදු කළ ක්‍රියා පූර්ව ක්‍රියා නම් වන බව
>   උදා-ඔහු මහත් ධනයක් වැය කොට නිවසක් තැනුවේය.

(මිනිත්තු 15 යි.)

පියවර 8.2.2 :
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 8.2.2.1 හි සඳහන් පැවරුම් කාර්යයෙහි සිසුන් නිරත කරවන්න. (කේවල ක්‍රියාකාරකමකි.)

(මිනිත්තු 25 යි.)

පියවර 8.2.3 :
- කණ්ඩායම් අතරින් අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍යයින් කීප දෙනෙකුගේ ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරන්න.

(මිනිත්තු 20 යි.)

පියවර 8.2.4 : • පහත සඳහන් කරුණු අවධානයට ගනිමින් ආශීර්වාද ක්‍රියා හා පූර්ව ක්‍රියා පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

• ආශිර්වාද ක්‍රියාව මගින් යහපතක් හෝ අයහපතක් හෝ ප්‍රාර්ථනයක් කළ හැකි බව.
උදා ඃ නිවන් සැප ලැබේවා!, සැරදේවා!
වැනසෙත්වා!, භංග වේවා! සාප වේවා!
• ආශීර්වාද ක්‍රියා එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවල යෙදෙන බව
උදා ඃ සුභ උදෑසනක් වේවා!, සුභ උපන්දිනයක් වේවා!
• වාක්‍ය ගළපා ගැනීමේ දී පූර්ව ක්‍රියාව බෙහෙවින් උපයෝගී වන බව
උදා ඃ I. ළමයා ගෙදර ගියේ ය.
II. ළමයා සෙල්ලම් කළේ ය.
ළමයා ගෙදර ගොස් සෙල්ලම් කළේ ය.
• ක්‍රියාපදයක් ඇසුරෙන් පහත සඳහන් ආකාරයට පූර්ව ක්‍රියා පදයක් සකස් කර ගත හැකි බව.
උදාඃ ලියයි - ලියා
බැලුවේ ය - බලා

(මිනිත්තු 20 යි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

• පූර්ව ක්‍රියා පද හා ආශීර්වාද ක්‍රියා පද විස්තර කරයි..
• පූර්ව ක්‍රියා පද හා ආශීර්වාද ක්‍රියා යොදමින් වාක්‍ය නිර්මාණය කරයි.
• ලේඛන කාර්යයේ දී උචිත පරිදි මෙම ක්‍රියා පද භාවිත කරයි.
• නිවැරදි ලේඛන කාර්යය සඳහා අන්‍යයන්ට උදව් කරයි.

ඇමුණුම 8.2.2.1

පැවරුම I

• ආශීර්වාද ක්‍රියා පද දහයක් ලියන්න.
• එම ආශීර්වාද ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

පැවරුම II

• දී ඇති ක්‍රියා පද පූර්ව ක්‍රියා පද බවට පත් කරන්න
උදාඃ ලියයි - ලියා

| | |
|---|---|
| කපයි - | බැලුවේය - |
| නටයි - | ගැයුවේය - |
| අඬයි - | කීවාය - |
| කරයි - | කෑවේය - |
| කඩයි - | වැනුවේය - |

• සකස් කළ පූර්ව ක්‍රියා පද යොදා අර්ථවත් වාක්‍යයක් බැගින් නිර්මාණය කරන්න.

නිපුණතාව 8.0 : ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයන් ඉටු කර ගනියි.

නිපුණතා මට්ටම 8.3 : උක්ත ආඛ්‍යාත/ ක්‍රියා පද සම්බන්ධය පිළිබඳ අවබෝධයෙන් යුතු ව වාක්‍ය නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම : නිවැරදි ව වාක්‍ය ලියමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 8.3.2.1 හි සඳහන් පැවරුම.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 8.2.1 : • දී ඇති ක්‍රියා පද අර්ථවත් වන පරිදි සිසුන් හා එක් ව සරල වාක්‍ය ගොඩනගා පුවරුවක ලියන්න.
දුවයි, පැන්නෝය, නැටුවේ ය, ගයති, වයයි.
• එම වාක්‍ය ඇසුරින් පහත සඳහන් කරුණු ද අවධාරණය කරමින් සාකච්ඡාවක නිරත වන්න.

> • සරල වාක්‍යයක උක්තය, කර්මය, ආඛ්‍යාතය/ක්‍රියා පදය යනුවෙන් කොටස් තුනක් ඇති බව.
> • ක්‍රියාපදවල ස්වරූපය කාලභේදය අනුව වෙනස් වන බව.
> (මෙහි අනතීත යන්නේ වර්තමාන සහ අනාගත කාලය හැඟවේ.)
>
> | උදා : අතීත | අනතීත |
> |---|---|
> | දිව්වේ ය. | දුවයි. |
> | බැලූහ. | බලති |
>
> • උක්තවන නාම පදයේ වචන භේදය හා ලිංග භේදය අනුව ආඛ්‍යාතය /ක්‍රියා පදය වෙනස් වන බව
> උදා : අක්කා පාසල් ගියාය.
> අයියා පාසල් ගියේය.
> අයියාත් අක්කාත් පාසල් ගියෝය.
> • උක්ත පදයේ පුරුෂ භේදය අනුව ආඛ්‍යාතය/ක්‍රියා පදය වෙනස් වන බව
> උදා : උත්තම, මධ්‍යම, ප්‍රථමපුරුෂ.

(මිනිත්තු 15 යි.)

පියවර 8.3.2 : • ඇමුණුම 8.3.2.1 හි සඳහන් පැවරුම සිසුන් වෙත ලබා දෙන්න.
• පැවරුම් කාර්යයෙහි සිසුන් නිරත කරවන්න.

(මිනිත්තු 25 යි.)

පියවර 8.3.3 : • අහඹු ලෙස තෝරාගත් සිසුන් කීප දෙනෙකුට පැවරුම් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 8.3.4 : • සිසුන් ඉදිරිපත් කළ පිළිතුරු අගයමින් පහත සඳහන් කරුණු අවධාරණය වන සේ සමාලෝචනයක යෙදෙන්න.

- වාක්‍ය නිර්මාණයේ දී උක්තය, කර්මය, ආඛ්‍යාතය/ ක්‍රියාව පිළිබඳ සැලකිලිමත් විය යුතු බව
- කාලභේදය පිළිබඳ සැලකිලිමත් විය යුතු බව
- කාල භේදය දැක්වීමේ දී කාලවාචී නිපාත ද යොදා ගත හැකි බව
  උදා ඃ අතීත - ඊයේ, පෙරේදා
  අනතීත - හෙට, අනිද්දා, ලබන සතියේ, අද, දැන්, මෙකල්
- නිවැරදි ලේඛන කාර්යයන් සඳහා උක්ත - ක්‍රියා පද සම්බන්ධය පිළිබඳ අවබෝධය අවශ්‍ය වන බව.

(මිනිත්තු 10 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- වාක්‍ය ලිවීමේ දී උක්ත ආඛ්‍යාත/ ක්‍රියා පද ගළපන ආකාරය විස්තර කරයි.
- නිවැරදි උක්ත ආඛ්‍යාත ක්‍රියා පද ගළපමින් වාක්‍ය ලියයි.
- ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කටයුතුවල නියැළෙයි.
- නිවැරදි ලේඛන කටයුතු සඳහා අන්‍යයන් පොළඹවයි.

ඇමුණුම 8.3.2.1

පැවරුම I

- පහත දී ඇති අතීත කාල ක්‍රියා පද අනතීත කාල ක්‍රියා පද බවට පත්කරන්න.

  I. හැමුවේ ය. -
  II. කළෙමි. -
  III. බැලුවෝ ය. -
  IV. දිව්වෙමු. -
  V. කැපුවේ ය. -

- එම අනතීත කාල ක්‍රියා පද යොදා සරල වාක්‍යය බැගින් ලියන්න.

- දී ඇති අනතීත කාල ක්‍රියා පද අතීත කාල ක්‍රියා පද බවට පත් කරන්න.

  I. කඩමි -
  II. උයයි -
  III. ලියති -
  IV. කරයි -
  V. දුවති -

- එම අතීත කාල ක්‍රියා පද යොදා සරල වාක්‍යය බැගින් ලියන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 9.0 : භාෂා හා සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනැඟීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 9.1 : සංස්කෘතික උරුමයන් හා හර පද්ධතීන් පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

ක්‍රියාකාරකම : අපේ උරුමයන් අගයමු.
කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : ඇමුණුම 9.1.2.1 හි සඳහන් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 9.1.1 :
- පෞරාණික අගයෙන් යුතු ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන දැක්වෙන පින්තූර පෙළක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සංස්කෘතික වශයෙන් වැදගත් වන මෙවැනි තවත් ස්ථාන පිළිබඳ ව සිසුන්ගෙන් තොරතුරු ලබා ගන්න.
- ඒවායෙහි වටිනාකම පිළිබඳ ව සිසුන් සමග පහත කරුණු ද මතු කරමින් සාකච්ඡාවක නිරත වන්න.

- මෙබඳු කලාකෘති බිහිවීමට විවිධ සාධක බලපාන බව.
  උදා ඃ සාමය
  රාජානුග්‍රය
  සමෘද්ධිය
  ජනතා කැපවීම හා අගය කිරීම
  අන්තර් ජාතික සංස්කෘතික සබඳතා
- තවත් මෙවැනි බොහෝ සංස්කෘතික ලක්ෂණ පිළිබිඹු වන විවිධ ක්ෂේත්‍ර ඇති බව.
  උදා ඃ චිත්‍ර
  ගෘහ නිර්මාණ ශිල්පය
  වාරි කර්මාන්තය
  කැටයම් හා මූර්ති
  ගැමි කලාවන්
  ආභරණ
  කාසි, මැටි කර්මාන්තය ආදි
- සංස්කෘතික උරුමයන් හා හර පද්ධතීන් පිළිබඳ අගය වඩවන භාෂා ශෛලියකින් ලියවුණු නිර්මාණ කියවීමෙන් අපේ ජාතික අනන්‍යතාව ගැන හැඟීම් තීව්‍ර වන බව

(මිනිත්තු 15 යි.)

පියවර 9.1.2 :
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 9.1.2.2 හි සඳහන් පැවරුම් ශිෂ්‍ය කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- පැවරුම සඳහා පෙළපොතේ අදාළ පාඩම තෝරා ගන්න.
- පැවරුම් කාර්යයෙහි සිසුන් නිරත කරවන්න.

(මිනිත්තු 25 යි.)

පියවර 9.1.3 : ● ශිෂ්‍ය කණ්ඩායම්වලට තමන් විසින් සකස් කරගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 9.1.4 : ● කණ්ඩායම්බල ඉදිරිපත් කිරීම් අගය කරමින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • ශ්‍රී ලංකාවේ පෞරාණික කලා නිර්මාණයන්හි විශිෂ්ටත්වය හා විචිත්‍රත්වය ප්‍රකට වන පොත්පත් හා ලිපි ලේඛන පරිශීලනය කළ යුතු බව<br>• මෙවැනි විශිෂ්ට කලා කෘති කලා නිර්මාණ ලෙස පමණක් නොව භාෂා සාහිත්‍ය පෝෂණයට ද ඉවහල් වී ඇති බව<br>• මෙබඳු ස්ථාන නිරතුරු ව නැරඹීමට පෙළඹිය යුතු බව<br>• තමා ලත් අත්දැකීම් අන් අය හා බෙදා ගත යුතු බව<br>• ජාතියක අනන්‍යතාව පෞරාණික උරුමයන් මගින් තහවුරු වන බව |

(මිනිත්තු 10 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- අපේ සංස්කෘතික උරුමයන් හඳුනාගෙන ඒවා පිළිබඳ ව තොරතුරු ප්‍රකාශ කරයි.
- අපේ ජාතික උරුමයන් අගයමින් කතා කරයි.
- පෞරාණික අගයෙන් යුත් ස්ථාන පිළිබඳ ලියවුණු ලිපි ලේඛන පරිශීලනය කරයි.
- පෞරාණික වටිනාකමක් ඇති ස්ථාන පිළිබඳ පොතපත ඇසුරු කරගෙන කෙටි විස්තර ලියා ඉදිරිපත් කරයි.

ඇමුණුම 9.1.2.1

පැවරුම

පොදු උපදෙස්

- ඔබ කණ්ඩායමට ලැබෙන පෙළපොතේ පාඩම අවබෝධයෙන් යුතු ව කියවන්න.
- ලිපියේ මූලික අරමුණ සටහන් කරන්න.
- ලිපියේ විස්තර කර ඇති ප්‍රධාන කරුණු අනුපිළිවෙළින් දක්වන්න.
- ඔබ කණ්ඩායම රැස් කර ගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 9.0 : භාෂා හා සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනැගීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 9.2 : කියවීම මගින් සමාජ සාරධර්ම චරිතායනය කර ගනියි.

ක්‍රියාකාරකම : සාරධර්ම ඉගෙනගනිමු.

කාලය : මිනිත්තු 120 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 9.2.2.1 ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 9.2.1 :
- විවිධ කටයුතුවල දී නිතර කරන පොදු චාරිත්‍ර පිළිබඳ ව සිසුන්ගෙන් තොරතුරු විමසන්න.
- පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් වෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

| |
|---|
| • දෛනික ජීවිතයේ විවිධ කාර්යයන්වල දී විවිධ චාරිත්‍ර - වාරිත්‍ර අනුගමනය කරන බව |
| • ඇතැම් ඒවායෙහි ආගමික ස්වරූපයක් ඇති බව |
| • සිරිත් - විරිත් පාරම්පරික ව පැවත එන බව |
| • ඇතැම් සිරිත්විරිත්වල කිසියම් විද්‍යාත්මක පදනමක් ඇති බව |
| • සිරිත්විරිත්වල ප්‍රාදේශීය වෙනස්කම් ඇති බව හා ඒ ඒ ප්‍රදේශවලට ආවේණික චාරිත්‍ර ඇති බව |
| • අපේ අනන්‍යතාව පිළිබිඹු කරන සිරිත්විරිත්වලට ගරු කිරීම කළ යුතු බව |

(මිනිත්තු 15 යි.)

පියවර 9.2.2 :
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම්වලට 9.2.2.1 හි සඳහන් පැවරුම ලබාදෙන්න.
- පෙළපොතේ අදාළ පාඩම කියවා එහි අන්තර්ගත සාරධර්ම සිරිත් විරිත් ගොනු කර පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් කරවන්න.

(මිනිත්තු 40 යි.)

පියවර 9.2.3 :
- කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 50 යි.)

පියවර 9.2.4 : • සිසුන්ගේ ඉදිරිපත් කිරීම් සැලකිල්ලට ගෙන පහත සඳහන් කරුණු ද ඉස්මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • ගමේ දැන උගත් වැඩිහිටියෙකුගේ මූලිකත්වයෙන් මේ සිරිත් විරිත් සිදුවන බව<br>• එක ම අරමුණක් ඉටුකර ගැනීම සඳහා විවිධ සිරිත් විරිත් අනුගමනය කරන බව<br>• හේන් ගොවිතැන හා බැඳුණු සාරධර්ම සමුදායක් ඇති බව<br>• හේන හා බැඳුණු සංස්කෘතියක් පැරණි සමාජය තුළ ගොඩනැගී තිබුණු බව<br>• හේන හා සම්බන්ධ විවිධ විචිත්‍ර සාහිත්‍ය නිර්මාණ ගොඩ නැගී ඇති බව<br>• මේ ආශ්‍රිත සාහිත්‍ය පරිශීලනය කිරිමෙන් සිරිත් විරිත් හා සාරධර්ම පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි බව |

(මිනිත්තු 15 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- අපේ පැරණි සිරිත්විරිත් විස්තර කරයි.
- ජන සංස්කෘතිකාංග ගැන කියවෙන ලිපිලේඛනවල ඇතුළත් කරුණු විස්තර කරයි.
- සිරිත් විරිත් විචාරශීලී ව අනුගමනය කරයි.
- සාරධර්ම අගය කරමින් කතා කරයි.

ඇමුණුම 9.2.2.1

පැවරුම

පොදු උපදෙස්

- ඔබ කණ්ඩායමට ලැබෙන ලිපිය හොඳින් කියවන්න.
- එහි ඇතුළත් චාරිත්‍රවාරිත්‍ර පෙළ ගස්වන්න.
- එම චාරිත්‍රවාරිත්‍ර අනුගමනය කිරීමේ වැදගත්කම සටහන් කර ගන්න.
- ඔබ රැස්කරගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 9.0 : භාෂා හා සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගෙන ජාතිකාභිමානය, දේශමාමකත්වය හා සහජීවනය ගොඩනැඟීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 9.3 : දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.

ක්‍රියාකාරකම : හෙළ විරුවන් සමරමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 9.3.1.1 හි ඇතුළත් ගීතය
- ඇමුණුම 9.3.2.1 හි ඇතුළත් ලිපිය
- ඇමුණුම 9.3.2.2 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 9.3.1 :
- 'හෙළ ජාතික අභිමානේ ' ගීතය ගායන කුසලතා ඇති සිසුවෙකු මගින් හෝ වෙනත් උචිත ක්‍රමයක් මඟින් හෝ ඇසීමට සලස්වන්න.
- ජාතිකාභිමානය ජනිත කරන ඉහත ගීතය ද ඇසුරෙන් පහත සඳහන් කරුණු ද ගොනු කර ගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.

> - දේශාභිමානී නිර්මාණ පරිශීලනයෙන්, දේශාභිමානී හැඟීම් ජනිත වන බව
>   උදා ඃ හෙළ ජාතික අභිමානේ, වැඩු විරුවන් සේ පොරණේ, වීර විකුම් පෑ හෙළ දරුවෝ, ගොවියා බිම දෙවියා
> - සරසවි, සැරසෙව්, පිබිදෙව්, කරවව්, අරඹව් ආදී විධාන ක්‍රියා මඟින් ජාතිකාභිමානය වඩාත් තීව්‍ර ලෙස උද්දීපනය කරන බව
> - මෙම නිර්මාණවල ජාතික වීරවරයන් පිළිබඳ උතුම් හැඟීම් ජනනය වන භාෂාත්මක යෙදුම් ඇති බව
> - රට දැය සමය පිළිබඳ උදාර හැඟුම් අප තුළ ද ජනිත කර ගත යුතු බව
> - රටේ දියුණුව ද තම දියුණුව ද සලසා ගැනීම සඳහා රට, ජාතිය පිළිබඳ හැඟීමෙන් යුතු ව ජීවත් විය යුතු බව
> - මෙවැනි සාහිත්‍ය නිර්මාණ නිරන්තරයෙන් ඇසුරු කිරීමට පෙළඹිය යුතු බව

(මිනිත්තු 20 යි.)

පියවර 9.3.2 :
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
- ඇමුණුම 9.3.2.1 ලිපියේ පිටපත් කණ්ඩායම්වලට බෙදා දෙන්න. (පෙළපොතේ පාඩමක් ද යොදා ගත හැකියි.)
- ලිපියෙන් ඉදිරිපත් වන ජාතික වීරවරයා පිළිබඳ තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න.
- අදාළ පැවරුම ද ලබා දෙන්න.

(මිනිත්තු 35 යි.)

පියවර 9.3.3 :
- ගවේෂණය කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායම්වල පැවරුම් ක්‍රියාකාරකම් පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 9.3.4 : • පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| • අතීත ශූර පාලකයින් හා ඔවුන් සමඟ සිටි අභීත සෙන්පතියන්ගේ වීරත්වය නිසා ජාතිය සුරක්ෂිත වූ බව<br>• ජාතික වීරයින්ගේ පරමාදර්ශී චරිතයන්ගෙන් වර්තමාන සමාජයට බොහෝ ආදර්ශ ලබා ගත හැකි බව<br>• ජාතිකාභිමානී හැඟීම් දැනවීම සඳහා එබඳු වීරවරයන් පිළිබඳ ලියවුණු සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කළ යුතු බව |

(මිනිත්තු 20 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- ජාතික වීරවරයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ඓතිහාසික සිදුවීම්වල එන ජාතික වීරවරයන්ගේ වීර ක්‍රියාවන් පිළිබඳ තොරතුරු පොතපත ඇසුරින් ගවේෂණය කරයි.
- අතීත විරුවන්ගේ වීරත්වය චරිතායනය කර ගනියි.
- දේශ වාත්සල්‍යයේ වැදගත්කම පිළිබඳ ව අන්‍යයන් සමඟ කතා කරයි.

ඇමුණුම 9.3.1.1

හෙළ ජාතික අභිමානේ

හෙළ ජාතික අභිමානේ
වැඩූ විරුවන් සේ පොරණේ
දිනූ මව් බිම සව් සිරියෙන් සරසව්
පිබිදෙව් - පිබිදෙව් - සැරසෙව් ---- //

වීර විකුම් පෑ පෙර දරුවෝ
දෙස රැස මුර කෙරුවෝ
ඒ ලෙස ඇති ඔබ සුර විරුවෝ
නොමවව් ණයකරුවෝ

දැය දියුණට පැද යන නැවියා
ගොවියා බිම දෙවියා
විපතෙහි සැපතෙහි නොසැලෙයි නොතැළෙයි
අටලෝ දම හුරු හෙළයා

මුහුදට ඇදෙනා මහ ගංගා
කුඹුරට යළි හරවා
ධාන්‍ය වගා කොට සිරිලක මේ
පෙර දිග කෙත කරවව්

අර පිරිමැස්මට පුරුදුවෙලා
සිඳලව් දුක සංකා
පැරකුම් යුගයක් නැවතත් අරඹව්
නිප් භූමි තලේ ලංකා

*පද රචනය ඃ කරුණාරත්න අබේසේකර*

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

## වීරෝදාර නායකයෙක්.

මහනුවර බලා ගමන් ගත් ප්‍රතිකාල් සේනාව එහි නොගොස් සීතාවකින් හැරී සබරගමුව බලාගමන් කරන බව චරපුරුෂයන්ගේ මාර්ගයෙන් දැනගන්ට ලැබුණෝය. දෙවියන්ගේ දේවභාෂිතය සත්‍ය වන බව මින් අවබෝධ වූ කුමාරයා වඩවඩා උද්‍යොගයෙන් යුද්ධ කටයුතු සංවිධානය කළේ ය.

කොන්ස්තන්තීනු ද සා තමා සතු ව තිබූ මුළු ප්‍රතිකාල් බළ ඇණිය ද ස්වදේශීය හේවායින් දහස් ගණනක් ද, පිරිවරා මහනුවර බලා එන්නේ රජු ඌව පළාතේ හැසිරෙතැ යි අසා, ඌව බලායන පිණිස සීතාවකින් හැරී, සබරගමුව පසුකොට, ඌව පෙදෙසට ඇතුළු වී බුත්තල ජනපදයට පැමිණියේය. රජු සොයා ඌවට ආ නමුත් රජු එහි සිටින බවට කිසිම ආරංචියක් නැවත ඔහුට ලැබුණේ නැත.

සිංහලයන්ගෙන් කිසි ම අවහිරයක් නොවන බව දුටු ආණ්ඩුකාර තැන බුත්තල ජනපදයේ රන්දෙණිවෙලට පැමිණි පසු හේවායින්ගේ ගමන් විඩාව දුරු කරනු පිණිස එහි කඳවුරු බැඳීමට නියම කළේය. රජු එහි සිටින බවක් හෝ යුද්ධ හමුදාව සංවිධාන ව ඒ අසල ම සිටින බවක් හෝ පෘතුගීසීන්ට කිසිම විධියකින් දැනගන්ට ලැබුණේ නැත.

කඳවුරු බැඳගත් දිනට පසුදින තද අව්ව පායන්ට විය. ගමන් මාර්ගයේ දී ඇති වූ වැස්ස නිසා තෙත් වී තිබුණ වෙඩිබෙහෙත් වේලා ගැනීමට එදින ඉතා හොඳ බව ආණ්ඩුකාර තැනට පෙනී ගියේ ය. එම නිසා සියලු වෙඩි බෙහෙත් පැදුරුවල අතුරා අව්වේ තබන ලෙස ඔහු හේවායන්ට අණ කෙළේ ය. ඒ අනුව සියලු වෙඩි බෙහෙත් අව්වෙහි ලන ලද්දේය. ඒ විගස ම කිසිම බලාපොරොත්තුවක් නැති හදිසි වැස්සක් අහම්බෙන් ඇද හැලී සියලු වෙඩි බෙහෙත් තෙමී ගියේය. එම වෙඩි බෙහෙත් අකුලා ගැනීමටවත් ඉඩ නොදී වැස්ස ඇද හැලුණේ කරතගම දෙවියන්ගේ ආනුභාවයෙන් බව ඔව්හු නොදත්තෝ ය.

වැස්ස නැවතුණ විට ම සිංහල සේනාව හාත්පසින් ම තම කඳවුර වටලා සිටිනු දුටු කොන්ස්තන්තීනුද සාට තරු පෙනුණි. වෙඩි බෙහෙත් තෙමුණ නිසාත්, යුද්ධයට සූදානම් වීමට කලක් නැති නිසාත් ඒකාන්තයෙන් ම තමා පරාජයට පත්වන බව ඔහුට අවබෝධ විය. එදින රාත්‍රියේ ඔහු තම හේවායන් අමතා "නුඹලා මීට පෙර නම්බුව හා කීර්තිය සඳහා යුද්ධ කළාහු ය. නමුත් හෙට දින ජීවිත ආරක්ෂාව සඳහා යුද්ධ කිරීමට සූදානම් වියයුතු ය යි" අවවාද කළේය.

පසුදිනට පහන් වූ විට ම යුද්ධය ආරම්භ විය. සිංහලයන්ගේ ඊ පහරවලින් හා වෙඩි පහරවලින් පෘතුගීසි සේනාව සමූලඝාතනයෙන් පරාජය වූහ. පෘතුගීසීන් සමඟ සිටි සිංහලයෝ යුද්ධාරම්භයට පෙර ම රජුගේ සේනාවට බැඳුණෝය. එකල ලෝකයේ දක්ෂතම සෙන්පතියා යයි නම් දරා සිටි කොන්ස්තන්තීනු ද සා රන්දෙණි වෙලේදී අවසන් හුස්ම හෙළුවේය.

විජයග්‍රහණයෙන් උද්දාම වූ සෙනරත් රජතුමා නැවත ද කතරගම දෙවොල කරා ගොස් නානාප්‍රකාර පූජාභාණ්ඩයන්ගෙන් දෙවියන් පුදා දෙවියන් විසින් දෙන ලද දේවාභරණය වූ, සෝලු ලීය ද ගෞරව සහිත ව වැඩමවාගෙන මැදමහනුවරට පැමිණියේය. රජතුමා මැදමහනුවර නගරාසන්නයෙහි වූ ගල්මල්ඔය ඉවුරේ අලංකාර දේව මන්දිරයක් සාදා එම දේවාභරණය එහි තැන්පත් කළේය. එමෙන් ම දේව පූජාව සඳහා කපුවන් පත්කොට දේවාලයෙහි නඩත්තුව සඳහා ගම්බිම් රැසක් ද පුද කෙළේය.

ඉන්පසු ඉතිරි දේවාල තුන ද සාදා අවුරුදු පතා සිව් දේවාලයෙහි ම පෙරහර පැවැත්වීමට සැලැස්වීය. මැදමහනුවර විහාරස්ථානය ද ප්‍රතිසංස්කරණය කරවා එහි චිරජීවනය පිණිස ගම්බිම් පුද කෙළේය. සෙනරත් රජුගෙන් පසු මැදමහනුවර ශ්‍රී සෞභාග්‍යය ක්‍රමයෙන් අඩුවිය. ඉන්පසු රජ වූ ii රාජසිංහ රජු මැදමහනුවර ගැන වැඩි සැලකිල්ලක් නො දැක්වීය. පසු රජදරුවෝ ද එසේ ම වූහ. කීර්ති ශ්‍රී රාජසිංහ රජු විහාර දේවාලයන් හි සුළු ප්‍රතිසංස්කරණයක් කළ බව සඳහන් වෙතත් ඉන්පසු කිසි ම වැඩිදියුණුවක් එහි නොවීය.

අන්තිම රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමයේ දී නගරය සම්පූර්ණයෙන් ම විනාශ වූයේ යයි සිතිය හැකිය. කතරගම දේවාලය ඉදිරිපිටින් මළ මිනියක් ගෙනයාම නිසා උදහස් වූ දෙවියන් වසංගතයක් ඇතිකොට නගර වැසියන් මැසිමදුරුවන් මෙන් මරණයට පත්කරවූහ යි ජනප්‍රවාදයක් පවතී.

*(ඩී.පී. වික්‍රමසිංහ මහතාගේ "මග දිගට ජනකතා" කෘතියෙන් උපුටා ගැනිණි.)*

ඇමුණුම 9.3.2.2

පැවරුම

- විවිධ වීර ක්‍රියාවන් හේතුවෙන් වීරත්වයට පත් වූ ජාතික වීරවරයන්ගේ නම් ලැයිස්තුවක් පිළියෙල කරන්න.
- අතීත විරුවන් හා ඔවුන් විසින් කරන ලද වීර ක්‍රියා වගුගත කරන්න.
- ලිපියෙහි සඳහන් ජාතික වීරවරයා පිළිබඳ තොරතුරු රැස්කරන්න.
- අතීත දෑ විරුවන් පිළිබඳ අධ්‍යයනයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.
- අභිමානවත් පෞරුෂයක් ගොඩනගා ගැනීමට ජාතික වීරවරයන්ගේ චරිතවලින් ලබාගත හැකි ආදර්ශ ලියන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 10.0 : නව සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික වටිනාකමින් යුත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගනියි.

නිපුණතා මට්ටම 10.1 : කියවා රැස් කර ගත් විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු භාෂාත්මක නිර්මාණ කාර්යයන් සඳහා යොදා ගනියි..

ක්‍රියාකාරකම : විදු දැනුම දෙන පොතපත කියවමු.

කාලය : මිනිත්තු 120 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 10.1.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 10.1.1 : • විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳ ව ඇති රසවත් තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.
(තෝමස් අල්වා එඩිසන්, ඇල්බට් අයින්ස්ටයින්, ගැලීලියෝ ගැලලි වැනි විද්‍යාඥයින්ගේ සොයා ගැනීම් පිළිබඳ ව)
• ඒ ඇසුරෙන් පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින් සිසුන් සමඟ සාකච්ඡාවක නිරතවන්න.

| |
|---|
| • ලෝකයේ ඉදිරි ගමන් මග සැකසීමට විද්‍යාත්මක සොයා ගැනීම් ඉවහල් වී ඇති බව |
| • විද්‍යාත්මක සොයා ගැනීම් හා එම සොයා ගැනීම්වල පුරෝගාමීන් ගැන කියවීම මඟින් අපට ද යහපත් ආදර්ශ ලබා ගත හැකි බව |
| • විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳ ව ලියවුණු නිර්මාණ කියවීමෙන් විද්‍යාව පිළිබඳ දැනුම මෙන් ම භාෂා ප්‍රාගුණ්‍යය ද වැඩිදියුණු කර ගත හැකි වන බව |

(මිනිත්තු 15 යි.)

පියවර 10.1.2 : • සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
• ඇමුණුම 10.1.2.1 හි පැවරුම සිසුන් වෙත ලබා දෙන්න.
• පැවරුම සඳහා පෙළපොතේ අදාළ පාඩම තෝරාගන්න.
• සිසුන් පැවරුම් කාර්යයෙහි නිරත කරවන්න.

(මිනිත්තු 45 යි.)

පියවර 10.1.3 : • සිසුන්ගේ ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සලසන්න.

(මිනිත්තු 45යි.)

පියවර 10.1.4 : • සිසුන්ගේ ඉදිරිපත් කිරීම් පිළිබඳ ව අදහස් දැක්වීමට එම කණ්ඩායමේ සාමාජිකයන්ට ද අනෙක් කණ්ඩායම්වලට ද අවස්ථාව සලසන්න.
• පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින් සමාලෝචනයක නිරතවන්න.

| |
|---|
| • විද්‍යාත්මක සොයා ගැනීම් සම්බන්ධ සාහිත්‍යයක් ඇති බව |
| • ඒවා කියවීමෙන් විද්‍යාව සම්බන්ධ දැනුම මෙන් ම භාෂා දැනුම ද සංවර්ධනය කර ගත හැකි වන බව |
| • විද්‍යාව හා විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම සඳහා ඒ හා සම්බන්ධ පුවත් පත් සඟරා හා පොත් නිතර නිතර කියවිය යුතු බව |

(මිනිත්තු 15 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- විද්‍යාත්මක සොයාගැනීම් පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- විද්‍යාත්මක තොරතුරු ඇතුළත් නිර්මාණ කියවයි.
- විද්‍යාත්මක තොරතුරු ඇසුරෙන් විවිධ සාහිත්‍ය නිර්මාණ ඉදිරිපත් කරයි.
- විද්‍යා සාහිත්‍යය කෙරෙහි අන්‍යයන් තුළ ඇල්මක් ඇති කිරීමට කටයුතු කරයි.

ඇමුණුම 10.1.2.1

පැවරුම

- ඔබ කණ්ඩායමට ලැබෙන පෙළපොතේ පාඩම කියවන්න.
- විද්‍යාත්මක සොයා ගැනීම් පිළිබඳ තොරතුරු හැකිතාක් එකතු කරගන්න.
- එම තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 11.0 : රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

නිපුණතා මට්ටම 11.1 : ගද්‍ය පද්‍ය නිර්මාණ කියවා රස විඳියි.

ක්‍රියාකාරකම : ජනසාහිත්‍යය රස විඳිමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 11.1.1.1 හි ඇතුළත් කුරහන් කවි
- ඇමුණුම 11.1.2.1 හි ඇතුළත් පැවරුම I සහ II

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 11.1.1 :
- ඇමුණුම 11.1.1.1 හි සඳහන් ජනගීය සිසුන් ලවා ගායනා කරවන්න.
- ඒ ඇසුරින් පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක යෙදෙන්න.

| |
|---|
| • ජනකවිය සාමාන්‍ය ජනයාගේ එදිනෙදා කටයුතු ඇසුරින් බිහි වූ සාහිත්‍යාංගයක් බව<br>• අතීත ජනජීවිතය පිළිබඳ දැනුම ජනසාහිත්‍යය රස විඳීමට උපකාරී වන බව<br>• ජනකවිය යනු ගැමියාගේ අව්‍යාජ සාහිත්‍යය නිර්මාණයක් බව<br>• ජනසාහිත්‍යයෙන් එදා ජනජීවිතයේ යථා ස්වරූපය නිරූපණය වන බව<br>• ගැමියාගේ සිතුම් පැතුම් ඇදහිලි ජීවන මාර්ග ආදි සංස්කෘතිකාංග ජනකවිවලින් නිරූපණය වන බව |

(මිනිත්තු 10 යි.)

පියවර 11.1.2 :
- පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- ඇමුණුම 11.1.2.1 හි පැවරුම කණ්ඩායම්වලට බෙදා දෙන්න. (පෙළපොතේ සඳහන් ජනකවි යොදාගන්න.)
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී සිසුන් පැවරුමෙහි නිරත කරවන්න.

(මිනිත්තු 30 යි.)

පියවර 11.1.3 :
- එක් එක් කණ්ඩායම්වලට ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පිළිබඳ අදහස් දැක්වීමට සිසුන්ට ඉඩ ලබාදෙන්න.

(මිනිත්තු 20 යි.)

පියවර 11.1.4 : ● පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

| |
|---|
| ● ජනසාහිත්‍යය හඳුනා ගැනීම සඳහා නිරන්තරයෙන් ඒවා ඇසුරු කළ යුතු බව<br>● ජනසාහිත්‍යය අධ්‍යයනයෙන් ජනජීවිතය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගත හැකි වන බව<br>● ජනසාහිත්‍ය නිර්මාණකරුවන් ජනවහර මැනවින් හසුරුවා ඇති බව<br>● විවිධ වෘත්තීන් අනුව ජනකවි බිහි වී ඇති බව<br>● ජනකවි ඊට අදාළ තාලය අනුව ගායනා කිරීමෙන් රස වින්දනය තීව්‍ර වන බව |

(මිනිත්තු 20 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- ජනසාහිත්‍යය පරිශීලනයෙන් රසඥතාව දියුණු කර ගත හැකි බව ප්‍රකාශ කරයි.
- ජනසාහිත්‍යය ඇසුරු කිරීමට පෙළඹෙයි.
- ජනසාහිත්‍යය අගය කරයි.
- ජනසාහිත්‍යයේ ඇති වටිනාකම පිළිබඳ අන් අය සමඟ සාකච්ඡා කරයි.

ඇමුණුම 11.1.1.1

කුරහන් කවි

හබ්බන් කප්පර නැව් එන්නා සේ
කුරහන් පැළපත පෙනෙන රඟේ
නිල්වන් චාමර ලෙළදෙන්නා සේ
කොළ දුනි සුළඟට වැනෙන රඟේ
රත්රන් මිණිමුතු අමුණන්නාසේ
කුරහන් කිරිවැද පැසෙන රඟේ
පන්දම් ගිනිවැට සේම පෙනෙන්නා
මොරටුවෙ කුරහන් පැසෙන රඟේ

ඇමුණුම 11.1.2.1

පැවරුම

පොදු උපදෙස්

- ඔබ කණ්ඩායමට ලැබෙන ජනකවි ගායනා කිරීමට පුහුණුවන්න.
- එම ජනකවිවලින් හෙළිවන වෘත්තිය පිළිබඳ තොරතුරු හා සමාජ තොරතුරු සටහන් කරන්න.
- එම ජනකවි සාමූහිකව පන්තියේ ගායනා කරන්න.
- විවිධ වෘත්තීන් හා බැඳුණු ජනකවි එකතු කර පොත් පිංචක් සකස් කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 12.0 : අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම 12.1 : කවි නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම : කවි හදමු; රස විඳිමු.

කාලය : මිනිත්තු 120 යි.

ගුණාත්මක යෙදවුම් :
- ඇමුණුම 12.1.1.1 හි ඇතුළත් කවි
- ඇමුණුම 12.1.2.1 හි ඇතුළත් පැවරුම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 12.1.1 :
- 12.1.1.1 ඇමුණුම සිසුන්ට ලබා දෙන්න.
- එම කවිවල අවසන් පදය මුල් පදවලට ගැළපෙන පරිදි සම්පූර්ණ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කවි නිර්මාණයේ දී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව සාකච්ඡාවක යෙදෙන්න.

> - 12.1.1.1 ඇමුණුමෙහි ඇතුළත් කවි සියල්ල ම පරිසරය තේමා කරගෙන නිර්මාණය වී ඇති බව
> - පරිසරයෙන් ලද රසවත් අත්දැකීමක් කවි නිර්මාණයට ඉවහල් කරගත හැකි බව
> - කවි නිර්මාණයේ දී එළිසමය යොදා ගැනීම කවියට අලංකාරයක් ගෙන දෙන බව
> - එක ම පදය නැවත නැවත යෙදීම නිසා ද කවිය අලංකාර වී ඇති බව
> - රසවත් යෙදුම් නිර්මාණයක සාර්ථකත්වයට හේතුවන බව

(මිනිත්තු 20 යි.)

පියවර 12.1.2 :
- පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න.
- ඒ ඒ කණ්ඩායම්වලට අදාළ මාතෘකා ලබා දෙන්න.
- සිසුන් නිර්මාණ කාර්යයේ නිරතවන අතරතුරේ දී අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

(මිනිත්තු 40 යි.)

පියවර 12.1.3 :
- එක් එක් කණ්ඩායම්වලින් සැකසූ නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

(මිනිත්තු 40 යි.)

පියවර 12.1.4
- ඒ ඒ කණ්ඩායම් ඉදිරිපත් කළ නිර්මාණ පිළිබඳ අනෙක් කණ්ඩායම්වල සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- සිසුන්ගේ නිර්මාණාත්මක හැකියා වැඩිදියුණු වන ආකාරයට පහත සඳහන් කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක නිරතවන්න.

> - කවි නිර්මාණයේ දී උචිත ලෙස බස හැසිරවිය යුතු බව
> - උපමා රූපක වැනි අලංකාර නිර්මාණයේ රසවත් බව වර්ධනය කරන බව
> - නිරන්තරයෙන් නිර්මාණකරණයේ යෙදිය යුතු බව
> - සිසුන්ගේ නිර්මාණ පුවත්පත්, සඟරා, විද්‍යුත් මාධ්‍ය ආදියෙහි පළ කළ හැකි බව

(මිනිත්තු 20 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- කාව්‍ය නිර්මාණයක තිබිය යුතු ලක්ෂණ නම් කරයි.
- කවි නිර්මාණය කරයි.
- විවිධ මාධ්‍යවල පළ කිරීම සඳහා තම නිර්මාණ යොමු කරයි.
- විවිධ සාහිත්‍ය නිර්මාණ අන් අය සමග රස විඳියි.

ඇමුණුම 12.1.1.1

උදය

උදා ගිරෙන් හිරු දෙවියන් ලොවට වඩිනවා
හිඹුටු කැලේ රැහැයි නලා හඬ පැතිරෙනවා
කුරුලු රෑන් මන පිනවන ගීත ගයනවා
.................................................................... ...........................

සඳඑළිය

කිරි බැබලෙන හඳ පාන යි
අහස දිළෙන නිල් වියන යි
සුවඳ හමන සොමි පවන යි
....................................................... ................

නිල් ගොයම

කෙතේ පඳුරු ලා ගොයම සැදෙන්නේ
කිරට නැමුණු කරලින් බර වන්නේ
මද සුළඟේ හෙමිහිට නැළ වෙන්නේ
...................................................... ..........................

දේදුන්න

ඈත ඈත ආකාසේ දේදුන්නක් පායලා
නේක නේක පාට පාට අහස් ගැබට එක්වෙලා
හිරු මඬලට සඳ මඬලට කිරි මුහුදට යාවෙලා
.................................................................... .....................

ඇමුණුම 12.1.2.1

පැවරුම

- පහත සඳහන් මාතෘකාවලින් ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාව ඔස්සේ සිතට නැගෙන හැඟීම් හා අදහස් ගොනු කරන්න.
- එම හැඟීම් හා අදහස් ඇසුරු කර ගනිමින් සරල කවි කීපයක් නිර්මාණය කරන්න.
  - මුහුදු වෙරළ
  - වැස්ස
  - සමනලයා
  - අලුත් අවුරුද්ද

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිපුණතාව 12.0 : අත්දැකීම් පාදක කරගනිමින් නිර්මාණ කාර්යයයේ යෙදෙයි.

නිපුණතා මට්ටම 12.2 : නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

ක්‍රියාකාරකම : ප්‍රබන්ධකරණයේ යෙදෙමු.

කාලය : මිනිත්තු 80 යි.

ගුණාත්මක යෙදවුම් : • ඇමුණුම 12.2.1.1 හි ඇතුළත් ඡේදය

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

පියවර 12.2.1 :
- 12.2.1.1 ඇමුණුම සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම නිර්මාණය කියවීමට අවස්ථාව ලබාදෙන්න.
- සිරිමල්ගේ ජීවිතය හා බැඳුණු සිද්ධි පදනම් කරගෙන කතාවක් ගොඩ නැගිය හැකි ආකාරය සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් ඉදිරිපත් කළ අදහස් සහ පහත සඳහන් අදහස් පදනම් කර ගනිමින් නිර්මාණාත්මක ප්‍රබන්ධයක මූලික ලක්ෂණ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

> - නිර්මාණාත්මක ප්‍රබන්ධයට කිසියම් සිද්ධියක්, චරිතයක්, අවස්ථාවක් පදනම් කර ගත හැකි බව
> - එවැනි සරල සිදුවීම් ඇසුරින් කළ සාර්ථක නිර්මාණ දැකිය හැකි බව
>   උදා ඃ මඟුල් කෑම, හත් පණ
> - ප්‍රබන්ධ රචනයේ දී එය නවතාවකින් ඉදිරිපත් කළ යුතු බව
> - ප්‍රබන්ධයක සිදුවීම් අතර මනා අන්තර් සම්බන්ධතාවක් තිබිය යුතු බව

(මිනිත්තු 10 යි.)

පියවර 12.2.2 :
- ඔබ දන්නා චරිතයක් හෝ අවස්ථාවක් හෝ සිද්ධියක් හෝ පදනම් කර ගනිමින් කතාවක් ගොඩනගන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න. (කේවල පැවරුමකි.)

(මිනිත්තු 30 යි.)

පියවර 12.2.3 :
- ගොඩනගන ලද නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- නිර්මාණ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට ඉඩකඩ ලබාදෙන්න.

(මිනිත්තු 20 යි.)

පියවර 12.2.4 :
- නිර්මාණ හැකියා ඔප්නැංවීම සඳහා පහත සඳහන් කරුණු ද මතු වන සේ සමාලෝචනයක යෙදෙන්න.

> - තමන් ලැබූ අත්දැකීම් පාදක කරගැනීමෙන් නිර්මාණය සාර්ථක කර ගත හැකි බව
> - නිරන්තර අභ්‍යාසයේ (නිර්මාණකරණයේ) යෙදීමෙන් නිර්මාණාත්මක කුසලතා වර්ධනය වන බව
> - විවිධ මාධ්‍යවල පළ කිරීම සඳහා සිසුන්ගේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි බව
> - උපමා මෙන් ම රසවත් යෙදුම් ද නිර්මාණයේ ගුණාත්මක බව වර්ධනය කිරීමට උපකාර වන බව

(මිනිත්තු 20 යි.)

තක්සේරු හා ඇගයීම් නිර්ණායක.

- ප්‍රබන්ධයක් යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- ප්‍රබන්ධ කථා නිර්මාණය කරයි.
- ප්‍රබන්ධ එකතුවක් සකස් කරයි.
- ප්‍රබන්ධ රචනය පිළිබඳ කරුණු අන් අය සමග හුවමාරු කර ගනියි.

ඇමුණුම 12.2.1.1

සිරිමල් දක්ෂ ළමයෙක්. තාත්තා පුංචි කාලෙ ම මිය ගියා. සිරිමල්ගෙ අම්මා කරුණාවතී, ගල් වැඩපලක කළුගල් තළනව. සිරිමල්ගෙ නංගි නිමාලි බලා ගන්නෙත් සිරිමල්. පාසලේ දී ගුරුවරු හැමෝ ම සිරිමල්ට ආදරෙයි. ශිෂ්‍යත්ව විභාගයෙන් සිරිමල් ඉහළින් ම සමත් වුණා.

ඇමුණුම 12.2.2.1

පොදු උපදෙස්

- ඔබ අත්විඳි සිද්ධියක්, අවස්ථාවක් හෝ චරිතයක් ඇසුරු කරගනිමින් කතන්දරයක් ගොඩනගන්න.
- නිර්මාණය වචන 150 කට පමණ සීමා කරන්න.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

# තක්සේරුව හා ඇගයීම

## හැඳින්වීම

පන්ති කාමරය තුළ ඵලදායී ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස ගුරු මහත්ම මහත්මීන් සිසුන් ලබා සිටින ප්‍රාප්ති මට්ටම් සහ ඔවුන් මුහුණ පා සිටින ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ සුවිශේෂී ලෙස අවබෝධ කරගෙන සිටීම අත්‍යවශ්‍ය ය. එය එක් එක් ශිෂ්‍යයා හට ගැළපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම පුළුල් අරමුණෙන් යුතු ව පන්ති කාමරය තුළ සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ නිරන්තරයෙන් තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම යනුවෙන් සරල ව හඳුන්වා දිය හැකි ය.

තක්සේරු කිරීමේ විවිධ භාවිතයන් ඇත. තේරීම් කාර්යය, ස්ථාපන කාර්යය, පර්යේෂණ කාර්යය ඒ අතරින් ප්‍රධාන ය. එහෙත් පන්ති කාමරය තුළ ගුරුවරයෙකුට සිසුන්ගේ ඉගෙනීමේ ගැටලු අනාවරණය කරගෙන අපේක්ෂිත ඉගෙනුම් මට්ටම් කරා සිසුන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම පිණිස එය ප්‍රයෝජනවත් වේ. තක්සේරු කිරීම පන්ති කාමරය තුළ ක්‍රියාත්මක විය යුත්තේ එම පුළුල් අරමුණෙන් යුතු ව ය.

පන්ති කාමරය තුළ කරනු ලබන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය දෙයාකාරයකට ක්‍රියාත්මක කළ හැකිය. එනම් සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනුම අඛණ්ඩ ලෙස සම්භවන ආකාරයට තක්සේරු කිරීම සහ වසරක්, වාරයක්, පාඩම් ඒකකයක්, තේමාවක් සම්පිණ්ඩිත ආකාරයට තක්සේරු කිරීමත් ය. මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සෑම ඉගෙනුම් නිපුණතා මට්ටමක් අවසානයේ ම එම පාඩමින් සිසුන් විසින් සංවර්ධනය කර ගත යුතු කුසලතා සැලකිල්ලට ගෙන තක්සේරු කිරීමේ නිර්ණායක ඉදිරිපත් කර ඇත. පහත දැක්වෙන්නේ ඒ සඳහා උදාහරණයකි.

1. නිපුණතා මට්ටම - අදහස් නිරවුල් ව හා පැහැදිලි ව දක්වමින් ලිපි ලියයි.
2. තක්සේරු කිරීමේ නිර්ණායක -
    - රාජකාරි ලිපියක ආකෘතිය නිවැරදි ව ප්‍රකාශ කරයි.
    - නිවැරදි ව රාජකාරී ලිපියක් ලියයි.
    - විවිධ රාජකාරී අවශ්‍යතා සඳහා ලිපි ලේඛන සකස් කරයි.
    - රාජකාරි ලිපි ලිවීම සඳහා අන් අයට උදව් කරයි.

පන්ති කාමරය තුළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන අතර තුර මෙම ඉගෙනුම් මට්ටම් කරා සිසුන් පැමිණ තිබේ ද? නැතහොත් ඔවුන් දුෂ්කරතාවන් පෙන්නුම් කරන්නෝ ද? යන්න හඳුනාගනිමින් කටයුතු කිරීමට ගුරුවරයෙකුට පුළුවන. මෙවැනි සම්භවන තක්සේරු කිරීමේ ක්‍රියාවලියක දී ගුරුවරයෙකුට සිසුන් හඳුනා ගැනීම පිණිස ප්‍රශ්න කිරීම, සිසුන්ගේ වැඩ නිරීක්ෂණය කිරීම හා සිසුන් සමඟ සාකච්ඡා කිරීම වැනි අවිධිමත් තක්සේරු කිරීමේ ක්‍රම භාවිතයට ගත හැකි ය. එයට අමතර ව රචනා ලියවීම පෙළ පොතේ අභ්‍යාසවලට දෙන පිළිතුරු ඇගයීමට ලක් කිරීම වැනි ක්‍රමවේදයන් ද භාවිතයට ගත හැකි ය. එසේ ම දෙවනුවට සඳහන් කළ සම්පිණ්ඩිත තක්සේරු කිරීම සඳහා මාසයක්, වාරයක්, අවුරුද්දක් අවසානයේ පවත්වන පරීක්ෂණ හෝ මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඉදිරිපත් කොට ඇති ඉගෙනුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක ද යොදා ගත හැකි ය.

සිසුන් තක්සේරු කිරීම සඳහා පරීක්ෂණ යොදා ගන්නා විට තමා විසින් ම සකස් කර ගනු ලබන පරීක්ෂණ උපයෝගී කර ගන්නේ නම් වඩාත් ඵලදායී වනු ඇත. පන්ති කාමරය තුළ කරන සිසු ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස වඩාත් වලංගුතාවකින් යුක්ත වන්නේ අදාළ ගුරුවරුන් විසින් සකස් කරනු ලබන පරීක්ෂණ ය. ගුරු මහත්ම මහත්මීන් ඒ සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර ගත යුතු ය.

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

මෙම පසුබිම යටතේ පන්ති කාමරය තුළ කෙරෙන සිසු ප්‍රගතිය තක්සේරු කිරීම සිසුන් හොඳින් හඳුනාගෙන එක් එක් සිසුවාට ගැළපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් ලබා දී අපේක්ෂිත ඉගෙනුම් පළ කරා ඔවුන් නියාමනය කිරීමේ මූලික පරමාර්ථය පෙර දැරි කරගෙන ක්‍රියාත්මක විය යුතු ය.

එක් එක් නිපුණතා මට්ටම්වලට අදාළ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු අනුපිළිවෙළ සහ එක් වාරයක් සඳහා යෝජනා කරනු ලබන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක තුනක් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රයෙන් ඉදිරිපත් කර ඇත. ඒ ආශ්‍රයෙන් ඉතිරි වාර දෙක සඳහා ද ආධාරක ගුරු මහත්ම මහත්මීන් විසින් සකස් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 7 වන ශ්‍රේණිය
## ඒ ඒ වාර සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු අනුපිළිවෙළ (නිපුණතා මට්ටම් අනුව)

| වාරය | ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු නිපුණතා මට්ටම්වල අනුපිළිවෙළ | ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක | | |
|---|---|---|---|---|
| | | 1 වන ඇගයීම් අවස්ථාව | 2 වන ඇගයීම් අවස්ථාව | 3 වන ඇගයීම් අවස්ථාව |
| 1 වාරය | 1.1<br>1.3<br>2.1<br>2.2<br>3.1<br>3.2<br>3.3<br>7.1<br>7.2<br>7.3 | 1.1<br>1.3<br>2.1<br>2.2 | 3.1<br>3.2<br>3.3 | 7.1<br>7.2<br>7.3 |
| 2 වාරය | 1.4<br>1.5<br>3.4<br>4.1<br>4.2<br>6.1<br>8.1<br>8.2<br>8.3<br>9.3 | 1.4<br>3.4<br>9.3<br>6.1 | 1.5<br>4.1<br>4.2 | 8.1<br>8.2<br>8.3 |
| 3 වාරය | 1.2<br>5.1<br>5.2<br>9.1<br>9.2<br>10.1<br>11.1<br>12.1<br>12.2 | 5.1<br>5.2 | 1.2<br>9.1<br>9.2 | 10.1<br>11.1<br>12.1<br>12.2 |

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක

1. පාසල් වාරය : පළමුවන වාරය
   ආධාරක අංකය : 01

2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම් : 1.1, 1.3, 2.1, 2.2
3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
   - සංවාදයකට සවන්දී අදහස් ප්‍රකාශ කිරීම.
   - ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව සවන් දී ප්‍රතිචාර දැක්වීම.
   - සබකෝලයෙන් තොර ව අදහස් ප්‍රකාශ කිරීම.
   - අවස්ථාවට උචිත ලෙස සවන් දෙන්නා පිළිබඳ සැලකිලිමත් ව කතා කිරීම.

4. උපකරණයේ ස්වභාවයඃ
   - සංවාදයක්.
5. උපකරණයේ අරමුණු
   - සංයමයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන්දීම හා අදහස් ප්‍රකාශ කිරීම.
   - අදහස් ප්‍රකාශනයේ දී සබකෝලයෙන් තොරවීම.
   - සවන්දෙන්නා පිළිබඳ අවධානයෙන් යුතු ව කතා කිරීම.
6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ඃ

   ගුරු උපදෙස්
   - සිසුන් කණ්ඩායම් කීපයකට බෙදන්න.
   - කණ්ඩායම්වලට වෙන වෙනම සංවාද ගොඩනගා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
   - එක් එක් කණ්ඩායමට සුදුසු මාතෘකා ද ලබා දෙන්න.
   - දෙවන කණ්ඩායමට ද තම සංවාදය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
   - ලකුණු දීමේ නිර්ණායක පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

   සිසුන්ට උපදෙස්
   - ගුරු උපදෙස්වලට අනුව කණ්ඩායම්වලට බෙදන්න.
   - එක් එක් කණ්ඩායම තම සංවාදය ඉදිරිපත් කරන්න.
   - අනෙක් කණ්ඩායම එයට ආචාරශීලී ව සවන් දී ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගන්න.

7. ඇගයීම් ක්‍රමය

| නිර්ණායක / කණ්ඩායම් අංක | උචිත පරිදි හඬ පාලනය කරයි | ආචාරශීලී ව සවන්දෙයි | සබකෝලයෙන් තොර ව අදහස් ඉදිරිපත් කරයි | කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි | නිවැරදි ව පිළිතුරු සපයයි. |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |

ලකුණු පරාසය
- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි 01

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක

1. පාසල් වාරය : පළමුවන වාරය
   උපකරණ අංකය : 02

2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම් : 3.1, 3.2, 3.3
3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
   - නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවීම.
   - අර්ථාවබෝධය සඳහා නිහඬ ව කියවීම.
   - විවිධ ශෛලීන්ට අනුව කියවීම.
4. උපකරණයේ ස්වභාවය ‍ඃ
   - පැරණි ගද්‍ය කෘතියක කොටසක් කියවීම.
5. උපකරණයයේ අරමුණු
   - නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගැනීම.
   - විවිධ ශෛලීන්ට අනුව කියවීමට හුරු කිරීම.
   - නිවැරදි උච්චාරණය හා විරාම ලක්ෂණවලට අනුගත ව කියවීම.
6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ඃ

ගුරු උපදෙස්
- පන්තිය කණ්ඩායම් තුනකට බෙදන්න.
- පැවරුම් පත පහත සඳහන් කොටස් ඇතුළත් වන ලෙස සකස් කර ගන්න.
  1. ජාතක කථාවකින් උපුටාගත් ඡේදයක් (විවිධ ශෛලීන් අනුව කියවීම සඳහා)
  2. අර්ථාවබෝධය සඳහා නිශ්ශබ්ද ව කියවීමට සුදුසු ඡේදයක්.
  3. ශබ්දනගා කියවීමට සුදුසු ඡේදයක් (විරාම ලක්ෂණ, පද බෙදීම හා මහාප්‍රාණ අක්ෂර සහිත ඡේදයක්)
- උක්ත පැවරුම්පත කණ්ඩායම් තුනට ලබා දෙන්න.
- පැවරුම්පතේ I හා III කොටස් කියවීම හුරුවීම සඳහා හුරු වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පැවරුම් පතේ II ඡේදයට අදාළ නිශ්ශබ්ද ව කියවීම මැන බැලීම සඳහා සුදුසු ප්‍රශ්න සකස් කර දෙන්න.
- ඒවාට පිළිතුරු සැපයීමට කාලය ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමේ සියලු දෙනාට I හා III කොටස් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- ලකුණුදීමේ පටිපාටිය පැහැදිලි කරන්න.

සිසුන්ට උපදෙස්
- දෙන ලද පැවරුම්පත් හොඳින් අධ්‍යයනය කරන්න.
- අංක I හා III ඡේද කියවීමට හුරුව ලබන්න.
- පැවරුමේ දෙවන කොටසේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (තනි තනිව පිළිතුරු සැපයිය යුතුයි.)

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.

7. ඇගයීම් ක්‍රමය ඃ

| නිර්ණායක / කණ්ඩායම් අංක | නිවැරදි ශෛලියට අනුව කියවයි. | විරාම ලක්ෂණවලට අනුගත ව කියවයි. | නිවැරදි ව පිළිතුරු දෙයි. | නිවැරදි හඬ පාලනයෙන් යුතු ව කියවයි. | කණ්ඩායම තුළ සහයෝගයෙන් වැඩ කරයි. |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |

ලකුණු පරාසය

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි 01

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක

1. පාසල් වාරය : පළමුවන වාරය
   උපකරණ අංකය : 03

2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම් : 7.1, 7.2, 7.3
3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
   - නිවැරදි අක්ෂර වින්‍යාසය අනුව ලිවීම
   - මහප්‍රාණ අක්ෂර නිවැරදි ව වචනවල යෙදීම
   - සඤ්ඤක අකුරු නිවැරදි ව වචනවල යොදා වාක්‍ය තැනීම
4. උපකරණයේ ස්වභාවය :
   - නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ගොනුවක් සැකසීම
5. උපකරණයේ අරමුණු
   - භාෂා කාර්යය සඳහා නිවැරදි ව අකුරු භාවිත කිරීමට හුරු කිරීම
   - සඤ්ඤක අකුරු නිවැරදි ව භාවිත කරමින් වචන ලිවීම
   - මහාප්‍රාණ අකුරු සහිත වචන නිවැරදි ව ලිවීම
6. උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් :

   ගුරු උපදෙස්
   - සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට වෙන් කරන්න.
   - ණ,න,ල,ළ,ශ,ෂ,ස මහාප්‍රාණ, හා සඤ්ඤක අක්ෂර ඇතුළත් වචන හැකිතාක් එකතු කිරීමට උපදෙස් දෙන්න.
   - අක්ෂර වින්‍යාස රීති අනුව එම වචන පෙළ ගස්වා පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
   - නිර්ණායක පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.

   සිසුන්ට උපදෙස්
   - ඔබට ලැබී ඇති උපදෙස් පරිදි වචන හැකිතාක් එකතු කරන්න.
   - එම වචන එකතු කර පොත් පිංචක් සකස් කරන්න.

7. ඇගයීම් ක්‍රමය :

| නිර්ණායක / කණ්ඩායම් අංක | සඤ්ඤක අක්ෂර නිවැරදි ව භාවිත කරයි | මහප්‍රාණ අක්ෂර නිවැරදි ව යොදා ලියයි | වචනවල උචිත ස්ථානයට ණ, න ල, ළ නිවැරදි ව යොදයි | කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරයි. | මනා නිමාවකින් ඉදිරිපත් කරයි. |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |

ලකුණු පරාසය
- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි 01

Copyright © 2008 National Institute of Education - Sri Lanka. All rights reserved.